# ...අහිංසකාවි...

## THE INNOCENT BELOVED LOVER

බී.ඒ.සෙව්වන්දි නිමන්තිකා ජයවර්ධන
*B.A.Sewwandi Nimanthika Jayawardhana*

© සෙව්වන්දි නිමන්තිකා ජයවර්ධන 2023

ISBN 978-624-94784-0-4

**පළමු මුද්‍රණය**

**ප්‍රකාශක** : කර්තෘ ප්‍රකාශනයකි

**අකුරු සංයෝජනය** : විශ්ව සංජන රවීදු

කාවින්ද පුතුන්ට විශේෂ ස්තුතිය

## ...පිදුම...

හසරැල් ම සුපිපුණු උයනක් නොවුව ද

කඳුළැල් ඉතිරුණු කතරක් ම නොවන බව ජීවිතය

විදවමින් නොඉද විදින ලෙස ජීවිතය..

මා හැඬුවොත් නලවනවා නොව..

මා සමග අඬන්නෙමියි කියා

මා දිරිමත් කළ..මා සවිමත් කළ..

සැමවිටම ඉදිරියට යන්නට..

වැටුණු විට මා නැගී සිටුවන්නට.

ඇල්මෙන්..බැල්මෙන්..වදනින්...

මා දිරි නංවා ශක්තිමත් කළ

ඔබ සියලු දෙනාට ම

**උපහාරයක් වේවා මගේ කුළුදුල් ම පොත....**

*සෙව්වන්දී*

# පෙරවදන

මේ ලෝකයේ ම ඉන්න..හිතින් ගතින් සවිමත්..තමන් ගැන නොහිතා අනුන් ගැන විතරක්ම හිතන පරාර්ථකාමී බව මට කියාදීපු මං දකින දෙවියන්…මගේ ආදරණීය තාත්තා..බී.ඒ.වික්‍රමජෝති ජයවර්ධන…

දුක සැප දෙකම සමසේ විදගෙන මහාමේරු පර්වතය හිස දරා වුවද සිනාසිය හැකි ..සිතින් කයින් මා සවිමත් කළ..දේවතාවිය..මගේ අම්මා..ලතා

ඇගෙන් ඇටයක් ඉල්ලුවත් "ආ..ගනිං" කියලා දෙන තරම් ඇග පුරාම මනුස්සකම පිරිච්ච මගේ අක්කා..ලසන්ති.

වැටෙන හැමතැනම නැගිටින්න දිරි දීපු " ඕනි දේකට මං ඉන්නවා" කියලා පිටිපස්සෙ ඉදං මට හයිය දෙන මගේ නංගී..නිවර්තනා.

..අසීමාන්තික නිදහසක් දීලා..මට මම ම වෙලා ජීවත් වෙන්න ඉඩ දීපු..මටත් වඩා මං ගැන හිතන..මගෙ නපුරුකම් බල බල හිනාවෙන ..මදි නොකියන්න ආදරේ දෙන මගේ පළමු පෙම්වතා..මගේ ආදරණීය සැමියා..අසේල සඳරුවන්...

අපේ ලෝකෙම සුන්දර කරන..දෙවියො දීපු අපේ චූටි සුරංගනාවි..මගේ දගමල්ල.යශ්මි යෙහන්සා

අපේ ජීවිතේ ස්ථාවර කර ගන්න අනාගතේ ගැන තිබුණු බය නැති කරගන්න හයියක් වුණ ලොකු තාත්තා..බී.ඒ.වික්‍රමරත්න…

රැයක් දවාලක් නැතුව ඕනි දේකට බෑ නොකියා කකා ඉන්න බත් පත වුනත් දාලා දුවන පාලිත අයියා….

යාළුකමට එහා ගිය සහෝදරත්වයක් මට දීපු මගෙ O/L සෙට් එක .

අත ගහන ඕනි වැඩකට කට්ටක් කාගෙන උනත් නහින මගේ මස්සිනාල ටික.... .

ගෙදරට ආ දා පටන් දරුවෙකු සේ මා බලාගත් ආදරණීය නැන්දනිය සහ මාමණ්ඩිය..
තනිය මකන්නට කයියට සෙට්වෙන අපේ උඩහ සෙට් එක…

අපේ සංගීත මිස් (චන්ද්‍රා පියසීලි ) ඇතුලු මට අකුරු කියාදීපු සියලුම ගුරුමව්පියවරුන්….

මගේ දක්ෂතා අදුරගෙන මට ඉදිරියට යන්නට අත්වැලක් වූ නවාස් සර් නිශා මැඩම්..

අම්මා තාත්තා හා සමානව මගෙ ජීවිතේ..අනාගතේ ගැන හීන දැකපු.. දෙමාපියන් හා සමානව අදටත්

මගේ හිතේ ආදරය ගෞරවය පිරිලා තියෙන..අදටත් මාව ළමයක් විදියට දකින…තැන කොතන වුනත් වැරැද්ද ක් නම් මට බනින්න ගහන්න තරමට වුණත් මට කිට්ටුම..තවමත් ඉස්කෝලෙ.. දහම් පාසලේ විදපු ආදරේ සුවඳ මට දෙන.. සදාදරණීය ගුරුමව්පිය යුවල..

….කන්නත් දීලා ..උගන්වලත්..අපි වෙනුවෙන් රැයක් දවාලක් නැතුව අතින් පාඩු කරං ප්‍රශ්න පත්තර හදලා දීපු...අදටත් මගෙ වටිනාකම මට පෙන්නලා දෙන.........අපේ හාමුදුරුවෝ බුද්ධං කෝට්ටේ සුමනචන්ද්‍ර හිමි.

…..කවි කතා වාගෙම ජීවිතේ රසවිදින්න කියා දීපු…ජීවිතේ එක මුල්ලකට වෙලා ඉද්දී..මට මං ගැන අභිමානයක් දීපු..මං කවුද කියලා මට මතක් කරපු.. ඉස්කෝලෙ සුවඳ අදටත් මට දෙන මගේ ආදරණීය පවිත්‍රා මිස්..(පවිත්‍රා ප්‍රියංගනී ද සිල්වා)

**ඔබ දෙපළ නොහිටින්නට…ඔබේ බැනුම් නොඅසන්නට මම අද මෙතන නොඉදනු ඇත.ඔබ නොදන්නවා ඇති..**

මගේ උසස් අධ්‍යාපන  කටයුතුවලට හේතුව අපේ හාමුදුරුවෝ දකින දකින තැන මට බනින එක.මං ආසයි ඒකට..මට දැනුණා මට කොයිතරම් ආදරේද කියලා ගුරුවරයෙක් විදියට.

නිර්මාණවලට එකම හේතුව පවිත්‍රා මිස්..හැමදාම දැක්කම මං කරපු දේවල්..මං දිනපු දේවල් මට මතක් කරල බැන බැන ඒ දුන්නෙ මට motivation එකක්.පාර ද ඉස්කෝලෙ ද බස් එකද කියලා නැතුව පොඩි ළමයෙක් වගේ මාව හසුරවපු ඒ ආදරේට හරි ලෝබයි මං…

**ඔබ සියලු දෙනාටම උපහාරයක් වේවා මගේ කුළුදුල් ම පොත..**

........................................................

## හැඳින්වීම

ර/අමුහේන්කන්ද ශ්‍රී විමලසාර මහා විදුහලෙන් 1 වසර සිට 11 වසර දක්වා අධ්‍යාපනය ලැබූ ..පාසලේ කීර්තිමත් ශිෂ්‍යාවක වන මා, බී.ඒ.සෙව්වන්දි නිමන්තිකා ජයවර්ධන.මා පාසලේ නැණගුණ දෙකෙන්ම අගතැන්පත් සිසුවියක් වූ අතර මට ඒ සදහා ඇවැසි පෞරුෂය..පන්නරය ලැබුණේ.පෙරපාසලටත් යාමට පෙර මා ඇතුළත් වූ කේතුමතී සදහම් විද්‍යාලයෙනි.

උසස්පෙළ සදහා ෆර්ගසන් උසස් විද්‍යාලයට ඇතුලත් වූ අතර දෛවෝප ගත ලෙස විවිධාකාර හැල් හැප්පීම් මැද උසස්පෙළ සමත් වීමි.

උසස්පෙළ සමත් වනවාත් සමග මා වික්ටරි ජාත්‍යන්තර පාසලේ ප්‍රාථමික අංශය ගුරුවරියක් ලෙස පුහුණුවට සහභාගි වූයෙමි.වසර ගණනාවක් ජාත්‍යන්තර පාසල්වල සේවය කළෙමි.රූපවාහිනි සේවය,නෙත් FM,මහරගම තරුණ සේවා සභාව,රංවල බලකාය ආදරෙන් සිහිපත් කරමි.


විශ්ව විද්‍යාල,උසස් තාක්ෂණ ආයතන රැසකම උසස් අධ්‍යාපනය සාර්ථකව හැදෑරූ වෙමි.මේ සෑම තැනකදීම කැපී පෙනෙන සිසුවියක් වීමට මට හැකි වූයේ…කේතුමතී සදහම් විද්‍යාලයෙන් මතු

කරගත්..විමලසාර විදුහලෙන් ඔප් නංවා ගත් පෞරුෂය හා පන්නරය නිසාවෙනි .
තවදුරටත් උසස් අධ්‍යාපන කටයුතුවල මා නියැලෙමින් සිටිමි.

මගේ ජීවිතේ මට ශක්තියක් වූ අයගේ වර්ණනාව නිතරම කියව කියව ,ඔවුන්ට කළගුණ සලකන්නේ කොහොමදැයි ලතැවෙද්දී..

" ...හැමතිස්සෙම පොත් කියව කියව ඉන්නෙ නැතුව පොතක් ලියන්නකො එයාලට දෙන්න.... කියලා මාව මේකට යොමු කළේ ලෝකෙට එක්කෙනෙක් වුන මාව ලෝකයක් කරගත්ත මගේ ආදරණීය සැමියා .

උපහාර පොතක් නම් නෙමෙයි.මට ඕනි වුනේ ලස්සන කතාවක් ලියල පිදුම ආදරණීය ඔයාලා වෙනුවෙන් වෙන් කරන්න.
චූටි කතාවක් නිසා කතාව ගැන හැඳින්වීමක් නොකර ඉන්නම්.කියවලාම බලන්නකෝ.




මෙහි එන නම් ගම් චරිත සියල්ල  මනංකල්පිතය.

1

***"ඇස ගැටෙනා දස දහසක් නෙතු මත
ඔබෙ දෑස ම මා සෙවූ තරම්...
ඔය නෙතු මා සතු නොව බව දැන දැන
මා පෙම් කෙරුව තරම්...
ඔබ නොදනී මුලු ලොවම දනී....***

"මොනවද අප්පේ මුලු ලොවම දන්නේ"යි ගාමින් කාංචනා මිස් පන්තියට එනකල්ම කිසිවෙකුත් ඇයව දුටුවේ නැත.

"නෑ මිස් මේ සන්දීප් ගේ මොකක්ද නැති වෙලාලු" තිනෙත් කිව්වේ අතේ තියෙන, ඩෙස් එකට ගහ ගහ ඉදපු කෝටුකෑලි දෙක ලොකර් එකට දානගමන්.මිසුත් සිනා වීමෙන් ඇවිත් වාඩි උනේ
"මුන්ගේ මට කෝලම් "කියාගෙන

"නෙතු නියමයි නේද ඉස්කෝලෙ වගකිව යුතු ළමයිනුත් ඉද්දීම අනිත් ළමයි බජව් දම් දමා නටනවා.මරු මැඩම් එහෙම ආව නම් "

"ඉතිං මිස්මනෙ කිව්වේ මෙයාලට රසවින්දනය කියා දෙන්න කියලා ෆ්‍රී වෙලාවට"
මං කිව්වේ නියපොත්තක් කටේ කොණකින් හපන් ගමන්.

"මාත් පේන ඇහුවේ හොරාගේ අම්මාගෙන් නෙ.ගේනවා ඔය පොත මෙහාට.....යාලුවෝ බේරගන්න වචන නම් හෝ ගාලා එනවා නේද "

"හ්ම් හ්ම් හ්ම්.මොකක්ද මේ පොත...."යන්තම් ලොකු ඇස්"..මේවා තමා විභාගෙට එන්නෙ ලියන්න නේද..."මිස් ඔරවගෙන ඇහුවා.

"අපේ ඉස්කෝලේ පුස්තකාලෙන් තමයි මිස් ඉතිං ගත්....තෙ......
ටර්ම් ටෙස්ට් එකත් ඉවරයි නෙ ඉතිං...මං නැලවි නැලවි කියද්දි නම් මිස්ට හිනාවකුත් ගියා.

"හ්ම්...බලමුකො කට්ටිය ගෙ කෙරුවාව එනකොට"

දුව දුව 6 වසරෙ සංජන මල්ලි පංතිය පැත්තට එන කොට ම මට හිතුනා සංගීත මිස් එවන්න ඇත්තේ කියලා.

"එක්ස්කියුස් මී මිස්.....නෙතු අක්කට වැඩක් නැත්නම් සංගීත මිස් එන්න කිව්වා"

"හා...ඔයා යන්න පුතේ"මිස් කිව්වා

"අනේ මන්දා නෙතූ..මේ ඉස්කෝලෙ මෙච්චර ළමයි ඉදලත් බටනලාවට...එනවුසින් වලට...අරකට මේකට සේරටම නෙතූ..නෙතු..නෙතු...ටීචර් වෙච්ච මටවත් නෑ ඔච්චර වැඩ කන්දක්...මොනවා කරත් කමක් නෑ

ඉගෙන ගන්න එකට මුල්තැන දෙන්න පුතේ…හරිද "
කියලා මට යන්න අවසර දීපු ඇය. …අපේ පන්ති භාර
ගුරුතුමිය.

2

නෙතූෂි සංජනා බණ්ඩාර.ඒ මගේ නම.කුඹල්ගම මහා විද්‍යාලයේ 11 වසරෙ තමයි මං ඉන්නේ.1 වසරෙ ඉදලා ම මං හැමදේටම චකිතයක් නැතුව ඉදිරිපත් වෙලා මං දිනලා තියෙනවා.

හ්ම්...මේ සේරමත් එක්ක 11 වසරෙ දි මට ප්‍රධාන ශිෂ්‍යනායිකා තනතුර ලැබුණෙ ඉස්කෝලෙ වෙනුවෙන් ඇලී ගැලී මං වැඩ කරන නිසා වෙන්නැති.

අපේ ගම වැඩිය දියුණු නොවිච්ච පුංචි ගමක්.මං ඒ ගමේ දුප්පත් පවුලක කටකාර කෙල්ලෙක් උනාට කොල්ලෙක් වගේ වැඩ කරන හැබැයි හිත හොඳ කෙල්ලෙක්.තාත්තා පලිහවඩන මුදලාලිගේ පතලෙ වැඩ.අම්මා තමයි ගෙදර ඉදලා අපිව බලාගත්තෙ.අයියයි මා යි අම්මයි තාත්තයි ගොඩක් සතුටින් ජීවත් උනා.

අයියා මේ පාර උසස් පෙළ පාස් වෙලා කොළඹ කැම්පස් එකේ මෙඩිකල් ෆැකල්ටියේ ඉගෙන ගන්නවා.මං මේ පාර සාමාන්‍ය පෙළ විභාගයට මෙහෙ ඉදං ලෑස්ති වෙනවා.හැබැයි ඉතිං මේ සේරම අපෙ තාත්තා ගේ කර උඩ තමයි.

අයියා එහේ ඉදං පොඩි ජොබ් එකක් කරන ගමන් ම කැම්පස් එකට යන්නෙ තාත්තට පොඩි හරි සහනයක් වෙන්න.

මේ මගේ වපසරිය.අම්මා එක්ක යාලුවෙක් වගේ හැමදේම කියලා හිනාවෙන කෙනෙක් මං.අම්මටත් මාව ඕනිම දිහාක යවන්න බයක් සැකක් නැති බව මං දන්නවා.

හ්ම්.. හ්ම්..දැන් ඔන්න මගේ ඉස්කෝලේ පැටිකිරිය තමයි.කවුරුහරි මට ගැහුවොත් මාත් ගහනවා කියන ලෙවල් එකේ තමයි මං ඉන්නෙ.
අපේ ගෙදරින්…
මගේ යාලුවෝ…
මට කතා කරන්නේ ආදරේ ට
…නෙතූ….කියලා.හෂානි,චලක්ෂණා,
තිසරි,යසසි…මේ මගේ සෙට් එක තමයි.අපේ සෙට් එකේ වැඩියෙන්ම හිටියෙ කොල්ලො . උන්ට ඉතිං නම් කියනවට වඩා පටබැඳී නම් කීවොත් තමා හැමෝම අඳුරන්නේ.

කොල්ලො කෙල්ලො අපි සේරම සෙට් වෙන්නෙ පනසලේ හවස බෝධි පූජාව කියලා රෑ වෙලා පාඩම් කරන්නත් එක්ක.අපේ හාමුදුරුවෝ තමයි නොදන්න දේවල් කියලා දෙන්නෙ.හාමුදුරුවෝ දෙන පලතුරුත් කාලා රෑ එකොළහ දොළහ වෙනකල් අපි දහම් පාසලේ සෙට් එක පාඩම් කරනවා.

3

මිස්…මිස්…..අනේ මගේ ඉංග්‍රීසි ලකුණු කියන්නකෝ.අනික් ඒවගේ මං දන්නවා.අනේ කියන්නකෝ මිස් දිලීප ද මම ද පළවෙනියා

"හරි හරි කෙල්ලෙ අම්මලා ආවම අම්මලගෙ අතට දෙන්නම්කෝ "
කාංචනා මිස් හිනාවෙවී කිව්වා.
වෙනදා නම් රිපෝට් කාඩ් එක දෙන්නේ අපි අතටමයි.මේ පාර සාමාන්‍ය පෙළ විභාගයට තව මාසයයි නිසා රැස්වීමක් කියලා අම්මලා අතටමයි දෙන්නෙ.

"නෙතූ…පුතේ ඔයා හැමදාම පන්තියේ පළවෙනියා.හැමදාම රැස්වීමක් තිබ්බොත් එන්නේ ඔයාගේ අම්මා විතරයි.අනිත් අය සේරම ගේ අම්මා තාත්තා දෙන්නම එනවා.ඇයි පුතේ…මුකුත් ගැටළුවක් ද…"

"අපේ තාත්තා හරි හොදයි මිස්..ඒත් ඉතිං තාත්තා වැඩට නොයා රැස්වීමට ආවොත් මේ සතියෙ අග කඩේ පොතට බඩු ගද්දී තමයි දැනෙන්නෙ.බත් එකත් දාගෙන බෑග් එකත් කිහිල්ලේ ගහගෙන පාන්දර ම යනවා.හවසට මඩ නාගෙන ගෙදර එනවා දකිද්දී මට මහ දුකක් දැනෙනවා මිස්..."

" දුක් වෙන්න එපා පුතේ.ඒකට තමා අයියා වගේ පුතෙකුයි...ඔයා වගේ දුවෙකුයි ඔයාගේ තාත්තට ලැබිලා තියෙන්නේ පුතේ.ඔයාලට පුලුවන් අම්මා තාත්තා ව රජෙක් වගේ බලාගන්න"
මිස් එහෙම කිව්වේ මං ගැන දුක හිතිලා වෙන්නැති.

අපේ අම්මා ට හොද රස්සාවකට යන්න පුළුවන්කම තිබ්බත් තාත්තා කැමති උනේ නෑ.තාත්තා උපතින් ලැබුණු ඉඩකඩම් හැමදේම අතෑරලා තනියම දේවල් හදාකියාගන්න තාත්තට ඕනි උනා.

මහ ලොකුවට සල්ලි නොතිබ්බට අපි හැමදාම හොදට සැපට කාලා බීලා ඉදියා.කවදාවත් අඩුපාඩුවක් අපිට දැනෙන්න තාත්තා ඉඩ දීලා නෑ.අයිස් ලොරියක් ගේ ළගින් ගියොත්..අපිට අයිස් ඉල්ලුවොත්..අතේ තියෙන සල්ලි සේරම දීලා හරි ඉන්න හැම ළමයටම අරං දීලා අපි කන හැටි බල බල හිනාවෙනවා.
මං දන්න හිත හයිය..ඇග හයිය එකම කෙනා මගේ තාත්තා.තාත්තාට බෑ කියලා දෙයක් නෑ.ඒ වගේම

තමයි කවදාවත් කිසිම කෙනෙකුට නෑ බෑ කියලත් නෑ.තමන්ට පුලුවන් විදිහට හැමෝටම සැලකුවා.

තාත්තා ගන්න සල්ලි රුපියලක්වත් අපේ අම්මා නාස්ති කරේ නෑ.පොඩි පොඩි ගණන් එකතු කරලා අපේ පොත්වල දාන්නත් අම්මා අමතක කළේ නෑ.අපි බඩු ගත්තෙ කඩේ පොතට.සතියකට බඩු අරං ඊළඟ සතියෙ ඒ සල්ලි ගෙවලා ආයෙම බඩු ගන්නවා.ගොඩක් අය පුරුදු වෙලා හිටියා මේ විදියට අපි වගේම.

4

"මේ මාසෙ ගිය ඉක්මන බං"
චලක්ෂණා කිව්වේ ඇත්තටම දුකෙන්.

"හ්ම්…සිරාවටම අපි ලබන සතියෙන් පස්සේ
ඉස්කෝලෙ එන්නේ නෑ නේද බං…"
සුරාජ් කිව්වේ මූණ ඇඹුල් කරගෙන.

"අපි දෙනන්ගෙ වැඩේ ම කැන්ටිමේ පාන් කාලයි
ප්ලේන්ටියයි.. නැත්නම් ආප්පයයි රෝල්
එකයි….හෙටින් පස්සේ ඒ සේරම නෑ ඉතිං"
මගෙ ඉන වටේට අත් යවන ගමන් චලා කිව්වේ
වැටෙන්න ඔන්න මෙන්න තියෙන කදුළක් පිහදාගන්න
ගමන්.

යොවිදු .. සදරුවන්..සනුක…සන්දීප්.මේ අපි ළඟින්ම
ඉදපු සෙට් එක.

"ඒ අඩෝ කොහොමද බං අඩන්නෙ නැතුව හිර කරං
ඉන්නෙ..පට්ට දුකයි බොක්ක"

"සනුකයා..ඔය නෙතුවගෙ කෑම එක ගනින්කො අදින්
පස්සේ නෑ ඉතිං ඕවා"

"කාපං කාපං..ඒ ඉදුල් ගාගන්න බෑ බං මටත් කටක්
කවපන්කො…"
යොවිදු කියද්දි සදරුවන් නෙතුව ඇදගෙන ගියා.

"මේ..මට උදව්වක් ඕන "

"මොකක්ද..මට කරන්නවත් දුන්නෙ නෑ හන්න.."

"අනේ රෙද්ද හන්න හන්න කෑල්ල දාන්නෙපා බූරිච්චියෙ..කොච්චර කිව්වත් අහන්නෙ නෑ..අපේ පන්තියේ උන් උඹට තියෙන ෆිට් එකට ඇද නොකරට අනිත් උන් ඇද කරනවා"

"හා ඉතිං…."

"මේ…පොඩි බඩ්ඩක් තියෙයි දෙන්න "

"කෝ….කෝ.. මොනවද..දියංකො උඹ අදත් දං ගෙනාවද "

"මහ මට පෙරේතියක් මේකි නම්..දී නෙමෙයි ගෙනාවා මං..ලියුමක් තියෙයි ..අද චෙක් කරයි ද බං."

"ඕක අහන්න ද යකෝ බත් කටක්වත් කන්න නොදී ඇදං ආවෙ.නෑ..අද හේරත් සර් එන්නේ නෑ කිව්වා. මේ..මං උඹට අන්තිම පාරට කියන්නේ විභාගෙ ඉවර වෙනකල් උඹේ ඔය මනමාලකම අතෑරලා දාපං හරිද.කී දෙනෙක් ට ලියුම් දුන්නද..මර විසේ.."

"හාකො ඉතිං…ඔයා කියන දෙයක් තමා ඉතින්."

"ජෝක් නෙමෙයි බං..ආයෙ ඕවා කරනවා නම් මා එක්ක කතා නොකරට කමක් නෑ"

"හරි හරි සුදෝ ඉතිං..උඹ හැම හොද දෙයක්ම කියලා දෙනවා.කියන දේ ඇහුවෙ නැත්නම් තරහා වෙනවා…මගේ අක්කා වෙන්නැති ගිය ආත්මෙවත් "

සදරුවන් මගේ කරට අතක් දාගන්න ගමන් කියද්දිම අපේ පන්තියේ ඉන්න නසරානියා තාරුකා දුවගෙන ආවා ඇගේ හැප්පීගෙන.

"මේකි උඹට අදත් බණ කීවා නේද..අනේ නෙතුවො මේ උඹ සේරම දැනගත්තට ලව් ගැන දන්නෙ නැතුව උඹට බණ කියන්නෙපා බං හොදම යාලුවා කියලා.

"අනේ මල්ලි මේ ලවක් දෙවක් නැති ඉලව් ලව් මට එපා.ඇයි අහලා නැද්ද..

***සතුටට කදුළට දෙකටම මුල***
***මේ ආදරයයි ලොව පුරා ….***
***දැන් දැන එක්වී කදුළට තැන් තැවි***
***හඩන්නට එපා…***
***ජීවිතයට මාගේ.. ආදරේ නෑ ඕනේ***
***සිනාසෙන්න හෙට ආයෙ…….***

මම තාලෙට කිව්වා.

"ඈහ්…පොත් ගුල්ලි සිංදුත් දන්නවද..සදරුවන් කියද්දි කටේ තිබ්බ ප්ලේන්ටි උගුරත් විසි උනා.
ඕකෙ හොදම හරිය කිව්වෙ නැනෙ උඹ.

"මිතුරු දමක් මිස ආදරයක් සොයමින් ඇයි වෙහෙසෙන්නේ"

ඔන්න ඔහොම එකක් නේද..

සේරම එකපාරටම මීයාට පිම්බා වගේ සයිලන්ස්. වීරසිංහ සර් එකපාරටම එතනට ආවා.

"නෙතු විනාඩියට නිවේදනය ක් දෙන්න ප්රිෆෙක්ට්ලා සේරම ඉමීඩියෙට්ලි පුස්තකාලෙට.සන්දීප්ව ඔෆිස් එකට එවන්න".

"හරි සර්"

සර් යද්දිම මං මීඩියා යුනිට් එකට දුවලා අනවුන්ස්මෙන්ට් එක දුන්නා.මට එළියට අඩියක් තියන්න උනේ නෑ.මොකෝ කේස් එක ගාගෙන අපේ උන් කඩා පැන්නා

"අද චෙක් කරයි වගේ .

හැමෝටම කියන්න එපා

උන්ට කියහං '' මා කියමින් දිව්වේ 7.30 ට බෙල් එක වැදුනු නිසා.

අපේ උන්ට පරක්කු වෙලා ආවම, හොරබඩු වලට සේරටම  ගැලවුම්කාරයා මම තමයි.ඒ තරමට අපේ

මැඩම්...ටීචස්ල...මාව විශ්වාස කළා. හැබැයි .....මං ඉස්කෝලෙ නම කැතවෙන්න කිසිම කෙනෙකුට,හැසිරෙන්න .....කතා කරන්නවත් .....ඉඩ දුන්නෙත් නෑ.අනුන්ගෙ ලව් ගැන මිස්ලට කේලම් කීවෙත් නෑ.

හැමෝම මාත් එක්ක ළගිං ම අශ්රය කළේ මං අවංක චරිතයක් කියලා උන් සේරම දන්න හින්දා. අපේ එකෙක් අහේතුකව සර්ල උනත් බැන්නොත් ,මං මුලු පන්තියම අරං office එකට යන්නෙ මගෙ පට්ටම ඕනෙනම් ගලෝල දෙන්නම් කියන තරම් ගැම්මෙන්ම තමයි.12 , 13 අය උනත් මං එක්ක ගොඩක් fit. ඒ වගේ ම හැමෝම මං තරගයකට ගියාම ක්‍රීඩා හරි ...සාහිත්‍ය හරි .... ඉංග්‍රීසි හරි කියල නෑ ඕනිම එකකින්ම මං ස්කෝලෙට තැනක් තැනක් ගේනවා කියන විශ්වාසෙ අපේ ඉස්කෝලෙ හැමකෙනාගෙම තිබුනා . ඒක කළා මං. ඒ හැමදේම පස්සෙන් ඉදියෙ කාංචනා මිසුයි. අපේ හාමුදුරවොයි.

මේ සේරම මැද o/L විභාගය ලියන්නට තියෙන දවසටකලින් දවසෙ දහවල්ම අයිය ගෙදර ඇවිත්... මං එතකොට හිටියෙත් පන්සලේ හාමුදුරුවන්ගෙන් මං නොදන්න පාඩම් ටිකක් අහගන්න ගමං.

" සුදු නංගියා...''වෙනද වගේ ම ආදරෙන් කතා කරන අයියාගෙ කටහඬ ඇහිලා මං එක පාරට ම බැලුවා.

අනේ අයියා ආවෙ නෑ කිය කියා මං මේ හාමුදුරුවන්ට කෝල් එකක්වත් දුන්නද කියලා අහ අහ හිටියෙ.

" අපි බෝදි පූජාවට හවසට එමු නංගි '' දැන් යංද

"අයියා මගෙන් ඇහුවේ මට අමාරුයි දැං යං'' කියා නොකියා කියනව වගේ.

# 5

එදා පාන්දර මා විභාගයට ගියේ අයියා එක්ක. එයත් එක්ක යනකොට මට ගොඩාක් ලොකු ආඩම්බරේකුත් දැනුනා.

දන්නෙම නැතුව O/L ප්‍රතිඵලද එන්නත් කාලෙ ලංවෙලා විෂයන් නවයම මම හිතුවාටත් වඩා මට ලේසි නිසා A9 ක් ඇති කියල මට සැකයක් තිබුණෙ නෑ. අද දහම් පාසලේ අවුරුදු උත්සවේ , මං ගෙදර ගියේ ගොඩක් හවස.

" හ්ම් .. මෙයා යාලුවො එක්ක රවුම් ගැහුවා මිසක පාඩම් කළේ නැනෙ... ඔන්න තියෙනවා එවෑ ප්රතිඵල ''.කිය කියා මට බැන බැන අයියා එළියට ආවා.

.. මං දන්නවා අයියා ඔය බොරු කරන්නනෙ මං නෙමෙයි ගෙදර සේරම දන්නවා. " A9 ක් නේද පුතේ තාත්තා කුස්සියෙ ඉදං ම ඇහුවේ ලොකු විශ්වාසෙකින්.

" ඔව් තාත්තෙ . පච් මගෙ අහිංසකී ''
අයිය මාව තුරුලට ගත්තේ මා ගැන වු ආදරයට ද අනුකම්පාවට දැයි මට හිතුණා. මට කාංචනා මිස් කියපු හැමදේ ම මතක් උනේ එදා ගෙදර අයියගෙ ඇස්වල පිරිච්ච සතුටු කදුලු දැකලා

නෙතූ.. කෙල්ලෙක් ඉන්න කොට ගෙදර හැමෝම
පතන්නේ එයාගෙන් ජයයි...හැදියාවයි.
ඒ දෙකම ඔයාට අඩු නැතුව දෙයියො දීලා තියෙනවා...

යාලුවන්ට වගේ හැමෝගෙම ආදරේ මැද හුරතලේට
හැදිච්ච මං අලුත් ආදරයක් ගැන කිසිම අවශ්‍යතාවක්
දැනුනේ ම නෑ.

එදා ප්‍රතිඵල කියන්න මම ඉස්කෝලෙට යනකොටම
එයාලට ප්‍රතිඵල ගෙන දැනගන්න හම්බ වෙලා හැම
ගුරුවරයෙක් ළගටම ගිහිං දණගහලා වැදලා. මං
කාංචනා මිස් ලගට ගියේ

" ප්‍රතිඵල දන්නවා දෝ ''අහගෙන එනන සිතූ අයියත්
හිටියා එයාලට A/Lළගයිනෙ දැං

"අපි ප්‍රතිඵල දන්නවා ....මොනවද දැන් ඕනි අපෙන්
....සිතූ අයියා අහද්දී මිස් හිනා උනා

"මට ඔයාලෑ හාමුදුරුවෝ උදේම කතා කළා. ඔයා රූ
අයියත් එක්ක පන්සලට ප්රතිඵල කියන්න ගියා
කිවුවා. උදේ තමා අපි දැන ගත්තෙ කාංචනා මිස්
කිව්වා.

බෙල් එක ගහපු නිසා 7 වසරට ගියේ ඒකෙ ඉන්නෙ
යක්ෂ පැටව් ටිකක් හින්දා. ලොකු පොඩි හැමෝම මට
ගොඩක් හිතවත් හින්දා.ගිය වෙලේ ඉදං ඉවරයක් නෑ
හැමෝම එක්ක කතා කරලා
ඉන්ටවෙල් එකේ දී සේරමලා ම හම්බවෙලා කතා
කරද්දි මට දැනුනේ මං මහ ලොකු වීරයෙක් වගේ

දහම්පාසලේ දී හාමුදුරුවො කියලා දෙන ඒවයි ඉස්කෝලෙ දි අම්මෙක් වගේ ඉන්න කාංචනා මිස් කියන ඒවයි මගෙ හිතට දැනෙනවා. ඒක අපෙ අම්මත් දන්නවා .අනික මගෙ ජීවිතේ මම කැමතිම චරිත දෙකක් තමයි ඒ.

එදා ගොඩාක් කාලෙකට පස්සෙ අපේ නැන්දා අපේ ගෙදර ආවේ සිතුම් අයියත් එක්ක .සිතුම් අයිය ගැන මගෙ හිතේ තිබුණෙ මගේ ම අයියා ලසන්ත කෙරෙහි ම වූ සහෝදරබැඳීමක්. පොඩි කාලේ ඉදල ම එකට ම හැදිල වැඩිලා සෙල්ලම් කරපු අපි ටියුෂන් එක්ක ගොඩක් ඈත් වුණා. සිතුම් අයියා ටවුමේ central එකට ගියාට පස්සෙ අද තමයි එයාව දැක්කෙත් මාව පිටේ තියන් ඔට්ටු දුවපු... ඇලේ රංඩු වෙවී පීනපු... සිතුම් අයියා නොවෙයි..... ඊට හාත්පසින්ම වෙනස් කෙනෙක් දැන් එයා

" අප්පේ ...මේ අර ඇටිකිච්චි කෙල්ල දැන් ලොකු වෙලා... නිකම් පිටිමුට්ටයක් වගේ ... මේ වට්ටි අම්මෙ මට වතුර එකක් ගේනවා බොන්න ''

" උනහපුලුවා වගේ ඉදං මට එක එක පාට් දාන්න එන්නෙපා හරිද... මං දැන් බ්ලැක් බෙල්ට් කියමින් මා කුස්සියට ගියේ හිනා වෙන ගමන්."

" ගෙට ගොඩ උනා විතරයි පටන්ගත්ත ඔන්න මුං දෙන්නගෙ කරච්චලේ ''

තාත්ත බොරු තරහක් පෙන්නුවා අපේ අයියාත් සිතුම් අයියත් පොඩි කාලෙ ඉදලම හොදම යාලුවො. මට හොරෙං දෙන්නා වත්ත පහළට ගිහිං කුටු කුටු

ගාන්නෙ කාගෙ හරි කෙල්ලෙක් ගැන වෙන්න ඇති කියලා මට හිතුණා.

" මල්ලී ඔය විකාර වැඩ නවත්තල දැන්වත් අර වහල දාල තියෙන ගෙට එන්න ඒ වතුපිටි නිකං පිටවුන් බුක්ති විදිනවා ඕං...තාත්තා කීවා මල්ලිට ඒ පැත්තෙ එන්නෙ කියලා නංගි හදන  පරිප්පු මාලුවත් කන්න ආසලු ''

"අන්තිමට එහෙනම් මගේ ගෑණි හොද නැති වෙච්ච උන්දෙලාට ඒ ගෑනී ම අනර්ඝ වෙලා දැං එහෙනම් කියමින් තාත්තා විටක් කෑවා ''

." නෑ මල්ලි අනිත් ලේලිලාගේ වැඩ කෙරුවාට ම තාත්තට එයාලව එපා වෙලා ...වැඩේ ම නංගිගෙ අගේ කියනවා ඔය පරණ දේවල් අතෑරලා එන්න මල්ලි ඔයාගෙත් උරුමෙනෙ ''නැන්දා කීවේ
තාත්තගෙ ඔලුවත් අත ගාන ගමන්

" උඹ බොරුවට මේ පතල්වල දුක් විදින්න ඕනියෑ හරියට අර වත්තේ ආදායමෙන් ජීවත් උනහැකි අගේට ''

" පොඩි උනත් මං මගෙ දාඩිය මහන්සියෙන් ම හදාගත්තු ගේ කෑල්ල මේ . ලක්සෙට කොඩි නොදැම්මට අපි සතුටින් ජීවත් වෙනව බං ''

ඒ උනාට අයියටත් කොල්ලෙක් ඉන්නවානෙ අයියෙ මේ ඉඩමයි ගේයි බාරියෑ අයියට කුලියට උනත් දෙන්න .හෙට ඕවා පිළිවෙල කරන්න ඕනෑයි කියලා ඔය එන්න කිව්වේ.

" නෙතුවො . අපි යනව දුවේ එහෙනම් '' කියලා නැන්දා කියද්දිම මං දණ ගහලා නැන්දාට වැන්දා.

" උඹේ ගතිනම් මගෙ කෙල්ලෙ දෙවියො දීලා වගේ අපෙත් ඉන්නෙඅර උඩැක්කියක් වතුර උගුරක් ළඟට ගෙන්න ගන්න වදින්න ඕනි ඈට. ඒ අතින් අපේ මල්ලි වාසනාවන්තයි . තාත්තා ට උඩින්
ඉදගන්නෙ නෑ. කෑම බීම විටක් සේරම ලගට ... අයියට විරුද්ධව වචනයක් කියන්නේ නෑ ගෙදරට ශ්රියා කාන්තාව වගේ ඉදියි.නැන්දා කිව්වේ ඇත්තට ම කියලා මං දන්නවා.

" අනේ නැන්දෙ ... බොරුවට මාව මුරුංගා අත්තෙ තියන්නෙපා '' මං නැන්දගෙ කරේ අත දාගෙන කිව්වා.

" නැන්දා දන්නැනෙ ... මෙයා විභාගෙ පාස් උනා කියලා අපිට පාටියකට තනියෙන් උයලා කන්න දුන්නනෙ...පහුවදා දවසම බඩ යනවා අයියා කීවේ මගේ බෙල්ල වටේ අතත් දාගත්ත ගමන්. ''

මං අයිය තල්ලු කරගෙන නැගිට්ටේ " ඉන්නවකො අයේ සම්බෝලයක්වත් හදලා දෙන්නෙ නෑ... ඇයි රහයි කීවේ. බොරු කියලා මාවපල් කරන්නෙපා ...''

" සිතුම් හෙට වරෙං ... මෙයා ගානෙ රෑට උයනවලු බඩ සුද්ද වෙන්න බෙහෙත් බොන්න ඕනි නෑ. ''

" අයියේ ...... මං අයියට ගිරියටින් කෑ ගැසීම්.

" වදිනවා මටත් මං යන්න හදන්නෙ '' සිතුම් අයියා කිව්වට මං ගනන් ගත්තේවත් නෑ." මං ඔයාලට වදින්නෙත් නෑ... ආයෙ වතුරවත් දෙන්නෙත් නෑ...''

"ඔයා නම් මාර බයිට් එක සුදූ මේ ... දැන් එනවකො අපේ ස්කොලෙට හැබැයි ඉතිං ඔයා එනකොට මං නෑනෙ ඒකනෙ වැඩේ ...''
සිතුම් අයියා කිව්වා

" තාත්තත් එක්ක හෙට එන්න නංගි අපරාදෙ ඔය ගෙවල් ඉඩකඩම් පිලිවෙලක් කරන්න ඔයා කියන දේ මාමා අහනවා .ලසන්ත අයියත් කියනවා කිව්වා.

" හ්ම්........ තාත්තගෙ වචනෙට පිටිං අපි තියා අම්මවත් යන්නෑ අයියේ .''

"මේ සුදු කුමාරිහාමි ... මේ බලන්වකො චුට්ටක් ඔරවන්නැතුව ... විහිලුවට හලෝ කිව්වේ . මං ඔයාට ජ්ම්බු ටිකක් ගෙනාවාබයික් එකේ කවරෙක ඇති ගන්න ගිහිං මල පෙරේතයානෙ දෝසි වලට ''

ඒක අහපු ගමන් තරහ අමතක වෙලා මං දුවලා ගිහිං ජම්බු කවරෙ ගෙනාවා.

" අක්කෙ රෑ වෙලා යං කෑම ටිකක් කාලා කොල්ලො දෙන්නත් කාලෙකින් නෙ හම්බුණේ . '' බැ නංගි මං එහෙනම් දැන් යන්නම් මල්ලිත් එක්ක හෙට එන්න .

6

A/L වලට logic කරන්න මට හිතුනෙ ටව්මෙ සෙන්ට්‍රල් එකට A/Lවලට මං ගියාට හිත තිබුණෙ අපෙ ගමේ ඉස්කෝලෙ .

." O/L වගෙ A/L ජොලි නෑ නේද අයියෙ අයිය ගෙදර ආපු වෙලාවක මං අයියට කිව්වෙ මූනත් අකුලගෙන.

" ඒ ඇයි නංගි මුකුත් අවුලක් ද ''

" නෑ ඉතිං අපි ඒවට අලුත්නෙ ''

"  එහෙම හිතන්නෙපා තියෙන හැමදේට ම ඉදිරිපත් වෙන්න.නංගි කොතන ගියත් තමන්ගෙ හැකියාව එක වගේනේ''

අපි දැං ඉන්නෙ තාත්තාගේ නමට සීයා ලියලා.දුන්න ඉඩමෙ .කාමර දෙකයි සාලෙයි කුස්සියයි තිබුනු අපේ පුංචි ගේ වෙනුවට දැං කාමර 6කේ එක්ක බාත්රූම් එක පවා තියෙන ගේක , ඒ උනාට මටනම් තාම නුහුරුයි වගේ . අපේ පරණ ගෙදර විතරක්   තියාගෙන පිටිපස්සෙ තියෙන අක්කර බාගයක් වගේ ඉඩං

තාත්ත පන්සලට ලියලා දුන්නෙ දෙලොවට ම වැඩක් වෙන දෙයක්නෙ කියල.

අපේ හාමුදුරුවන්ගේ මිනිස්සුන් එක්ක තියෙන  බැදීම හන්දාමයි තාත්තට එහෙම හිතක් පහළ උනේ, ගේ නම් කුලියට දීල... ඒකෙනුත් ආදායමක් එනව .

අලුත් ඉස්කෝලෙ ඉතිං අපේ O/L සෙට් එක වගේ යාලුවො සෙට් උනේ නෑ... දෙතුන් දෙනෙක් ඉදිය හැබැයි ඉතිම් ගොඩක් කිට්ටු නෑ..

ඒකෙන් ගායන වාදක කථික , නිවේදන හැමදේටම මාත්  මාත් සහභාගි උනා ඒවයින් සහතික, ජයග්රහනත් හම්බුනාඒ මොක උනත් ගමේ ඉස්කෝලෙට වගේ මේකට හිත ගියේනෑ .මං අමාරුවෙන් අවුරුදු දෙක ගිහිං A/L ලියලා දැං ඔහේ ගෙදරට වෙලා ඉන්නවා ගෙදර ඉන්න ගමන් මගේ වැඩේ ම යාලුවො එක්ක වොලිබෝල් ගහනවා.... නාම පොඩි එකෙක් වගේ.

දහම් පාසලේ පොඩි ළමයින්ට පාඩම් කියාදෙන්න ඉරිදට ඉරිදට යන හින්දා දහම් පාසලේ අවුරුදු උස්සවේටත් මං ගියා.

මගෙ O/L සෙට් එක නම් නාවල නතර වෙලා course එකක් කරනවා. අම්මලා තනියෙන් නිසා මට යන්න හිතුනෙ නෑ.

අපි හැම තරගෙකට ම ගිහිං නටලා ... සිංදු කියලා ... මාර Fun එකක් ගත්තා . මං හැමෝම එක්ක fit නිසා

අරුං නැති අඩුවලොකුවට ම දැනුනෙත් නෑ, හැබැයි නැත්තෙත් නෑ..

අනිතිමට  වොලිබෝල් මැච් එකක් ගහන්න සෙට් වෙද්දිම අපෙ අයියයි සිතුම් අයියයි දෙන්නත්  ආවා. වැඩේ කියන්නෙ අපේ හාමුදුරුවොටත් එන්න ඕනි උනානෙ වොලිබෝල් ගහන්න.

සිවුර දැම්මට මොකද හාමුදුරුවො.කොල්ලන්ට වඩා හොදට සෙල්ලම් කළා. අපේ කන්ඩායම සෙල්ලම් කරද්දි කරන ගොන් වැඩ බල බලා අපේ අයියයි සිතුම් අයියයි  මට හූ.... කියන් යද්දි                  බෝලෙන් දමලා ගැහුවෙ තරහින් මං.

" මේ ... නෙතුවො... අර උබලගෙ සිතුම්ගෙ වැඩේ උඹ දිහා  බලාගෙන ඉන්න එක.... උෟ උඹට ලව් ද බං....''

" මුතු.... අහද්දි මට බකස් ගාලා හිනා ගියා. පිස්සුද බං පුලුවන්  නම් ඕකා මගෙ ඔලුවත් කයි...  වැඩේ මා එක්ක රංඩු  වෙනවා...''

" එහෙමද ..... අපිට කැපෙන්නෙ නැද්ද  බං ... මාර හැන්සම්  උෟ.... ''

" සිතුම් අයියේ....තමුසෙට කෙල්ලලෙක් නැත්තම් සෙට් කරන්නද ... මං කෑගහලා එහාට වෙන්න ඉදපු සිතුම්ගෙන් අහද්දි  මුතු මගෙ කට වහගත්තා එකිගෙ අතිං .''

මං හැමසතියෙම ඉරිදට දහම් පාසල් යනවා. ගමේ යාලුවන්ගෙ මලගෙවල්... බණ ගෙවල්...දාණෙ ගෙවල් ... රැයක් දවාලක් නෑ...සේරටම ගියා. එපා කීවෙත් නෑ.එයාල මාව sure නිසා.

A/L ඉවර වෙලා තිබ්බ කම්මැලිකම ගෙවාගත්තෙ එහෙම තමා.

අයියා කාර් එකකුත් අරගත්තෙ නිසා job එක කරන .කරන ගමන් කැම්පස් ගියපු නිසා. අපේ වියදම් තාත්තා බලපු හින්දා අයියගෙ පඩිය ඉතුරුයි ඒක නිසා පාවිච්චි කරපු කාර් එකක් ගත්තෙ තාත්තගෙනුත් සල්ලි ටිකක් දාලා.තාත්තත් නොකිව්වට ඒක එලවගෙන ගම වටේ යන්න තාත්තා ඇත්තටම කැමතියි.

තව අවුරුද්දකින් අයියත් ඩොක්ටර් කෙනෙක්. සිතුම් අයිය කලේ මැනේජ්මන්ට් මේ අවුරුදු දෙකේ ම සිතුම් අයිය හිටියෙ කොළඹ. මාමා ගේ බිස්නස්වල බැඩබලන ගමන් ඉගන
ගත්තේ . දැන් නම් මාමට සනීප වෙලා එයා ආයෙ ම ඒවට ගිහිං ලු.හැබැයි එදා වගේ ම අදත් අපෙ අයියයි සිතුම් අයියයි ගොඩක් මට ලෙංගතුයි . මම ත් එහෙම තමා.

මේ පාර අයියා ආවෙ " තව සතියකින් result එනවලු ඔන්න නංගි ''කියාගෙන
" එන්නකො ඔයාට රහසක් කියන්න. '' අයියා මාව ඇදගෙනඑයාගෙ කාමරේටම ගියේ අපේ අම්මත් එක්ක හොර වැඩක් එහෙම කරන්න බෑ... මාට්ටු වෙන හින්දා.

'' මෙයා ලස්සනද ... මං
හැරමිටියක් හොයා ගත්තා '' කියලා කියද්දිම සිතුම් අයියා ඇවිත් අපේ කතාව මැදට පැන්නා.

" තව කිව්වේ නැද්ද බං.... දැන් මාස ගානක් උනා නේද ... මහ ලොකු නංගිගෙ විශ්වාසවන්ත අයියා...නංගිටත් කොලේ වහනවා ''

" බොරු නොකියා හිටපිය යකෝ ''

"  නම නදී දැන් සතියකට විතර කලිං සෙට් උනේ හොඳද නංගි මෙයා ''

" එහෙනම් ඉතිං මම දැන් පැත්තකට විසි වෙයි '' කියාගෙන එතනින් නැගිටල එළියට ආවේ මට ඇඬෙන්න වගේ ආපු හින්දා

" නංගීී... නංගීී... "  කිය කියා අයිය මගෙ පස්සෙන් ආවත් මට ආපහු එන්න හිතුනෙ නෑ .දැන් අයියා වෙනද වගේ මට සළකන එකක් නෑ.එයාට අයිතිකාරියෙක් ඉන්නවනෙ ඒ හින්දා අපිව අමතක කරයි කියලා මෙගෙ හිත නිකං මොකද වෙනවා වගේ .

සිතුම් අයියත් රෑට කන්න ඉදපු හන්දා අම්මා ඉදිආප්පයි කිරිහොදියි සම්බෝලයි හැදුවෙ අපි තුන්දෙනාම ඒවට පෙරේත බව දන්න නිසා .

කෑම කද්දි වත් මං වෙනදා වගේ කට ගහ ගෙන ගියෙ නෑ .පාඩුවෙ කෑවා.

" අයියලා කන්න කලිං නංගි කාලත් ඉවරයි අද '' කිය කියා අන්නාසි ගෙඩියක් කපන ගමන් සිතුම් අයියා කිව්වේ පිහිය මගෙ බෙල්ලට තියලා

" මොකද මගෙ බෙල්ලක් කපන්නද ඕනි තමුසෙට '' මං කවදාවත් නැති විදියට සිතුම් අයියගෙ මූණට පැන්නෙ අලින්ගෙ පලි ගොනුන්ගෙන් ගත්තා වගේ.

අනේ පිහිය කැරකිලා සිතුම් අයියගෙ අත උඩට ම වැටුනේ මං අහක බලද්දිමයි.

" නෙතූ උඹට මොනවා වෙලාද මේ කොල්ලගෙ අතත් කැපුනා. මූසලකමට හැදෙන්නෙ ඔහොම. ''

එතකොටයි මං සිතුම් අයියගෙ අත දැක්කේ . ඇඟිලි දෙකක්ම කැපිලා ලේ ගොඩක් එනවා.

" අනේ අයියෙ මං හිතලා කළේ නෑ අයියෙ''ලේ ටික දැකපු ගමන් මං බයවෙලා සිතුම් අයියගෙන් රිදෙනවද අහ අහ ඉද්දි අම්මා ගිහිං බෙහෙත් පෙට්ටිය ගෙනාවා.

ස්...ස්...ගගා අත ටැප් එකට අල්ලද්දි මට හිතුනා දැවිල්ල ඇති කියලා තාත්තා ඒ පිහිය මට ගන්න දෙන්නෙත් නෑ හොදට කැපෙනවා කියලා.

"  දෙන්න අයියෙ මං බෙහෙත් දාන්න '' මං අයියගෙ අත අල්ලගෙන කීවේ උන දේට මං දුක්වෙනවා කියලා අගවන්න.

" අනේ අයියේ මට සමාවෙන්න ... මං හිතලා කළේ නෑ..'' කියලා මං අඬද්දි " දැන් ඔය ටැප් එක වහගන්නවකො '' කියලා අයිය මගෙ  ඔලුවට ඇන්නා.

" බෙහෙත් දාගෙන දැන් කන්නෙ කොහොමද '' පුතේ ... "හැන්දෙන්වත් කන්නම් ''.සිතුම් අයියා කියද්දී මට දුක හිතුනා.

"කපපු කෙනාට ම කවන්න කියහං .අයියා ඉදි ආප්ප බෙදාගන්න ගමන් කිව්වේ මං දිහා හොරෙං බලාගෙන.

" කවනව තමා ඔයා ඉතිං කවාගන්නකො අරයට කියලා'' මං අයියට රවාගෙන කියද්දී " ඉරිසියාකාරි...'' කියලා ඉදි ආප්ප එක පැත්තකින් තියලා අයියා මාව තුරුල් කරගත්තා.

"අනේ මගෙ සුදු නංගියො .....මං කාව බැන්දත් ඔයාගෙ තැන එයාලට දෙන්නෙනෑනෙ පැටියො ඔයා මගෙ නංගි...එයා වෙන කෙනෙක්... ඔයාට තියෙන ආදරේ අඩුවෙන් නෑ මැණික ... අපිට වාසනාව  ගෙනාවෙ ඔයා...'' අයිය  කියද්දි මං අයියා අස්සටම වෙලා හැඬුවේ ඉවසාගන්න බැරි දුකකින්.

" අම්මාත් කුස්සියෙන් එබී එබී කඳුලු පිහිනවා මං දැක්කා ''

" සුදු නංගි කවනවකො මට බඩගිනි ඕයි ඔයා බලාගන්න ඉන්නෙ ඔය අයියා විතරයැ . .....මාත් ඉන්නවනෙ. .....මං අයියට වඩා පරිස්සමට

බලා ගන්නම්. අපේ ගෙදර වැඩට කෙනෙක් හොයනවා අපි ...කන්න බොන්න දෙනවා... හැබැයි නො සැලරී...

සිතුම් අබිසෙස් රත්නායක නෙතුගෙ මස්සිනා එහෙම කිවේ නෙතු ගැන තමන්ගෙ හිතේ තියෙන කැමැත්ත වටින් වඩින්.ඇහෙන්න...

නෙතුගෙ දගකාරකම් වලට... ගති ගුණ වලට... හැමදේටම කැමති සිතුම් පොඩි කාලෙ ඉදලම නෙතුට ගොඩක් ලැදියි , දහය වසර ඉවර වෙද්දි නෙතුගෙ ලස්සන එන්න එන්න වැඩි වෙද්දි නෙතු ගැන හිතේ පිරිලා තිබ්බ සහෝදර කම නිකම්ම ආදරේකට පෙරලුන එක සිතුම් කෙලින්ම ලසන්තට කිව්වා. සිතුම් අම්මා තාත්තාට  මේක කියද්දි ම අම්මා කිව්වේ .

" උඹලා පොඩි කාලෙ තමා අපි  එහෙම කතා උනේ....''
උබල හිතන පතන විදි බලලා
ඕවා තීරණේ කරමු කියලා ගුණවර්ධන මාමා කියල තිබ්බෙ .කියලවත් කරගන්න බාරි දෙයක් උබේ හිතට ආවෙ පුතේ....

සිතුම්ට අම්මගෙ වචන වලින් හිතට ආවෙ මාර ගැම්මක් ...කොහොමත් නෙතුගෙ ඔලුවට ඕවා දැන්ම දාන්න හොද නෑ කියලා හිතුනු සිතුම් ඉදියේ නෙතුගෙ A/L ඉවර වෙනකල් මේක කියන්න.

ඒකට ටික ටික පොට පාදගන්න සිතුම්ට ලසන්තගෙ උදව් නොඅඩුව ලැබුණා. හැබැයි නෙතු මේවා දන්නෙ නෑ.වචනයක් හිම්හිට අහපු සිතුම් නෙතු මොනවා කියයිද කියලා ආසාවෙන් බලං ඉදියා.

" බලාගෙන ඉන්නවකො මං එනකල් තමුසෙගෙ ගෙදර වැඩකාරකමට .... මට වෙන වැඩ නෑනෙ ''

" හරි...හරි...මැඩම් ඉතිං සොරි... ඔයා නිකං කටු අත්ත වගේනේ .... විහිලුවට කිව්වේ . ''

" නැන්දේ... මට වතුර එකක් දෙන්නකො මේකි මාව ගිල්ලවලාම මරනව..... දැන් ඇති නෙතූ... බඩ ඵුල් ''

" තව කටවල් දෙකයි ඒකත් කන්න ඉතිං...අත රිදෙනවද ?... තරහා නෑනෙ මා එක්ක මං අයියත් එක්ක තරහින් ඉන්න වෙලේ ඔයා මොකද විකාර කලේ. ''

" මොකක් කරන්නද දැන්... මං ගිහිං එන්නම් හොදටම රෑ වුණා ''සිතුම් අයියා නැගිට්ටේ යන්න.

" සිතුම් පුතා අද ඉදලා යන්න ...පිට තැනක් නෙමෙනේ දැන් රෑ වුණා වැඩි... නැන්දා එහෙට කතා කරලා කිව්වා .''

" ඒකත් හොදයි මාමේ .... නොකිව්වට මම ඔලුව පැලෙන්න වැගේ මාමේ...'' සිතුම් අයියා කිව්වේ නළල අත ගගා...

" අද ඉන්න ගමන් ඔය ඔලුවේ බර නිදහස් කරනිංකො දැන් අවුරුදු ගානක ඉදන්නෙ ඔය බර '' ලසන්ත සිතුම්ට ඇහැක් ගහමින් කිව්වම නෙතූට ඒක තේරුණේ නෑ.

" නෙතු...අයියට කාමරයක් ලෑස්ති කරල දෙනව ...''
අම්මා කෑ ගැසුවේ කුස්සියේ ඉදං .

" ඔයා කොයි කාමරේද නිදාගන්නෙ අයියේ..'' මං ඇසූ ප්‍රශ්නෙට සිතුම් අයියා මා දිහා බලලා හිනා වුණා.

" මට ඔයා ළගට වෙලා ඉන්න තිබ්බනම් ...'' කියලා සිතුම් ගේ හිත කෙදුරුවා.

" කොහේද අහන්නෙ අර එහා කාමරේ හදලා දෙනවා...''

මං අලුත් ඇද ඇතිරිල්ලක්... කොට්ට උර එහෙට දාලා අයියට කාමරේ ලෑස්ති කරලා ඉවර වෙන කොටම සිතුම් අයියා කාමරේට ආවා " හැදුවද මගෙ සිරි යහන.''

" ඔව් රජතුමනි.... ඔබවහන්සේට තව අඩුපාඩු තිබේද ? ''දැයි අසමින් වට පිට බලපු මාව සිතුම් අයියාගේ ඇගේ වැදිලා එයාගේ පර්ස් එක බිමට විසි වුණා.

ඇද යට තියෙන පර්ස් එක අහුලගන්න සිතුම් අයියයි මම යි දෙන්නම එකපාර නැමුණට පර්ස් එක ගත්තෙ සිතුම් අයිය . මම විතරයි විසි වෙච්ච photo 1 දැක්ක පර්ස් ඒකෙ තිබිලා විසි වුන පින්තූරෙ මොකක්ද බලන්න මං ටක්ගාල ඒක අතට ගත්තා .එකපාරටම මං දැක්කෙ ෆොටෝ එක පිටිපස් සෙ ලියලා තියෙන නිසදැස

" ***පාට තැවරුනු හිතේ  -  මුදු හීන    පුරවන්න***
***දුකයි සතුටයි දෙකම සෙනෙ හසින් විදගන්න***
***පුරහඳ මඬල සේ මගෙ ලොව ට එළිය දෙන්න***
***තුරුලු වී පපුතුරට සදහටම මගෙ වෙන්න .......''***

කියවලා ඉවර වෙද්දි ම සිතුම් අයියා ෆොටෝ එක කාගෙද කියලා බලන්න කලින් උදුරලා ගත්තා.

" අපේ කාංචනා මිස් කිව්වා වගේ ලස්සන රස වින්දනයක් තියෙන පද පේළියක් .

"කවුද... ඔයාද හැදුවෙ ; අයියෙ මං කාටවත් කියෙන්නෙ නෑ.... කවුද හලො ඔය කෙල්ල....කියනව කො...'මගෙ ෆුල් සපෝර්ට් එක දෙනවා... කාටවත් කියන්නෙ නෑ...
පෙන්නනවකො... ඔයාගෙ මනමාලි...'

"හ්ම්... මටත් මේ කියාගන්න බැරුව ඉන්නෙ ... එහෙනම් පෙන්නන්නද ? හැබැයි තරහ වෙන්න බෑ.
"හා..හා...ඉතිං...මං මොකටද තරහා වෙන්නේ''

"එහෙනම් එන්නකො... මේ මගෙ ළගට ම දුර වැඩි කියන්න බෑ... අයියා ඔලුව පීරන ගමන් කීවේය.''
.
" ඔන්න ආවා... අනේ අගේ නැතුව පෙන්නන්නකො....'' කියලා මං සිතුම් අයියාගේ අතේ තිබ්බ photo එක කඩා ගන්න හැදුවේ උඩ පනින ගමන් .

" හා... මට පොරොන්දු වෙන්න තරහවෙන්නෑ කියලා...මම මේක කියන්න මෙයාට අවුරුදු 6 ක්

පෙරුම් පිරුවා... එයා ඔයා වගේ නෙවෙයි හරිම ලස්සන...අහිංසක... දගමල්ලක්...මං මේ අවුරුදු හයේ ම එයා ගැන නොහිතපු තප්පරයක්වත් නැති ඇති. එයා දිහා බලලා එයාගෙ හිනාව දැකලා මං ගොඩක් සතුටු වෙනවා නංගී.''

" ඇති ඇති ඔය වරුණාව...මහ ලොකු රූප රාජිණිය පෙන්නනවද නැත්තම්... මං කියන්නද නැන්දට? ''

" කෝ... එන්නකො මගෙ ළඟටම කියා කණ්ණාඩිය ඉස්සරහින් මාව තියලා ...මගේ බෙල්ල වටේට අත් දෙක දාගෙන ....වෙනදා වගේ ම මාව අන්දන්න තමයි මෙයා හදන්නෙ කියලා හිතං මම නැගිටින්න හදද්දිම අයියාගෙ ෂර්ට් එකේ මගෙ කොණ්ඩෙ පැටලුනා.''

ඒකෙන් අයියා මගෙ මූණට තවත් ලංවෙලා කියපු දෙයින් මාව අතරමං වුණා වගේ ... කකුලුත් පණ නැති උනා....

" මගෙ සුදු නංගි... ඒ වෙන කවුරුත් නෙවෙයි රත්තරං... මේ කණ්ණාඩිය ඉස්සරහ ඉන්න ඔයා පැටියො .'' මම ඒ වචන ආයෙ ආයෙ අහෙනවා වගේ මට දැනුනා.

මම දුවගෙන කාමරෙන් එළියට යන්න උවමනා වුණත් මං යන්න හදද්දි මාව නැවැත්තුවේ සිතුම් අයියගෙ ෂර්ට් එක....

" උගයි... මට රිදෙනවා... අනේ අයියෙ ඔය පැටලුම ලිහන්නකො ''මම බිම බලාගෙන කිව්වා...

"  බෑ.... දැං කොහෙද දුවන්නෙ... මෙච්චර වෙලා කියන්න... කියලාකෑ ගැහුවා... දැන් දුවන්නෙ... '' බොත්තමටත්...ඕනි ඔයාව මට  ම  පටලවලා දෙන්නනෙ ඒ නිසා ඔහේ ඉමු.

..

" අනේ... සිතුම් අයියේ...  රිදෙනවා...'' මගේ කටහඬ හැඬුම්බරයි . අයියා ඉක්මනින් පැටලුම ලිහලා මට දුවන්න නොදී මාව දෙවුරින් තදින් අල්ලාගත්තේ මං අඩන්න හදන බව දැනගෙන.

" යකො මේකිට වචනයක් කියන්න බෑ ටැප්  එක වගේ මොන  මගුලට අඬන්න හදනවද, '' සිතුම් සිතෙන් සිතුවා.

" අනේ ඉතිං ඇයි මගෙ රත්තරං අඩන්නෙ. ඔයාගෙ ඇස්වලින්  කඳුලු   එනවට මං කැමති නෑ මගෙ පැටියො...කෝ....එන්නකො.... මේ ඇදෙන් වාඩිවෙන්න... මගෙ දිහා බලන්න... කෝ... මැණික... බලන්නකො ඉතිං.''

" අපෝ... ඇස් දෙකේ කඳුළුනෙ මං අඩන්න දෙයක් කීවෙ නෑනෙ...  ඉතිං.... ඔයාගෙ හුස්මටත් මං ආදරෙයි පැටියො ... මගෙ ජීවිතේ හැමදේම ඔයා... ඔයා මට කැමතියි නේද ? මගෙ රත්තරං ....                    ඔයා නැති ජීවිතයක් ගැන මට හිතන්නවත් බෑ මගෙ මැණික.''

මගේ ඇඬීම ඉකිබිදීමක් වෙච්ච නිසා අයියා ත් අම්මාත් කාමරයට ආවේ " මේ මොකද.... ආයෙත් නෑනයි මස්සිනයි රංඩු උනාද ? ..'' කියලා අහගෙන

" සිතුම් අයියා මුකුත් නොකියා ජනේලය දිහාවට හැරුණා.''

" සිතුම්... මොකද උනේ බං ''

" මං ඔලුවෙ තිබ්බ බර නිදහස් කරගත්තා... මං ළග තිබ්බ photo එක දැක්කා මෙයා... මං ඉතිං කිව්වා බං ඒ කියපු ගමන් ම සුදුනංගි ......''

සිතුම්ගෙ වචන උගුරේ හිර වුණා... තමා මහා ලොකු වරදක් කළා කියලා සිත වද දෙන සිතුම්ට හැඩුම නවතා ගන්නට බැරි වුණා සිතුම්ට ඉබේටම ඉකිබිදුනා.

එතකොට තාත්තත් එතනට ආවේ " මොකද සිතුම් '' තාත්තා සැරවුණා

" මේ අහිංසකීව අඩවන්න මං හිතුවේ නෑ මාමේ ... මොරගෙඩි වගේ මං කියපු වචනෙට කදුළු වැටෙනකොට මට උහුලන්නෙ නෑ...''

එයා සතුටට අඩනව ද... දුකට අඩනවද... කියලා නොදැන ඔය ළමයා මොකටද අඩන්නෙ... වහෙං ඔරෝ නැතුව නංගි 10 වසරෙදි ම අයියටයි මටයි නංගි ගැන කැමැත්ත කියලා එයා වෙනුවෙන් අවුරුදු 6 ක් හිතෙන් දුක් විදපු උඹට මේකි මෙකට අකමැති

වෙන්නද. අනික ඔයාලා පුංචි කාලෙමත් ඉදං අපි එහෙම දෙයක් කතා කරගෙනමයි ඉදියෙ.

" සුදු... දැං  නිදාගන්න ගිහිං.''

තාත්තාගේ වචනෙට අපි හැමෝම එතනින් පිටවුණේ ඉබේටමයි.වෙලාව 8.30 ත් වෙලා මං තාම ඇදේ ඉදන් කල්පනා කළේ ඊයෙ උන දේ. චුටි කාලෙ ඉදලා මාව කරේ තියාගෙන..... බෙල්ලෙ එල්ලීගෙන .... එකට කාලා බීලා... ඉදපු සිතුම් අයියා එක පාරටම මෙහෙම දෙයක් ....... අනේ මන්දා...

මගෙ ඔලුවත් කැක්කුමයි මේවා හිතලම මං ලොකුවෙන්නත්  කලිං සේරමලා ලෑස්ති කරගෙන පරස්තාවක්. එක අතකට මම  සිතුම් අයියට මොනවට අකමැති වෙන්නද. මගේ හිත දෙලොවක්  අතර තනි වෙද්දි අයියා දොරට ගහනවා ඇහුණා .

" නංගී... එන්නකො... තව නිදිද ? ''  මොකද ලෙඩක්ද? මෙහෙඑනවා ගිහිං මූණ හෝදගෙන .

"අපි යං වත්ත පහළට ''

මං මූණකට හෝදං පේ වෙලා එනකලුත් අයියා පුටුව උඩ බලාගෙන ඉන්නවා.

" සිතුම් ෆුල් අප්සට් ගහලා... රෑ එළි වෙනකල් නිදි    නෑ ඇයි නැංගි ඔයා සිතුම්ට කැමති නැද්ද ?

" campus ගියත් ඔයා ගැන හිත හිතා හිටිය මිසක වෙන කෙල්ලෙක් දිහාවත් බැලුවෙ නෑ නංගී... මං වගේ ම ඔයාව මටත් වඩා හොදට උඹ බලාගනී... මට උඹව විශ්වාසයි....''

අයියා සිතුම් අයියා ගැන ප්‍රශස්තියක් කියනව වගේ කියවගෙන ගියා.

" ඕවා වැඩිහිටියොත් දන්නවා බලාපොරොත්තු උනා ඔයා ඉගනගත්ත නිසා A/L ඉවරවෙනකල් ඔයාට ඇගෙව්වෙ නෑ අපි කවුරුත් ''

" ඇයි සද්දයක් නැත්තෙ ඔයාට බෙන boy කෙනෙක් ඉන්නවද නංගි? ''

" අයියට පිස්සුද ''

" මට බයයි අයියෙ....මට ඕව තේරෙන්නෙ නෑ ''

" අනේ පිස්සි.... ඒකියන්නෙ ඔයාත් සිතුම් ටඅකමැති නෑ.''

" අයියයි තාත්තයි කියන දෙයක් මං කරනවා..''

" ඔයා මගේ කීකරු නංගියෙක් ලැබෙන්න මං පිං කරලා ඇති ගොඩක් ....අපිට ඕනි ඔයාව හැමදාම සතුටින් තියන්න පැටියො''
අයියා කිව්වේ මාව තුරුල් කරගන්න ගමන්

" තාත්තත් ඔය බලා ඉන්නේ ඔයාගෙ උත්තරේ එනකල්. දැනගත්තොත් ෂුවර් අද නම් රෑට පාටියක්

" අයියේ ... ඔයාලට මාව කරදරයක් ද? ඇයි මාව විජහට ම කාගෙහරි කරේ එල්ලන්න හදන්නෙ ''

" මොඩියේ.... ඔයාව කරදරයක් නෙමෙයි... ඒවා තමා අපේ යුතුකම් අද කාලෙ කොල්ලො අස්සෙ සිතුම්, රත්තරං නංගී .''
අයිය දිග හුස්මක් අරන් කිව්වෙ බැරෑරුම් විදියට.

" ඉන්නකො මං ඕකට කියන්න මනමාලි කැමතියි කියලා '' අයියාෆෝන් එක අතට ගද්දිම Call එකක් ආවේ සිතුම් අයියගෙ Number එකෙන් .

" අනේ ලසන්ත පුතේ සිතුම් ට ඔලුව කැක්කුමලු ඔලුව උස්සන්නෙවත් නෑ .... කෑවෙත් නෑ.... 6 ට විතර ගෙදර ආපු වෙලේ ඉදං කාමරේ' ඇවිත් බලන්න පුතේ ''
.
අම්මාට පනිවිඩේ කියපු ගමන් මට දෙහි කපන්න පටන්ගත්තේ සිතුම් අයියා ලෙඩ කළේ මං කියල මයි. අම්මයි තාත්තයි අයියයි තුන්දෙනාම car එකේ ගියේ සිතුම් අයියලෑ දිහාට මාත් ගියා.

අම්මයි නැන්දයි කුස්සියට ගියා. මාමා එක්ක තාත්තා එළියෙ කතාව. අයියා සිතුම් අයියගෙ කාමරේට ගියා .

" එහෙනම් ඉතිං මේක තමයි මගේ ගෙදර.... මං මනෝ ලෝකයක ට පිවිසුනා වගේ හරියට''

" නංගී....''  අයියා මට කතා කලා.

" මෙයාට ඇති ලෙඩක් නෑ බෙහෙත ඔයා තමයි . මං එළියට යනවා ටිකක් දාඩියයි මේකව බලාගන්නවා මං එනකල් ''
.. සිතුම් අයියා ඇත්තෙ අඩ නින්දේ වෙන්න ඕනි .

" සිතුම් අයියේ.... අයියට අමාරුද? ඔලුව ගොඩක් රිදෙනවද අයියේ

හ්ම්.....

" ඔයා මාත් එක්ක තරහද ? මං නිසානෙ ඔයා ලෙඩවුනේ කියල අම්මා බනිනවා මට ''

" හ්ම්....''

" මොකද අනේ හ්ම්... හ්ම්... ගාන්නෙ ''

" තරහයි මං ''

" ඒ මොකද , මාව ලෙඩ කළාට''

" මං මොකක්ද කළේ ඔයා ලෙඩවෙන්න ''

"  මම කැමත්ත අහපු ගමන් ටැප් එක අරිද්දි මං හිතුවා වෙන කොල්ලෙක් set කරං ඇති කියලා ''

"  මට මර විසේ ගහලා නෑ කොල්ලො සෙට් කරගන්න.''

" හ්ම්... හ්ම්... දැං ලෙඩ වුණ මාව තව ලෙඩ කරනවද බැනලා ''කෙදිරි ගානවා වගේ සිතුම් අයියා කිව්වා...

"  යාලු කරගන්න ඕනි නැද්ද ?''

" ඕනි..... sorry.....ඉතිං...මට බය හිතුනා...''

"  sorry විතරක් බෑ ''

"  එහෙනම් ''

"  ඔලුව අතගාන්නකො පැටියො රිදෙනවා '' සිතුම් අයියා ලෙන්ගතුව  කියද්දී මට ලෝබ හිතුනා.

" හ්ම්.... තාම කෑවෙ නෑ නේද ? පැනඩෝල් දෙකක්වත් බොමු ''

" මාව බලාගන්න කෙනෙක් ඉන්නව නම් මෙහෙම මාව ලෙඩ වෙන්නෑනෙ. බත් කවනවා නම් කනවා මං ''

" මුගෙ කපටි කම.... හොර ලෙඩද කොහේ ''

" බත් කාලම ඔලුව අතගාන්නම්කො බෙහෙත් බීලා ටිකක් නිදාගන්නකො''

" හැමදාම මාව ඔහොම ආදරෙන් බලාගන්නවද, ''

" සිතුම් අයියා මගේ අත් දෙකින් ම අල්ලගෙන අහද්දී මට ඔව්.....''

කියලා නොකියා ඉන්න බැරි උනා. එයාව මග හරින්නට මං කුස්සියට දිව්වේ බත් බෙදාගෙන එන්න කියලා.

නැන්දා ඇවිත් මං සිප අතගාන්නට පටන්ගත්තේ අපෙ අම්මාගෙ කේලම අහලා වෙන්නඇති.

" වාසනාවව මගෙ ගෙට ගොඩවෙනවා එහෙනම් '' නැන්දා නෙතග රැදි කදුළු බිදක් පිහින ගමන් කිව්වා .මම ලැජ්ජාවෙන් හිනා වුනා.

" පව්... මං බොරුවට බය උනේ නංගි වෙන එකෙක් ව සෙට් කරං කියලාමයි මට හිතුනෙ.... මලක් වගේ හැදුන අහිංසකීනෙ ඉතිං .. මං කවදාහරි බැන්දත් මං ආදරේ නෙතූගෙ දගකාර කමට තමයි. හැමදේම හොදින් උන එක ගැන සිතමින් සිතුම් ඔහේ කල්පනා කරේ දැන් මොකද කරන්න තියෙන්නෙ  කියලා...'' එතකොටම නෙතූ බත් එකත් අරං කාමරේට ආවේ " අයියේ... මං එන්නද...''අහගෙන.

" දැං ඉතිං මේකට එන්න කාගෙන්වත් අවසර ඕනි නෑ.. මේක ඔයාගෙත් කාමරේ....''

" ආ... එහෙම වෙන්න මං ඔයාව බැන්දෙ නෑනෙ ''

"ඇයි බදින්න නෙවෙයිද දැං... කැමති උනේ මට... ''

යකෝ මේකට මල් සරා දුන්නෙ තියෙන සේරම හී ටික එකපාර විදලා වගේ සිතින් තමාට ම කියාගත්ත නෙතූ.

" බදින්න ඕනි ගස්....කියලා සිතුම් ට නෑහෙන්න කිව්වා.

කැමති වුනාට කැම්පස් ගිහිං වෙන අය සෙට් කරගනී ද දන්නෙ.නෑ. සිතුම් ට නිරායාසයෙන් ම සිතුනා.

" නංගී.... මට පොරොන්දු වෙන්න මගෙ රත්තරං මාව කවදාවත්දාලා යන්නේ නෑ කියලා... මොන දේ උනත්...'' වෙනස් වෙන්නෙනෑ කියලා....''

" ඔයාට විකාර ද අයියේ...... හැබැයි අයියෙ මං ඔය ලව් ගැනනන් දන්නෙ නෑ.... මං හිතාගෙන ඉදියේ ඒක ගොඩක් ලොකු වරදක් කියලා.... අයියා කියපු නිසා තමයි මං ඔයාට කැමති උනේ... මං දන්නවා එයා හැමදාම හිතන්නෙ මට හොද වෙන දෙයක් කියලා. ''

අපේ නංගිත් එක්ක බැලුව ම නෙතූ කියන්නේ අදහන්න වටින කෙල්ලෙක් .අපේ එකීට එකක් කීවොත් දහයක් කියනවා.
" කවදාහරි අයියා කියපු නිසා මට කැමති උන ඔයාට.... ඔයාගෙ හිතම මගෙ ආදරේ ගැන හොයන ඉල්ලන තරමට ම පැලෙන්න ආදරේ වෙන්නම්කො '' මං .සිතුම් ම හිතාගත්තා.

" ඇයි ඔයා මට ආදරේ නැතුව ද කැමති උනේ...''

" නෑ සිතුම් අයියෙ.... මං අද නෙමෙයි හැමදාම ඔයාටයි අපෙ අයියටයි දෙන්නට ම ගොඩක් ආදරෙයි. ''

" ඒ ආදරේ නෙමෙයි  මේ පැටියො.... ඒ උනාට කමක් නෑ මං ඔයා හදලා ගන්නම්කො... ඔයා ඔය විදියටම

ඉන්න මැණික....ඔයාගෙ දග  වැඩවලට තමා මං කැමති ''

කාංචනා මිස් ජීවිතේ ගැන කියලු දේවල් මට ඉබේටම මතක් උනා.

" කාවහරි තෝරගත්තොත් ඔයා එයාගෙ විදියට වෙනස් වෙන්න.නැත්තම් දෙන්නා දෙවිදියට හිතුවොත් තමයි බැදීම් ලිහෙන්නෙ අනික දකින දකින පස්සෙන් එන එන කෙනාට කැමති උනොත්
ලොකු වෙද්දි නිකං ම නොවැදගත් චරිතයක් කියලා කැළැල් හිටිනවා නෙතූ. ''

මට දිග හුස්මක් පිටවුණා.

" ඇයි නෙතූ....'' සිතුම් අයියා ඇහුවෙ බයෙන් වගේ.

" නෑ අයියෙ... අපේ මිස් කිව්වේ කවදහරි කෙනෙක් ව තෝරගත්තොත් එයා කැමති අකමැති දේ අනුව මගෙ ජීවිතේ වෙනස් කරගන්න කියලා... ඉතිං... ඔයා මගෙ මොනවටද අකමැති අයියෙ...''

" එපා... එපා... පැටියො. මං කැමති මගෙ මේ ඉන්න දගකාර කටකාර හුරතෙලේට ඉන්න ඔයාට... ඔයා මං මැරෙන කල් ම ඔයවිදියටම ඉන්න රත්තරං''

" ආ.... මේ පැනඩෝල් දෙක බීල නිදාගන්න... මං එළියට යන්නං නැත්තම් රෑටත් උණ වැඩිවෙයි.''

***ඇස් දෙක පියාන නිදාගන්න මට බෑ.***
***බෑ..... බෑ.....***
***මට නිදන්න බෑ.....***
***සිත තුළ දගලන මනසේ අයදින***
***ඔබ මට නිදන්න දෙන්නෙම නෑ***
***හිත එක් තැන් කර මා නිදන්න හැදුවත්***
***එයටත් ඔබ ඉඩ දෙන්නෙම නෑ.......***

සිංදුව කියන ගමන් මං ගාවට ඇවිත් මගෙ අත්දෙකෙන් අල්ලගත්ත සිතුම් අයියා හිනාවුනා.

" බුදු අම්මෙ.... මට නම් මෙයත් එක්ක කාමරේ ඉන්ත් බයයි... මං යනවා එළියට...'' කියමින් මං දුවන්න හදද්දී මගෙඅතින් අල්ලගත්ත සිතුම් අයියා

" දෙනවා දෙකක් '' කියමින් අත උස්සලා... ආදරෙන් මගෙ ඔලුව  අතගෑවේ " පිස්සු කෙල්ල... මං ආදරෙයි ඔයා  ගෙ ඔය කතාවලට...'' කියලා .

" මං හිතුවෙ මට ගහන්න හැදුවා කියලා. ''

" පිස්සුද මැණික... මේ අත් දෙක ගැලෙව්වත් ඔයාට කවදාවත් ඉස්සෙන්නෙ නෑ... ''

" එන්නකො ටිකක් අනේ ළගට...අවුරුදු ගානක් ඈත ඉදං බලං ඉදියා මිසක ළගටවත් ගන්න උනේ නැනෙ...''

" නැත්තෙ මොකද.... ආපු වෙලාවෙ ඉදං මගෙ කරේ එල්ලිලානෙ ඉදියෙ ගෙදර දි... කවුද දන්නෙ මනමාල

කමට කියලා.දන්නවනම් එන්න දෙන්නෙ නෑ මං ළඟටවත් .''

" ආ...... ඇත්තද මැඩම් ඉන්නවකො එහෙනම් මං කරන්නවැඩක් කියලා මාව හුස්ම ගන්න බැරිකමට ම හයියෙන් තුරුල්කර ගත්තෙ මට ආදරේ දැයි කණට කොඳුරන ගමන් .''

.

" ඒකනෙ ඉතිං දැන් මෙහෙම ඉන්නෙ... නැත්තම් මං පලනව ඔලුව..... අතාරින්නකො බඩුවක් කියන්න.... මං මෙහෙම පිරිමියක් ළඟට තුරුල්වෙලා ඉදියෙ මගෙ අයියා ළඟ... ඒ දැනුණ රැකවරණෙ ම මට ඔයාගෙන් දැනෙනවා.... බයක්හිතෙන්නෙ නෑ සිතුම් අයියෙ...''

" ඒක තමයි රත්තරං ආදරේ කියන්නෙ '' සිතුම් මගේ නළල සිපගත්තෙ අදරේනි...

" දැන් යන්න නැත්තම් මට පිස්සු හදලා තමයි නවතින්නෙ ''සිතුම් නෙතුව අතෑරියෙ ලෝබකමින්...

" පිස්සන්ව තමා අංගොඩ මානසික රෝහලට... ගිහිං දාලා එන්න බැරියැ කියමින් නෙතු දිව්වා.

7

"නංගී... නංගී... result ඇවිත්. ඔයාට A3 යි."

අයියා සතුටින් කෑ ගහගෙන මගෙ කාමරේට එද්දි මං හොඳටම නිදි.

" යකෝ 9 ටත් වෙලා මේකි තාම නිදි '' ලසන්තට තරහක් හිතුන ද පොඩි එකෙකු වගේ නිදාගෙන ඉන්න තම එකම නැගණිය ය ඇහැරවන්නට ඔහුට සිතුණේ නැත.

පුතා උදේම ඇවිත් නෙ නොකියම.

" ලබන මාසෙ ඉදං නුවර hospital එකේ වැඩ අම්මෙ.මොකද නංගී තව නිදි අම්මෙ . දැන් මේ මාසෙ ම ගෙදර ඉතිං ''

" ඇග රිදෙනවා කිය කිය ඉදියෙ ඊයෙ රෑත් දොළහ විතර වෙනකල් පොතක් කියව කියවා ඉදියෙ. ''

"යංකෝ බලන්න"

" නෙතූ... නෙතූ... මේ අයියත් ඇවිත් නැගිටනවකො .'' අම්ම කෑගැහුවා.

ලසන්ත ඇඳුම්වත් මාරු කරන්නැතුව නංගිගෙ කාමරේට ගියේ වෙනදා මං ආව කිව්ව ම උඩ පැනගෙන එන කෙලල් අද මොකද අනීපයක් ද කියා සිතමින්. මං ගෙදර නැත්නම් සිතුම් වැඩිය ගෙදර ඇවිත් රෑ දෙන්නෙත් නැත්තෙ ඒක නංගිට හොදනෑ කියල.

"නංගී... කියා නෙතුගෙ ඔලුවට අත තියද්දී අත පිච්චෙන තරමට ම ඇගෙ හිස රස්නෙය.

" දෙයියනේ... මේ කෙල්ලට හොදටම උණ අම්මේ.'' අම්මෙ උණකටුව ගේන්නකො බත් ටිකකුත් බෙදං එන්න .
" අයියේ.... මගෙ මුලු ඇගම රිදෙනවා ඔලුව පැලෙන්න වගේ...''
නෙතූ කියපු දේ රහසක් වගේ.

" ඔව් පැටියො... අයියා ඉන්නවා අපි බත් කාලා බෙහෙත් පෙත්තක් බොමුකො. කෝ නැගිටලා ඉදගන්න.''

" මං නැගිටින්න වෙරදැරුවද නැගිටින්න බෑ ඇග වෙව්ලනවා වගේ මට දැනුණා.''

" අම්මෙ නැංගිට සැහැල්ලු ඇදුමක් දාලා කිහිලි නළල එහෙම තෙත කරන්න. මං සිතුමට කතාකරන්නම්.''

වත්තට ගිය ගුණවර්ධන බාසුන්නැහෑ දුවගෙන ගෙදර ආවේ තම දියණියගෙන් ප්‍රතිඵල අහලා දැනගන්න.

කොල්ලා නම් ගොඩ ගියා.කෙල්ලත් එහෙම ම ඇති දහසක් බලාපොරොත්තු හිතට එද්දි ඔහු "නෙතූ....'' කියාගෙන ගෙට ගොඩවෙන කොටත් රමණී තම දියණිය වත්තම් කරගෙන සාලෙට රැගෙන ආවා.

ගුණවර්ධන මහතාගේ පපුව ඩිග්...ඩිග්... ගාන්නට උනේ "මේ මොකද දෙයියනේ '' කියාගෙනය.

පතාක යෝද්දයෙකු වගේ ශක්තිමත් තම පියාගේ සිත වෙඩරු පිඩක් වගේ කියලා දන්නා ලසන්ත.

" නංගිට ටිකක් උණ වැඩි වගේ තාත්තෙ අපි Hospital යං ''

" උඹ දොස්තරනෙ මේ කෙල්ලව තනියෙන් ඕවෑ දාලා ඇහැකේ. උඹ බෙහෙත් දියංකො.'' තාත්තාගෙ ඇස්වල් කදුළු නලියනවා
ලසන්ත දැක්කා.

" නංගිට හෙට අඩුවෙයි තාත්තෙ අන්න සිතුම් ආවා''
" ලසන්ත මොකද බං නෙතූට... කෝ '' කියමින් ගෙට ගොඩඋනසිතුම් නෙතූව දැකලා. ඇස් ලොකු උණා.

" අනේ ඇයි මැණික... ඊයෙ හවසත් ගෙදර ෆෝන් එකට කතා....මං කතාකරද්දි හොදට ඉදියනෙ....''

" හරි හරි බං....අඩුවෙයි....එහෙම තමා ලෙඩ... අපි නුවරhospital එකට එක්ක යමු... නංගී. වතුර

උගුරක්වත් බොන්නේ නෑ ඇග පණ නෑ වගේ
වෙව්ලනවලු ''
" නෑ...නෑ... ආර්යා එකට යං මට බෑ නෙතුව
ඉස්පිරිතාලෙ තනියෙන් දාලා එන්න බං...''

" ඒකතමා පුතේ මාත් කිව්වේ '' ගුණවර්ධන
බඳුන්නැහැ ද කතාව
ට එකතු වුණා.

" හා...හා.. යමං උඹ සරම පිටිං දුවලනෙ'' අර මගෙ
ෂෝට්ක් දාගනිං." ඔය කමක් නෑ උඹ වාහනේ
ගනිංකෝ නෙතුට කෙදිරි ගෑවෙන්නේ
නොදැනුවත්මයි. රමණී දියණියගෙ ඔලුව
අතගාමින් සිටීහ " බඩු ටික මෙච්චරද නැන්දේ ''

" ඔහොම බෑ මං නෙතුව ගන්නං කියමින් සිතුම්
නෙතුව උස්සගෙන ඇවිත් කාරෙකින් ඉන්දව ගත්තේ
නෙතග පිරි කදුළු '' පිහින ගමන්.

ආර්යා රෝහල සුපිරි රෝහලක් වන අතර ලසන්තගේ
හිතවත් ඩොක්ටර්ලාද එතන ඇත.ලසන්ත නෙතුව
කවදාවත් රෝහලේ නතර කරන්නට අකැමති කෙනා
අද නෙතුව ඇඩ්මිට් කලේකුමක් හෝ දෙයක් දන්න
හින්දා විය යුතුය.

සරමක් ඇදගෙන ගෙයින් පිටතට නොඑන සිතුම්
පරණ සරම් කෑල්ලක් ඇදගෙන ආර්යා රෝහලේ ඔබ
මොව ඇවිද්දේ රමණී නැන්දා අසල හිටගෙනයි.

"ලසන්ත මොකද blood report එක''

ලසන්තට එළියට එන්නවත් නොදී සිතුම් අහද්දී ඔහුව මව ළගිං ඉවතට රැගෙන ගිය ලසන්ත, " නෙතුට ඩෙංගු වගේ බං'' කියන
කොට සිතුම් ට උන්හිටි තැන් අමතක වුනා.

සට සට ගා කදුළු පෙරද්දී ඔහු වාහනෙන් ගෙනාපු බඩු ටික නෙතු නවතා ඇති කාමරයට රැගෙන ගියේ බිම බලාගෙනය.

" නංගී නවත්තනවා කිව්වා අම්මෙ. ලොකු අමාරුවක් නෑලු හෙට හවස යතහැකි ලු යං අම්මා ගෙදර යං තාත්තා බයවෙලා ඇති.''

" නංගී තනියෙන්නෙ පුතේ ''

" සිතුම් ඉන්නවනෙ අම්මෙ මැස්සෙක්වත් වහන්නනොදී පරිස්සමට බලාගනී අපට වඩා.''

" අම්මාව ගෙදරට දාලා මං එන්නම් උඹටත් ෂෝටක් ගේන්නම්.''

ලසන්ත කියපු දේ සිතුම්ට ඇහුනෙවත් නැත. සිතුම්ව තේරුම්ගත් ලසන්ත ඔහුගේ පිටට තට්ටුවක් දැමුවාම සිතුම් හැරිලා බැලුවේ එතකොට.

" මං අම්මව දාලා එන්නම්... නංගිට උඹේ ඔය බයවෙලා ඉන්න මූණ පෙන්නන්නෙපා හිනාවෙලා කතා කරපං සෙම වැඩිවෙලා කියපං ඇහුවොත්.''

" මට බයයි ලසන්ත නෙතූට ඉක්මනට අඩුවෙයි නේද,ඩෙංගුවලට බය උනේ ඉස්සර බං. rest කලාම ඕක අඩුවෙයි උඹ ගැම්මෙන් ඉදහං මං ඉන්නවනෙ ''

අයියේ.... නෙතූ කෙදිරිගෑවේ අමාරුවෙනි. සේලයින් දීලා  තියෙන්නේ.... මහන්සි නොකර නිදාගනම ඉන්න දියං.

" අනේ මට මේකි දිහා බලා ඉන්න බෑ බං. කටර් එක වගේකියවන කෙල්ල පරවෙලා වගේ. කතාකර ගන්නත් බෑ.''

සිතුම්ගේ සිතට මහ අමුතු බයක් දැනුනේ කවදාවත් නෙතූ අසනීපෙන් ඉන්නවා දැකලා නැති නිසා.

වෛද්‍යවරයෙකු නිසා මේවා සාමාන්‍ය විදියට හිතන ලසන්තතමන්ගේ නැංගි ගැන සිතුම් ට තියෙන ආදරේ ගැන නිහඬව මසතුටු වුණා.

" නෙතූ... ඇයි මෙගෙ රත්තරං... තාමත් ඔලුව රිදෙනවද?...''නෙතූ ඇහැරුන ගමන් සිතුම් ඇහුවේ ඇය දෙස බලන්නට බැරි
තරම් දුකින්.

" සිතුම් අයියේ... මට මොකක් කීවද......''

" hospital එකේ මැණික ඔයාට උණ හැදිලනෙ. ටෙස්ට් ටිකක් කරගෙන හවස යමු ''

" සිතුම් අයියේ... මට ගොඩක් බඩගිනි...අයියේ ...ඒ උනාට ඔලුව උස්සගන්නත් බෑ කැරකෙනවා වගේ.''

" මොනවාද මගෙ මැණික ඔයාට කන්න හිතෙන්නෙ.සුප් ටිකක්... බත් ටිකක්... ''

" එපා අයියේ... මට තෝසෙ දෙකක් ගෙනත් දෙන්න පුලුවන්ද?....''

" මං විනාඩියෙන් එන්නම්... ඇඳෙන් බිමට බහින්නෙවත් නෑ හොඳද ? ඔහොමම ඉන්න...'' කියලා සිතුම් තමාට පුලුවන්තරම් වේගයෙන් දුවලා ගිහිං විනාඩි පහක් යන්නට කලිං ආයෙ නෙ තූ ගාවට ආවා.

සිතුම් යනකොටත් කාමරේ සේලයින් මාරු කරමින් සිටි හෙදිය..." ඔයා ඉගිලුනාදැයි ' සිතුම්ගෙන් ඇසුවාය.

ඇයට සිනාවෙන් සංග්‍රහ කළ සිතුම් අතසෝදන් නෙතූට කවන්නට ඇයව උස් කොට ඇද විට්ටමට ඔලුව තබා වාඩිකළේ මවක් තම කිරි දරුවා වඩාගන්නා සේ හෙමින් සීරුවේය. සිතුම් අයියා ආදරෙන් පොඩි එකෙක්ට වගේ කවන කොට නෙතූට අහක දැමිය නොහැකි විය.

" දැං තමා අයියෙ ඇඟ වෙව්ලන එක අඩු උනේ මට ඇඟට කවදාවත් නැති අමාරුවක් දැනෙනවා සිතුම් අයියේ...''

ලසන්ත ආවෙ නංගිට කෙසේ හෝ කෑමක් බඩට දාගතහොත් ඉක්මනින් උණ බහින නිසා තරවටු කර හෝ ඇයට කටක් දෙකක් කවා ගැනීමට සිතාගෙනයි.

" සිතුමා... ඔය සරම ගලවලා මේ ෂෝට් දාගෙන ගෙදර පලයං මං ඉන්නම් දැන්. නැන්දලා අපේ ගෙදර මෙයාට බොන ජාති වැඩිපුර දෙන්න ඕනි... අම්මලා හදන සුප් එක අරං වරෙං ''

" කමක් නෑ බං මං ඉන්නම් උඹ පලයං.....දැන් නැගිටලාතොසෙ ඉල්ලුවා. මං ගිහිං ගෙනත් කැව්වා. පව්......

" උඹ ඔහොම ද ටවුමට ගියේ.

"නැතුව හෙලුවෙං යන්නද බං... කුනු හරප කතා කරනවා මං දෙලොව රත්වෙලා ඉද්දි. ''

" මං vp ව හම්බෙලා ආවෙ ඩෙංගු නෙමෙයි කීවා ඒ වගේ virusඋණක් ලු. Blood count එක බහිනවලු මෙයාගේ ගොඩක්ම බැහැලා නෑ හිමොග්ලොබින් පොඩ්ඩක් අඩුයි එච්චරයි. නොකාපු අමාරුවට ඇගට පණ නැත්තෙ.

අම්මා එක්ක තරහ වෙලා ඊයේ උදේ ඉදං කාලත් නෑ..''

" ඒ ඇයි....''

" තිනෙත්ලගෙ ගෙදර යන්න යාලුවො සෙට් වෙලා ජොලියට මෙයා යන්න අහුවම අම්මා එපා කීවලු. අයියයි සිතු  අයියයි ආවට පස්සෙ ඕනෙ එකක් කීවලු.''

" ගෙදර ෆෝන් එකකින් සල්ලි තිබිලා නෑ මල පැනලා කාමරේට ගිය පිම්ම තමා ඔය.''

ඉතිං අපෙන් අහන්න ඕනියැ කෙල්ලට යන්න දුන්න නම් ඉවරනෙ පව් අහිංසකී.

" නෙතූට ෆෝන් එකක් අරන් දෙන්න ඕනි බං. මං එදා බලලත් ආවෙ . හැමදාම ඉතිං ගෙදරට ඇවිත් බලලා විනාඩි 5 කට හරි කතා කරල යනවනෙ ෆෝන් වලට සල්ලි නාස්ති කරන්නෙපා අයියෙ කීවානෙ...

" දැං තමා හිත නිදහස් උනේ ලසන්ත... මං බයේ ඉදියෙ මගෙ කෙල්ලට අමාරු වෙයිද කියලා.

" නෑ බං අද හවසත් ලේ එක බලලා ගෙදර ගෙනිහිං පරිස්සමට බලාගමු... ඕකි ගෙදරින් පිට ඔය ඉදිය මයි... බය ඇති...''

# 8

මං hospital එකෙන් ඩිස්චාර්ජ් වෙලා ඇවිත් දවස් දෙකකුත් උනා. උදේ ඉදං රෑ වෙනකල් ම මං එක්ක ඉදලා ඉදලා රෑවෙලා තමයි සිතුම් අයියත් ගෙදර යන්නෙ.

" පව් අහිංසකයා.... අලුත් බිස්නස් එකක් පටන්ගන්න ඉහටත් උඩින් වැඩ තියෙද්දි මෙහෙ මට තනි රකිනවා...අයියගෙ වචනයට මං සිතුම් අයියට කැමති උනාට මටත් දැං එයා ගැන තියෙන්නෙ වචනෙන් කියන්න බැරි තරම් ආදරයක්...මං ගැන මෙච්චර හිතන කෙනෙක්... අනික හැමදාම මං ගෙදර ඉදියා වගේ මං මං වගේම ඉන්නවට කැමති කෙනෙක්...බැන්දා කියලා මට වෙනස් වෙන්න ඕනි කියලා නොහිතන කෙනෙක්.සේරට ම වඩා මං කියන දේ අහන... මට තහංචි දාලා නැති...මගේ ගෙදරට ලැදි කෙනෙක් ''

මගෙ හිත අස්සේ මොකක්දෝ විශේෂයක් සිතුම් අයියා ගැන තිබුණ අතරෙ හිතට ආපු සිතුවිලි එක්ක මං ඇදෙන් හේත්තු වෙලා ඉදගත්තෙ මං බැහැලා ඇවිදින්න ගියොත් අයියලාට තරහ යයි ඊට වඩා දුක හිතෙයි කියලා. කල්පනා ලෝකෙ
තනිවෙච්ච මට ඉබේටම දෙනෙත් පිය වුණා...

" අඩෝ නෙතු.... උඹ සෙන්ට්‍රල් ගිය දවසෙ ඉදං ජේන්න නෑ... Call... නෑ... සෙට් බහින්නෙ නෑ....උඹට අපිව අමතක උනාට අපිට උඹව අමතක නෑ... වරෙං යකෝ එළියට ... අපි මේ ගමේ ඉස්කෝලෙ ගැස්ටො...ආ...''

තිනෙත් හිනාවෙවී කියවගෙන යනකොට එළියට ගියේ නෙතුගෙ...අම්මා.

" ආ චංඩි ටික එන්න ඇතුළට ''

" කෝ... නැන්දෙ... මං අර කටුස්සිව අවුස්සන්න හිතල, කෑ ගැහුවෙ ... ඕකිට තදවෙනවනෙ...''

" අනේ පුතේ නෙතුට උණ හැදිලා හොදටම එදා

ඔයාලෑ ගෙදර යන්න බැරි උනෙත් ඒකයි.
ඉස්පිරිතාලෙත් ඉදියා.ඩෙංගු වගේ ම වෛරස් එකක් ලු
ඇදෙන්වත් බහින්නෙපා කීවා
දවස් හතරක් විතර යනකල්.''

" නිදිද නැන්දේ... පව් දෙයියනේ... දවසක්

මට මග දි හම්බෙලා ඇඩුවා... ටවුමෙ ඉස්කෝලෙ ගමේ වගේ  නෑ එපා වෙනවා... යන්න ඕනිවට යනවා... මට පාලුයි බැං... ඒ පැත්තෙ වරෙං කියලා '' චලක්ෂණා කීවේ දුකින්.

" ටියුෂන් එකකටත් ඒ ඉස්කෝලෙන් යන්න නොදී හවස පංති තියන හන්දා අපට ටියුෂන්වල වත් හම් බුණේ නැනෙ. නෙතූ  ගෙදර එද්දිත් 6.30 හත උනානෙ. A/L වලින් පස්සෙ අපි නාවල  නතරවෙලා course එකට යං කීවට අම්මා තාත්තා දාලා යන්න බෑ කීවා. අපි සේරම ගියා ඒකි තනි උනා. result ආපු නිසා ඉස්කෝලෙටවත් නාවට අපි මේ ආවෙ නැන්දේ. මේකි අතේ ෆෝන් එකක් වත් නෑනෙ. ඒත් academy එකේ දී අපිටත් ෆෝන් බෑනෙ . පව්... හිරේ දැම්මා වැගේ එපා වෙලා ඉන්නැති...''

හෂානි කීවේ නෙතූ ගැන උපන් අනුකම්පාවෙන්.

" යමං බලන්න...''
" යකෝ කෙල්ලන්ගෙ කාමරවලට ඔහොම රිංගන්නෑ යොව්දු.... ඉදපං මං යනකල්.''

" පලයංකො ඉතිං ඔතන තප්පලං ගහං ඉන්නෙ පිටිමුට්ටෙ  වගේ''

සෙට් එකම ඉස්සරකරගෙන නෙතූගෙ කාමරේට එබෙද්දි  නෙතූට හොදටම නින්ද ගිහිං.

" පව්... බං . අපි ටිකක් ඉමු ඕකි ඇහැරෙනකල් දවල්ට නිදාගන්න කැමති නෑ මේකි... අමාරු නිසා ම වෙන්නැති.''

තිසරි කට්ටියට කීවේ කටට ඇඟිල්ල තියන ගමන්.

" පුතේ... එන්න බීම ටිකක් බොමු ''

" අනේ නැන්දා බීමත් හැදුවද...''

" කෝ නැන්දෙ අපේ දොස්තර මහත්තයා.''

සුරාජ් වට පිට බල බල අහද්දි භවානිට හිනහා ගියෙ ඉබේට ම.

" ලසන්ත පුතයි සිතුම් පුතයි දෙන්නම කොහෙද ගියා පුතේ දැං එයි.''

" ආ.... කියනකොට ම ආවද කොහේ...''කියමින් නෙතූගෙ අම්මා කුස්සියට ගියෙ අපට නෙතූ ඇහැරෙන කල් බලන්න ෆොටෝ ඇල්බම් එක දෙන ගමන්.

" නෙතූ.... නෙතූ.... පැටියො ඔයා නිදිද?... බලන්නකො මං ඔයාට ගෙනාවෙ මොනවද කියලා.....'' කියමින් සිතුම් නෙතූගෙ කාමරේට එබෙනකොට තමයි ඇවිත් ඉන්න කට්ටිය දැක්කෙ.

" ආ... දැන් ද ආවෙ සෙට් එක.... මං හිතුවා අපේ නෙතූව ඔයාලට අමතක වෙලා කියලා....''

" අපිට නම් එයාව අමතක වෙන්නෙ නෑ...එහෙම... හැබැයි අලුත් අය නිසා එයාට නම් අපිව අමතක වෙලා

ද දන්නෑ... අපිවෙනුවට තව තව අය ලං වෙලාද මංද,''
තිසරි ගත්කටටම  කිව්වෙ හිනාවෙවී.

" අපේ එක්කෙනාටත් එයාගෙ වගේ ම කටවල් ටිකක් තමයි හම්බෙලා තියෙන්නෙ. කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ...''

" ඒකනෙමෙයි තේ ටිකක් බිව්වද මල්ලි... නෙතූගෙ වැඩේ ම ඔයාලා ගැන ම තමා කතාව.... එයා හිතං ඉදියෙ එයාවිතරක් ටවුමෙ ඉස්කෝලෙ ඔයලා set එකම එයාව හලලා  කියලා ඔයාලා දැක්කම එයාට ගොඩක් සතුටු හිතෙයි

අතේ බරට බරේ එල්ලගෙන ආපු පළතුරු ටිකයි .... නෙතූට කියලා ගත්තු touch Phone එකයි මේසෙ උඩින් තියන ගමන් සිතුම් කිව්වා.

නෙතූගෙ ඇද උඩින් ඉදගත්ත සිතුම් ඇගෙ ඔලුව ආදරෙන් අතගෑවා....

" නෙතූ... ඇයි ඔලුවවත් කැකුමද....''

" නෑ... අයියේ... මට කම්මැලියි ... ලොකු නිදිමතක් ආවා...''නෙතූ ඇස් දෙක අරින්නෙවත් නැතිව මිමිණුවා.

" ඔයා මං හිංදා ගොඩක් අරදර වෙනවා නේද සිතුම් අයියේ...ඒ උනාට අයියයි ඔයයි දෙන්නම ගෙදර නැතුවම මට පිස්සු වගේ ... ආයේ නම් මාව තනියම දාලා කොහේවත් යන්න එපා   සිතුම් අයියේ...''

හිතේ තිබුණු සිතුම් අත තම කම්බුලට  කරගන්න ගමන් දෑස් පියාගෙන ම කිව්වෙ හුරතලේට පොඩි එකෙක් වගේ.

කටත් ඇරගෙන මේ පෙම් පලහිලව්ව බලාගෙන හිටපු තිනෙත්ට " ඒකත් ජයසිරි මංගලම්... '' කියල , කියවුනේ මුකුත් නොකියා ඉන්න බැරුව කට නලියන හින්දා.ඒ සද්දෙට සිතුම්ගෙ අතත් ගසා ගෙන නෙතූ බයවෙලා වගේ  ඇදෙන් ඉදගත්තා.

" යකෝ මේකිට කොල්ලො අරහං වෙලා ඉදලා දැන් රත්තරං කිලෝ ගනන් ද මන්දා.''

" නෑ බං ඉතිං නෑනා මස්සිනානෙ ''
භවානි කිව්වේ චලක්ෂණා ගේ අත කොනිත්තන ගමන් .

" සිතුම් අයියට අපේ ඉස්කෝලෙ ඉද්දි පිස්සු වැටිලා වගෙ ඉදියෙ කාලෙ මෙයා උභව ගනන් ගත්තෙවත් නැත්තෙ එහෙනම්  නෑනා පොඩ්ඩ හින්දද?''

" කැම්පස් එකේ ඉදියෙම නැද්ද සිතුම් අයියෙ කෙල්ලෝ.... මේ  අපායට ගහපු පෝස්ටරේ ම සෙට් කරගත්තෙ.''

අනේ... හරි ලස්සන සපුමල් කුමාරයනෙ උඹෙ... දත් ටික  මදින්නෙ වත් නෑ හිරමනෙ වගේ දික් කරගෙන එනවා... මගෙ ලස්සන ගෙන හොයන්න... පලයං යන්න උලම... නෙතූ  තිනෙත්ව තල්ලු කරන ගමන් කීවා. මේකිට ඇති ලෙඩක් නෑ  බං.

වැඩිය කතාබහ නැති සදරුවනුත් කතාවට බැස්සෙ මං අරුම පුදුම දෙයක් කළා වගේ.

" එහෙනම් අද අපට රෑ නෙතූ ගානෙ පාටියක් නෙතූගෙ කුළුදුල් ප්‍රේම පුරාණය....'' භවානි කිව්වෙ නෙතූව බදාගන්න ගමන්.

" හා... හා... අහන්නෙ නැතුව දැන් බෑ..'' තිසරි කියද්දී සිතුම් නෙතූගෙ ඔලුව අත ගෑවා.

" මං ඔයාට පොඩි ගිෆ්ට් එකක් ගෙනාවා... යාලුවො එක්ක බලන්නකෝ... අද මං ඕනි නෑ නෙ ඉතිං යාලුවො ඉන්නවනෙ.'' කියාගෙන බොරු තරහක් පෙන්නලා වගේ සිතුම් ඇදෙන් නැගිට්ටෙ මේ කට්ටියට කන්න දෙයක් set කරන්න නැන්දට Help එකක් දෙන්න.

එකපාරටම කවදාවත් නැතුව නෙතූ සිතුම්ගෙ අතේඑල්ලුනෙ " ඒකට කමක් නෑ...දැන්ම ගෙදර යන්න එපා  මස්සිනා කියගෙන"

 නෑ... පැටියො ... මං ඔයාලට දෝසියක් දාගෙන එන්න යන්න හැදුවෙ.... එහෙනම්...මට ආදරේකුත් තියෙනවා නේද?... කියලා සිතුම් කාමරෙන් එළියට යන්න  හම්බුනේ නෑ කට්ටිය නෙතූව වට කරගෙන කුචි කවන්න ගත්තෙ

" උඹ අපිට කීවෙත් නෑ... සිතුමව අල්ලගත්තා නේද? ...කිය කියා.

" නෑ... බං... අම්මලා අයියලත් දන්නවා... මං 10 ඉද්දියෙ ම ගෙදරට කියලා මං A/L ඉවරවෙනකල් කවුරුත් මට කීවෙ නෑ.අයියා කිව්ව නිසා හා කිව්වට... දැන් නම් මටත් සිතුම් අයියගෙන් තොර ලොවක් නෑ වගේ... ලෙඩ උන දවසෙ ඉදං ගෙදර එනකල් hospital එකේ නිදිමරාගෙන ළගට වෙලා ඔලුව අත ගගා ඉදිය.... ඉදගත්තෙවත් නෑ... කෑවෙ බීවෙවත් නෑ..... එදා තමයි මට දැනුනෙ මාත් එයාට ආදරෙයි කියලා. එයා එහෙම බයවෙලා මං ළගටවෙලා ඉද්දි නොකානොබී මටත් නොදැනි ඒවා දැකලා මගෙ ඇස් තෙමුණා.'' නෙතූ හැගුම්බරව කිව්වා.

" ඔව්... ඔව්... උඹ ඉතිං දුකක් කාටවත් කියන අගවන කෙනෙක් නෙමෙයිනෙ... එහෙනම් උඹටත් කුචු කුචු හෝ තාහේ තමා...'' සුරාජ් පස්ස වන වනා කියද්දි මට හිනා ගියා.

මේ සේරම කාමරෙන් එළියට වෙලා අහං ඉදපු සිතුම්ට නෙතූව අල්ලගෙන ඉඹින්න තරම් . අමාරුවෙන් හිත තද කරං එතනින් ඉක්මනට සිතුම් ගියේ
" මගෙ හිත මටනම් කීකරු නෑ....'' කිය කිය මුමුණන ගමන්.

යාලුවන්ගෙ අත්වල ම එල්ලිලා ඉදපු නෙතූට මතක් උනේ O/L කාලේ.

" O/L දවස් තමා බං ජොලිම.... ආයේ යන්න තියෙනම්....අපි කොච්චර ආතල් ගත්තද....''

" හ්ම්... වැහිලා තිබ්බ කතා පෙට්ටියට අෑ පණ ඇවිත් වගේ...."

සිතුම් ආදරෙන් කිව්වේ අන්නාසි දෝසිය අරගෙන එන ගමන්

" නෙතූට මහන්සි වෙන්න හොද නැති හින්දා මං හදං ආවා.ඔන්න... අතුරුපසට... නෙතූ ඔයා කන්න එපා පැටියො... බෙහත් එක්ක සැර ඒව දෙන්න එපා කීවා ඔයාට "

නෙතූ මූණ බෙරි කරගන අනිත් පැත්ත හැරුණෙ පෙරේතකම උහුලන්න බැරුව.

ටවුන් ගිහිං ගෙටවත් නැව්දින් නාන්න පහළ ළිදට ම ගියපු ලසන්ත, තාත්තාත් එක්කම ගෙදර එනකොට ඇහුණ හිනා සද්දෙට ම ඇවිත් ඉන්නෙ කවුද කියලා හිතාගත්තා.

" හ්ම්...හ්ම්... කොරහ වගේ මූණ හදාගන්නැතුව කෑල්ලක් කනවා..." සිතුම් අයියා අමනාපෙන් කියද්දී ඒක ඇහුණ ලසන්ත " හුරතල් කළා වගේ නෙමෙයි ඔය බෙහෙත් වලට ඇලජී වැඩියි... නංගි කන්න එපා." කිය තම නැගණියට සැර උනේ තිනෙත් අතේ තිබුණ අන්නාසි කෑල්ල උදුරගන්න ගමං.

" අපි මේ බැලුවා දොස්තර මහත්තයා කෝ කියල."

" මට කිංඩි දානවද වච්චි අම්මෙ... මට හිනාව ඇහුණා වත්තටම... ටකරං කට නම් අඩු නෑ තව බටකොළ ආච්චි වගේ.''

" නංගිගෙ කටේ හැටියට මගෙ කට මොනවද අයියෙ...''කියලා චලක්ෂණා කිව්වම ලසන්ත නිරුත්තර උනේ තම  නැගණියගේ කටට ගහන්නට තරං කටක් චක්ෂණාට නැති  නිසාවෙනි.

" හවස් වෙන්නත් ආවා නෙතුවො... සුරාජුයි තිනෙතුයි...සදරුවනුයි උඹෙ අයියලා දෙන්නගෙ බණ අහනවා වගේ...කැම්පස් යනවද බං...? අපි සේරට ම දෙවෙනි පාර ලියන්නවෙනවා බං...''

.

" උබලට ඉතිං... මගුල් විසේ ගැහුවානෙ exam එකට කලින් උඹලත් ගියා නම් මාත් එනවා...''

" අනේ මන්දා... යන්න ආසාවකුත් තියෙයි...
දැන් නිවුස්වල එහෙම පෙන්නන එවෑ හැටියට කැම්පස් යනවා කියන්නේ හරියට ගෑණු ළමයි හිරේට යනවා වගෙනෙ බං...''අරක කරයි...මේක කරයි... කියලා ඉන්න වෙලා. බලමුකො.

" එහෙනම් අපි ගිහිං එන්නම් නෙතු අපේ නම්බර්ස් ටික උඹෙ ෆොන් එකේ save කළා හොදේ.''

නෙතුට සමුදුන් යාළුවො යන්න පිටත් වෙද්දි නෙතුගෙ ඇස්වලට කදුලු ඉනුවා. " අයේ වෙලාවක ඇවිත් යන්න එන්න මල්ලි . මෙයාලත් එක්ක යං මං ඇරලන්නං කියලා කච්චියම Car එකට දාගෙන අපේ අයියා

ජේන්නැතුව යනකල්ම නෙතු දුකින් බලා ඉදියා,මට දැනුනෙ දරාගන්න බැරි පාලුවක්.

9

" නෙතූ.... මං හෙට නම් එන්නෙ නෑ පැටියො වෙලාවට බෙහෙත් බීලා ඇදටම වෙලා ඉන්න ඕනි හොදේ.''

" ඇයි ඔයා කොහෙද යන්නෙ...''

" නෙක්ස්ට් වීක් අපේ අලුත් office එකේ opening ceremony එකනෙ තව පොඩි පොඩි වැඩ ටිකක් තියෙයි...''

උදේම බයික් එකෙන් ඇවිත් තේ එකක්වත් නොබිව්ව සිතුම් අයියා කියද්දි  මගේ මූණ ඇඹුල් උනා.

අපි දිහා බලා ඉදපු අයියා " නංගී අපිට තේ හදන්න කියන්නකො අම්මට කියලා සිතුම් අයියගෙ කරට අත දාගෙන මිදුල කෙලවරට ගියේ ලොකු කතාබහකට කියලා මහ හිතුණා.

" මචං... මං හිතුවෙ තාත්තලත් එක්ක නදීලගෙ ගෙවල් පැත්තෙ යන්න දවසක. දැන් එයත් නුවර මාත් නුවර වයසත් යනවනෙ බං.. ඉක්මනට බදිමු කියලා එකිත් කියනවා...''

" හ්ම්....ඒක හොදයි යං මාත් එන්නම්.''

" උඹල දෙන්නා දැන් කුරුලු ජෝඩුව වගෙ එකටමයි. මට කලිං උඹේ එක ගන්න වෙයිද දන්නෑ...''

" පිස්සුද බං.... නෙතූ පෝරුවට නැගලා හරි විදියට චාරිත්‍ර කරල.... තමයි මං එක්ක යන්නෙ... ඒවට මට හදිසි නෑ... කෙල්ලෙක් ආසාවෙන් ඉන්නෙ එහෙම

තමයි. නම්බු  පිට කැන්දන් යන්නෙ උඹෙ නංගිව මං... දවස් හතක් මගුල්  කාලා...''

නංගී තේ ටිකත් අරං අපිට දීලා යනකල් ඉදලා අපි ආයෙ කතාව පටන් ගත්තෙ.

" නංගිගෙ campus වැඩේ මොකද කරන්නෙ බං.''

" මං නම් කීවේ යන්න කියලා,... ඒත් එයා වැඩි කැමැත්තක් නෑ වගේ.'

" එහෙම නෙමෙයි සිතුම්. නංගි ඩිග්රි අරගෙන උඹලා දෙන්නම ජොබ් කරලා බිසී උනොත් අපි එතන ජීවිතේ විදින්න වෙන්නෙනෑ බැං... සල්ලි පාරෙම දුවනවා විතරයි.''

"ඒකට කමක් නෑ ඒක බැලන්ස් කරමු .මං ආසයි නෙතූ මං වගේම කැම්පස් යනවට .අපේ කම්පැනි එකට හොද.

" නෙතුත් ඔය ටිකම කියනවා මට ඒවට බලපෑම් කරන්න බෑ.මං කිවා නෙතූ කැමති නම් යන්න කියලා .''

" අර කැම්පස් එකේ සීන් ටික ලීක් වෙලා නිවුස් දැක්කම තාත්තගෙත් වැඩි කැමැත්තක් නෑ වගේ මට දැනුනෙ.''

" හ්ම්...හ්ම්... යමංකො මට මලක් කඩන්නවත් දෙන්නේ නෑ මූ.. යකෝ 10 යි වෙලාව. පලයං දැන්වත් හොස්පිට්ල් එකට ...ලෙඩ්ඩු බලාඉන්නවා...''

මං කාමරේ අස් කරන්න ගත්තෙ අයියලාගෙ කතාව ඉවර වෙනකල්. සිතුම් අයියා එන්න ඇත්තෙ මාව බලලා යන්න.ඊයෙත් රෑ එකොළහ විතර වෙනකල් msg කර කර ඉදියා වුනත්.අද උදේ ම එනවා කියලා කීවෙත් නෑ.

මගෙ කාමරේට එබුණ සිතුම් අයියාගෙ මූණ යකෙක් වගේ උනේ මං අල්මාරිය උඩ තිබුණ හෙත් පෙට්ටි ටික සේරම උස්සලා බිමට දාලා හති අරින තාලෙ දැකලා....

" නැන්දේ... නැන්දේ... බලන්නකො මේකි කරන වැඩේ... අපි මේ ඇදෙන්වත් බහීන්න නොදී පරිස්සං කරනවා... මෙයා බර උස්ස උස්ස හති දානවා''

සිතුම්ගෙ සද්දෙට නෙතුගෙ අම්මා විතරක් නෙමෙයි තාත්තයි අයියයි දෙන්නත් දුවගෙන ආවා.

"වැඩකාරයො ගන්නෙ නැතුව වැඩවලට . ලෙඩ උනා කියලාගහක් ගලක් වගේ ඉන්නයැ අනේ..."

" ඉදලා ඉදලා හන්දා වෙන්නැති පපුවට මහන්සි වගේ දැනුනා...ඒකයි...''

" නංගී තමුසෙ සෙල්ලම් කරන්නෙ බහිනවා ඔකෙන් බිමට... යන්තම් අඩුවීගන එනවා විතරයි.''

නෙතූගෙ තාත්තට කට කොනකින් හිනා ගියේ තම දියණිය බලාගන්නට ඉදිරිපත් වී සිටින තම බෑනා දියණියට දක්වන ආදරේටමයි.

" සුදු නංගී... ඔයාව Bed rest 5 days තියනවා කියන පොරොන්දුවට ඩිස්චාර්ජ් කළේ. අපිට තියෙන පරිස්සමවත් ඔයා ගැන ඔයාට නෑනෙ '' ලසන්තද සැර වුණා.

ඇස්වල කඳුළු පුරවාගත් නෙතූ පුටුවෙන් බැහැලා ඇඳෙන් ඉදගත්තේ තරහටය.

"මට ලේට් උනා... මං යනවා බං... අද ඔය එන්න කියලා ඇත්තේ hospital එක introduce කරන්න. තව සති 2 ක 3 කින් ඉතිං ඒකෙම තමා ජීවිතේ... සුදු නංගී හොද ළමය වගේ පරිස්සමට ඉන්න හොදේ...'' අයියට දණ ගසා වැන්ද.මට සුපුරුදු විදියටම බුදු සරණයි කියලා ආශිර්වාද කළ අයිය මගේ නළලත සිප හිස අතගෑවා උතුරන සහෝදර ප්‍රේමයෙනි.

සේරම එහෙට මෙහෙට උනාට පස්සෙ සිතුම් නෙතූ ළගිං ඉදගත්තා.'' මේවා කොතනින්ද තියන්න ඕනි... කියන්න මං අස් කරලා දෙන්න''

සිතුම් ආදරෙන් කිව්වට නෙතූ හිටියෙ බිම බලාගෙන කඳුලු පෙර පෙර.

" ඔ...න්...න... ඉතිං පටන් . අඩන්නෙ නැතුව ඉන්නවා දැන්...වැරදි කරලා තව අඩනවා... ආදරේටනෙ කියන්නෙ.''

" ඔය කියනවයැ.. මාව කන්න හදනවා මළ යකා වගේ...මහ නපුරුකමට කෑ ගහනවා...''

" මේක නම් කටක් නෙමෙයි.... ඕක වැහෙන්නෙ නෑ නේ ලෙඩක් උනත් අෑ....''

" මට බනින්නෙපා සිතුම් අයියේ... ඉස්සර නම් ඔයා මට මොනවා කළත් වැඩිය දුක නෑ.... දැං ඔයා මට සැර උනහම මට කෑ ගහලා අඩන්න තරම් දුක හිතෙනවා...''

" ඒක තමා පැටියෝ  ආදරේ ''

" අඩන මූණෙන් ජය ගන්න එනවද ? දැන් මං කියන දේ ඇහුවෙ නැතුවට කරන්නම්කො හොද වැඩක්...'' කියා ඇයව තුරුල් කරගත් සිතුම් නෙතූගෙ දෙකොපුල් මත දෙතොල් තබා ආදරෙන් සිප ගත්තේ ඇයටවත් නොදැනි.

" ඒයියා... මගෙ මූණෙ කෙලත් ගානවා. යනව යන්න...''නෙතූ ඔහුව තල්ලු කළේ ආදරේට.

" punishment එක ඒක නෙමෙයි. කෝ දෙනවා මට කිස් එකක් ''

.  " මට බෑ....''

" දෙන්න කිව්වෙ... නැත්තම් මං ආයෙත්....''

" හරි...හරි...'' කියලා කටත් ඇද කරලා... නෙතූ සිතුම්ට කිස් එකක් දුන්නා.

" කම්මුල් පාරක් ගැහුවා වගේනේ... කෝ මෙච්චර දවසක් මං ආදරෙයි ආදරෙයි කීවාට ඔය කටින් මට කවදාවත්කියලා නෑනෙ තව පැටියො සිතුම් කීවේ හැගුම්බරවය.''

තාත්තමයි... සිතුම් අයියේ... අපෙ අයියා කියලා ඔයාට කැමති උනාට දැන් මට ඔයා එක දවසක්වත් නොදැක ඉන්න බෑ බෑ වගෙ... ෆෝන් එකට msg එකක් එනකල් මං බලාඉන්නෙ... හැමවෙලේම ඔයාව පේනවා...ඇහෙනවා වගේ. මං හින්දා ඔයා ගොඩක් මහන්සි උනා.මං ඔයාට ගොඩක් ආදරෙයි සිතුම් අයියේ... ගොඩාක්.

ඒ වචන ටික අසා සිතුම්ට දැනුනේ නිම් හිම් නැති සතුටක්

" එන්න මගෙ රත්තරං... ඔයා දන්නවද මං ඔයාගෙන් මේ වචන ටික අහගන්න කොච්චර කල් බලා ඉදියද කියල...''

" සිතුම් නෙතූගෙ මූණ දිහා ඇහිපිල්ලම් ගහන්නෙවත් නැතුවආදරෙන් බලා ඉදියා.

" මට ඔයාව ගිලින්න හිතෙනවා... ඔය ආදරේ මට හැමදාම තියෙයි නේද මැණික...''

" හ්ම්... මං මැරෙනකල් ම ''

" එහෙනම් එන්නකො රහසක් කියන්න ''

" ඇයි....''

" මට අයිය කියන්නෙපා පැටියො... දැන් සිතුම් කියන්න.''

" ඇයි... අයිය කිව්වට '' මොකද... මට පුරුදු නෑනෙ...

" පුරුදු වෙන්න වෙයි... අයියයි නංගියි කසාද බදිනවැ ''

" එහෙනං නිකං ඉමු.''

" පුලුවන්ද ඔයාට...? ''

" ඔව්....'' මං බොරුවට කිව්වෙ සිතුම් අයියව අවුස්සන්න කියල හිතාගෙන.
.
සිතුම්ගෙ ඇස්වල කදුළු පිරුණා නෙතු දැක්කා. ජනේලෙන් එළිය බලාගත්තු සිතුම් දැගලුවේ නෙතුට කදුළු පෙන්නන්නැතුව ඉන්න.

. නෙතු දුවලා ගිහිං සිතුම්ව බදාගත්තා. " කවදාවත් බෑ රත්තරං.... මටත් ඔයාව නැතුව බෑ...''

මට සමාවෙන්න සිතුම් අයියේ... මං විහිලුවට කිව්වෙ.සිතුම් ලෝභකමට තව ටිකක් නෙතුව පපුවට තුරුල් කරගත්තේ කවුරු හරි උදුරං යන්න හදනවා වගේ.

" ආයෙ කවදාවත් ආදරේ විහිලුවට ගන්නෙපා පැටියො...මට ඔයා නැති උනොත් මං මැරෙයි මගෙ මැණික.ඒ තරමටම මං ඔයාට ආදරෙයි...''

" මං ආයේ කවදාවත් එහෙම කරන්නෙ නෑ....ඔයා කියන විදියටම ඉන්නවා... පොඩ්ඩක් හිනාවෙන්නකො ඉතිං...''නෙතු කිව්වෙ සිතුගෙ කට දෙපැත්තට අදින ගමන්.

" පිස්සු කෙල්ල... කෝ ඉන්න පැටියො මං විනාඩි දහයෙන් යන්න ආවෙ මේ මූණ බලලා. කොහෙද ඉතිං...''

" ආ.... මං ඉන්න කීවැ යන එකනෙ ඇත්තෙ''

" යනව තමා... මං යනවා...''
" සිතුම් අයියේ... යන්න එපා...'' නෙතු දුවලා ඇවිත් සිතුම්ගෙ
අතේ එල්ලුනා.

" අනේ මගෙ මැණික... අපේ වැඩකටනෙ යන්නෙ ඉතිං... මම අනිද්දට එන්නම්...'' පරිස්සමෙන් හොද ළමයෙක් වගේ ඉන්න ඕනි හරිද...''

නෙතුගෙ නහය මිරිකමින් සිතුම් දුන් උපදෙස් දෙස ගුණවර්ධන යුවල බලා සිටියේ අප්‍රමාණ සතුටකින්.

වෙනදා නම් සිතුම්ට එකටෙක කියලා රංඩුවට යන නෙතු දැන් සිතුම් ළගදි විතරක් කීකරුය. මොකක්දෝ

අමුතුම සුරතලයක් වෙලා නෙතූ සිතුම් සමග කතාබහ කරන්නේඅහිංසක ලෙසට. මටත් නෙතූ ගැනම පුදුම හිතුනේ මීට කලිං කොල්ලෝ පෙන්නන්න බැරිව ඉදලා මම දැං සිතුම්ට නැතිව බැරිවෙලානෙ කියලාහිතන ගමන්.
තමන්ගෙ නංගිට පණ වගේ ආදරේ කරපු ලසන්ත, සිතුම්ගෙයි නෙතූගෙයි ආදර කතාව වින්දෙ හිතේ හංගගෙන ඉන්න බැරිතරම් උතුරලා යන සතුටකින්.

10

සිතුම් රෑ දවල් නොබලා මහන්සි වෙලා තමන්ගෙ බිස්නස් එක හොදට ම දියුනු කරගත්ත.

තමන්ට ම කියලා වෙන ම ඔෆිස් එකක් තියාගෙන පාලනේ කරන ගාමන්ට්ෆැක්ටරි එකක් විතරක් නෙමෙයි මැනික් බිස්නස් එකක් සිතුම් හොදට ම වැදිලා තිබුණෙ.තමන්ගෙ පහසුවට කියලා office එකේ වැඩට හතර පස්දෙනෙක්ම ඉදියට ඒ අතර ඉදපු ටාෂි ටිකක් සිතුම් ගැනවැඩි උනන්දුවක් තිබුණා. ඒ ගැන සිතුම්ටත් නොදැනුනා ම  නෙමෙයි .

සිතුම්ගෙ ඔෆිස් එකට ම පිටතින් ටාෂි... නෙතූගේ යාලුවා  සදරුවන්.... හෂාන් සහ උත්තරා ඉදියෙ ගිනුම් අංශ වැඩවලට. සදරුවන් එක්ක සිතුම් office එකේ දී ත් මල්ලි මල්ලි කියලා කතා කළාට සදරුවන් සර් කියලා ගරු නම්බු දීලම කතා කළා.

වැඩ කරන ළමයි සිතුම්ගෙ හොද ගැන පැහැදුනා විතරක් නෙමෙයි ආයතනෙ වැඩ ටික අඩුවක් නොතියම  කරන්නේ ඒ හා සමාන, ඊට වැඩි පඩියක් සාධාරණව එයාලට  සිතුම් ගෙවන හන්දා.

ටයි එකක් අත් දිග ෂර්ට් එකක් ඇදලා එන සිතුම් අද ඔෆිස් එකට ආවෙ ඩෙනිමකුයි ටී ෂර්ට් එකකුයි

ඇදගෙන හදිසියේ  වගේ ඒ අතරත් සිතුම් නෙතූට කෝල් කර කර ආවෙ...

" නෙතූ.... පැටියො ඔයා සැලූන් එකට ගියාද..." අද තරුණ සංවිධානෙ රැස්වීම කීයට ද තියෙන්නෙ...

" යන්න ඕනි සිතුම් අයියෙ... අච්චත් තදයි කම්මැලි වගේ..."

" එහෙනම්... ඉන්න මං දැන් එනවා ඔයාව පොඩි සප්රයිස් එකක් තියෙයි."

"මොකක්ද අප්පෙ... මොකද මාව අතෑරලා වෙන එක්කෙනෙක් බදින්නවත් ද ?. "

" අපෝ... මේ දාගත්තෙ උරචක්කර මාලෙ මදිවට තව එපා..."

" ආහ්... ඇත්ත ද මහත්තයො " කියලා නෙතූ ෆෝන් එක කට් කළේ පිපිරි පිපිරි .දෙතුන් වතාවක් එකදිගට ම නෙතූ ෆෝන් එක cut කලා.

" පිස්සු කෙල්ල... " කිය කියා ෆෝන් එක දිහා බලං ඉදපු සිතුම්ට
සදරුවන් එනවා දැනුනෙ නෑ.

" නෙතූව ඇවිස්සුවා බං... මේ ඒක නෙමෙයි මං හිතුවා නෙතූටත් මේ වැඩ ටිකක් හුරු කරන්න. සදරුවන් අර බාගෙට හෙලුවෙන්එන එකී බලපංකො. ඇවිත්

සතියලු. මං දැක්කෙත් දවස් දෙකයි ඇඹරි ඇඹරි මාව කන්න වගේ බලං ඉන්නවා."

" හ්ම්... ඒකි සර්ට ෆුල් ට්‍රයි ''

" නෙතූ ඉදිය නම් රවලා මරනවා ඕකිව...''

.              " එයා ඉන්නෙ හෙන වංශෙන් අපෙ අම්මලෑ නෑදෑයො වෙනවලු.අපේ ගෙදර නවතින්නත් අහලා. අම්මා කැමති නෑ ඔය උඩැක්කි
වලට බං... ඒ අතිං නෙතූ වාසනා කරන්න ඕනි...''

" හවස set වෙමු මල්ලී... දියං ඔය ටික සයින් කරලා දාන්න. "

ෆයිල් ටික සයින් කරපු සිතුම් සදරුවන්ට යන්න ඇරලා ආයෙම නෙතූට කෝල් කළා.

" ලෑස්ති උනාද පැටියො...''

" නෑ... මට කාගෙවත් ඇගේ එල්ලිලා යන්න ඕනි නෑ... මගෙ වැඩ මටකරගත්තැකි...''

"මේ... යමුද film එකක් බලන්න... ඔයා හෝල් එකක ෆිල්ම් එකක් බලලම නෑ කීවනෙ ''
" මට බෑ... ගෙදරට DVD ගෙනත් මං ඕනිතරම් බලනවනෙ...ඕවෑ රිංගන්න මට බෑ...''

" අපෝ අබ දැම්මොත් පුපුරයි... නපුරිච්චි ''

" මේ... office එකට අලුතින් ඇවිත් එකියක් මාව ගිලින්න වගේ බලා ඉන්නවා.... කොටට කොටේ ඇඳගෙන එන්නෙත්... මට සද්දෙ දැම්මොත් මං පාලු මකාගන්නවා එයාගෙන්..."

" පාලු මකාගන්න බැරිනම් අරං .... යන එකයි ඇත්තේ..... "කියලා නෙතූ ඉතුරු ටික ගිලගත්තා.

" නෙතූ.... මේකිගෙ පැහිච්ච කම '' සිතුම් බොරු තරහක් පෙන්නලා නෙතූට සැර උනා. ෆෝන් එක තියපු නෙතූට හැඬුම් ආවේ ඉබේටම.

බලපු ෆිල්ම් එකක් අමතක වෙච්ච නෙතූ එහෙම්ම ම ඇඳට වැටුණෙ හිතේ ලොකු බරකුත් එක්ක.

තමා විහිලුවට කියපු දේ නෙතූට දුක හිතුණ කියලා දැනගත්ත සිතුම් දිගට හරහට නෙතූට msg කළත් එයා එකක්වත් බැලුවෙ නෑ.

වේගයෙන් ආපු අලුත් කාර් එක මිදුලේ නතර වෙද්දී ගුණවර්ධනත් රමණීත් ඉදියෙ වත්තෙ අඹ ගහ යට බංකුවේ ඉදගෙන.

" කෝ නැන්දෙ අර කටු අත්ත...''

" ඕං ඉන්නවා සිනමාශාලාවේ... වැඩේ ඕක තමයි...''

හොරෙං හොරෙං අඩි තිය තියා නෙතූගෙ කාමරේට වැදුණු සිතුම් ට නෙතූව දැකලා ඇති උනේ ලොකු අනුකම්පාවක්...නෙත් වෙච්ච කම්මුල් එක්කම දැස්

පියවෙලා තිබ්බ නෙතුගෙ මූණ සිතුම්ගෙ ඇස් වලටත් ගෙනාවේ කඳුළක්.
" කෝ... මගෙ පිස්සි මා එක්ක තරහ වෙලාද... ඔයාව අවුස්සන්න මං කීවේ පැටියෝ ''

සිතුම්ගෙන් ඇහිච්ච හඬට එකපාරට ඇස් ඇරපු නෙතු ඉක්මනින් ඇදෙන් නැගිටලා වාඩිඋණා.

" මට හිතුනා... මං නැති නිසා එහෙ ඔයා හොඳට වෙන කෙල්ලො එක්ක සිරික්කිය දාගෙන ඇති කියලා "

" ඔයාගෙ තැන එහෙම ලේසියකට මේ ආත්මෙදි නෙමෙයි සදහටම කාටවත් දෙන්නෙ නෑ මගෙ රත්තරං... ඔයා නැතුව බැරි හින්දනෙ වැඩ කන්දක් තියං හැමවෙලේම දුව දුව ඇවිත් බලලා යන්නෙ...''

" මේ ඒකනෙමෙයි... අද දවස මතකද, ''

ඇයි...." අද විසිවෙනිදනෙ ''

" නෑ මෝඩියෙ... ඒකවත් මතක නෑ... අදට අපි සෙට් වෙලා අවුරුද්දක් වෙනවා...''

" කෝ... ඇඳුමක් දාගන එන්නකො ගමනක් යන්න ඉතිං...මූණත් මලානික වෙලා... ඔය ඇස් කඳුළු පිරිලා තියෙනවාදකින තරම් මට වෙන දරාගන්න බැරි දුකක් නෑ මැණික...දැන් ඕවා මගේ... ඒ නිසා අඬන්න බෑ හරිද ... ''

" නැන්දේ... මං නෙතූ එක්ක ටිකක් එළියට ගිහිං එන්නද ? ''

" අනේ පුතේ... එයා දැන් ඔයාගෙනෙ, අපෙන් අවසර මොකටද "

නෙතූගෙ මවටත් පියාටත් දණ ගසා වැඳ නෙතූ එනතෙක් සිතුම් මෝටර්රථයට ගොඩ උනේ ලොකු සතුටකින්.දෙමාපියන්ට වැඳ සිතුම්ගෙ කාර් එකේ ඉස්සරහ සීට් එකේ වාඩිවුණ නෙතූට දැනුනේ ආඩම්බරයක්.

ඔයාට මතකද පැටියො... අපි අර මොන්ටිසෝරියක සෙල්ලම් ගෙවල් හදනවා දැකලා, මගෙ ගේ මෙහෙමයි කිය කියා රංඩු වෙවී ගෙවල් හදද්දී ඔයා කිව්වා ඔයාගෙ සිහින මාළිගාව ගැන.

" හ්ම්... කාමර 5 යි ඇටෑච් බාත්රූම් උඩ තට්ටුවේ කාමර දෙකයි... එකක් මගෙ... අනික පුස්තකාලෙ... උඩ බැල්කනියයි දිය ඇල්ලයි.... යට තට්ටුවෙ වැරෙන්ඩා එකයි... ගරාජ් එකයි...මිදුලෙ ලස්සන නෙළුම් මල් පිරිච්ච පොකුණක්... මතකයි...
දැන් හිනහත් යනවා ඒවා ඉතිං හීන ම තමා අනේ...''

නුවරට ම ඇවිත් නුවර ටවුමෙ ඉඳලා ටිකක් දුර ගිහිං කාරෙක හරවලා ලොකු ගේට්ටුවක් ළඟ සිතුම් කාර් එක නතර කළා.

" ඔන්න... අපේ ෆස්ට් ඇනවසරි එකට මගෙන් ඔයාට ගිෆ්ට් එකක් ..." කාර් එකේ ඉදං හෝන් එක ගහගෙනම සිතුම් කිව්වා.

එකපාරට ම ගේට් එක ඕපන් වෙලා කාර් එක වත්තට දාපු සිතුම් ගරාජ් එකටම ගිහිං කාර් එක නැවැත්තුවා.

නෙතූ ඉදියෙ මේ කිසිදෙයක් තේරුම් ගන්න බැරුව.
" කාගෙද සිතුම් අයියෙ මේ ලස්සන ගේ..... ඇයි අපි මෙහෙට ආවෙ.... අපි දෙන්නා විතරනෙ... කවුද තව ඉන්නෙ...."

නෙතූගෙ ප්‍රශ්න වැල ම අහගෙන ඉදපු සිතුම්.

." මේ තමයි අපි දෙන්නගෙ සීන මාළිගාව පැටියො තම සුරතනෙතූගෙ ගෙල වටා යවන ගමන් සිතුම් කීවේ ගොඩක් බලාපොරොත්තු පිරිච්ච හදවතෙන්.

" යංකො බලන්න... " ඉන්න මං දොර අරින්නම්... කෝ ඔයත්මගෙ අතින් අල්ලගන්න..."

අත් දෙකින් ම අල්ලගෙන ගෙයි දොර ඇරපු සිතුම් කාර් එකේ තිබුණු සිමෙන්ති තැටියක් උස්සං ආවා

" අපි දෙන්නගෙ ම කකුල එකට ම මේකේ තියමු... දකුණුකකුල..."

හිනාවෙවී පිය සටහන් ගත්ත සිතුම්ඒක.වේලෙන්න අව්වෙන්තිබ්බා.

එළියෙ ටැප් එකෙන් කකුල් හෝදගෙන දෙන්නම ආයේ ගෙදරට ගියේ සිතුම් ඉස්සර කරගෙන.

සියලු වැඩ නිමකර තිබු ගෙය සැබවින්ම මාළිගාවකට සමානය .ඇඩුවක් නැතිව තිබුනු ගෘහභාණ්ඩ ලයිට් , වතුර , බාත්රූම් .මේ සේරම... ඉතා අනර්ඝව තිබුණි.

" නෙතුව අල්ලගෙන ම සාලේ තිබුණු සැටියෙන් වාඩිවුණ සිතුම්අවසරේකින් තොරවම නෙතුගෙ උකුලෙ ඔළුව තියාගත්තා.

" ඔයා දන්නවැ පැටියො කවුද මේකේ plan එක ඇන්දෙ කියලා...''

" න්.... නෑ මට දිවැස් තියෙනවැ අනේ....''

ඔයා තමයි... ඔයා පොඩි කාලේ ආස කරපු හීන මවපු විදියටමයි හැදුවේ. මගෙ මැණික... මට ඕනි මේ ලෝකෙටම වඩා සතුටින් අපිදෙන්න හැමදාම ජීවත් වෙන්න.

" යංකෝ... පෙන්නන්න ''

එය සැබෑය. පුටුව, ෆොටෝ එක පවා මා කියූ ලෙසටම පිළිවෙලට තබා ඇත. මං වෙනුවෙන් මෙච්චර දෙයක් හීනෙන්වත් මං සිතුම් අයියගෙන් බලාපොරොත්තු උනේ නෑ. උඩ තට්ටුවේ ඉදං පහළ තට්ටුවට බහින්න හදපු නෙතු මෙහෙම හිත හිත යද්දි...

" ඇයි අරක ඇරියෙ නැත්තෙ අයියෙ...''

"මං කියපු හැටියට ඒක මගෙ කාමරේ වෙන්නෝනි.''
හ්ම්... ඒක තමයි.

" ඒකත් අරින්නකො බලන්න මට... ජනේලෙන් මාළිගාව පේනවද කියලා... ''

" හ්ම්... පේනවා පැටියො "
" ඉතිං පෙන්නන්නකො ඕක ඇරලා... "

හා...හා... ඉතිං bed room එක අරින්නෙ අපිදෙන්නා මෙහේ එකට ඉන්න එන දවසට... දැං ඉතිං මාව bed room එකට එක්ක ගියොත්... මන් දන්නෙ නෑ ඔන්න.

" යකෝ... මෙයාට නම් තියෙන්නෙ මහ කුපාඩි හිතක්...''

නෙතූ කිව්වෙ සිතුම්ගෙ බඩට අනින ගමන් . එක පාරටම හිතට ආපු සිතුවිල්ලට නෙතූ ව තමන් ළගට ඇදගන්න සිතුම් ඇයව වැළද ගත්තේ අසීමිත ආදරෙන්... මං මලක් වගේ පරිස්සම් කරනවා මගෙ මැණිකා

" බඩ්ඩක් අහන්න තරහ වෙනවද ? "

" න්....නෑ... කියන්නකො බලන්න.''

" මට කිස් එකක් දෙන්නකො... හැබැයි පොල්ලෙන් ගැහුවා වගේ බෑ... ආ....දරෙන් '

" යාලුවෙලා අවුරුද්දක් උනාට අද වෙනකල් මට කිස් එකක්වත් නෑ.. එදා බලෙන් එකක් ගත්තා ඒකත් ගැහුවා වගේ...

මාත් ඉතිං තව ඔය සුදු මූණ ඉම්බෙ දවස් දෙකයි නෙ ....අනිත් උන්ට නම් අවුරුද්දක් කීවාම ළමයිනුත් ඉන්නවා..." කියමින් නෙතූව තවත් තමාට ළං කරගත්තු සිතුම් ඇගේ නළල මත තම දෙතොල් තිබ්බේ පරිස්සමටය.

මේ තරම් ආදරයක් එක සිප ගැනීමක දී දැනෙන්නට තරම් පරිස්සමට හිස අත ගා නළලත සිඹි සිතුම්ව නෙතූ සිප ගත්තේ ජීවිතේ පළමු වතාවටයි.

" ඇති යාන්තං... මං හිතුවා මට බනී කියලා... මාසයක් ම නාන්නෙ නෑ මං... මේක තියාගෙන ඉන්නවා...''

" තව එකක් දෙන්නකො අනේ...'

" මල කෝලං ...."

" අනේ ඉතිං... මං වෙනකාගෙන් ඉල්ලන්නද ? "

" හ්ම්... කෝ නැමෙන්නකො..." කියමින් සිතුම්ගේ නළලත සිපගත් නෙතූ

" ඇයි රත්තරං... ඔයා මට මෙච්චර ආදරේ.... මං ගොඩක් පිං කරලා ඇති සිතුම් අයියේ ඔයා වගේ කෙනෙක් ලබන්න....මැරෙනකල් ම මට මේ වගේම ආදරෙන් ඉන්න පැටියෝ... "

" ඔයා මට මෙච්චර ආදරයක් පෙන්නුවා මයි නෙතූ... නොපෙන්නු වාට මට ගොඩක් ආදරෙයි නේද ඔයා... ම්ම්... මේක තමා සප්රයිස් එක. කෝ මට ගිෆ්ට් නැද්ද.... "

" ගෙදරට වෙලා ඉන්න මට income එකක් නෑනෙ ඉතිං ඔයාට ගිෆ්ට් අරන් දෙන්න..."

" ලබන මාසෙ ඉදං ඔයත් මගෙ office එකේ වැඩ ඔන්න... privateSecretary. හරිද ?...."

" ඇයි අර සක්කරවට්ටම ටිකක් ඉන්නෙ..."

" ඉරිසියාකාරී... දැන් යමු නේද මාළිගාවටත් ගිහිං යං නෙතූ..."

හවස ඔෆිස් එකට සිතුම් යද්දි වෙලාව 4 ටත් කිට්ටුයි. සිතුම්එයාගෙ කාමරේට ගියගමන් ම මෙසේ උඩ තිබ්බ ෆයිල් ටිකකුත් උස්සගෙන ටාෂි ගියා සිතුම්ගෙ office room එකට.

" අනේ සිතුම් සර්... මං බයේ ඉදියෙ අද සර් ඔෆිස් එක වහනකල්ම එන එකක් නෑ කියලා...''

" ඒ මොකද... මගෙ ඔෆිස් එකට මට ඕනි වෙලාවට එනවා...යනවා
... "

" ස...ර්.... මං සර්ට දෙන්න කියලා කෑමක් හදාගෙන ආවා..."
" අනේ... ඕවට මහන්සි වෙන්නෙපා ටාෂි... මට මෙහේ කෑම කකා ඉන්න වෙලාවක් නෑ..."

" මං මහන්සි වෙනවට සර්ට දුකයි ද සර් "

යකෝ මොන මල කෝලමක් ද මේ. මේකි කොලිෆයිඩ් කියලා ගත්තට මාර දූතිකාවක් ද මංදා. නෙතූ සක්කරවට්ටමක් කිව්වට ඊටත් එහා මේකි. සිතුම් මුවින් නොකියා හිතුවා,.

" මේ... ටාෂි... ඔයා ආවෙ රාජකාරි වැඩකට නම් කියන්න...නැත්තම් යන්න... මට මේ තමුසෙලාව හුරතල් කරන්න වෙලාවක් නෑ..."

ටාෂි ෆයිල් ටිකක් තුරුල් කරං අඩාගෙන එළියට දිව්වා...

තමන්ගෙ බඩු ටික අරගෙන සිතුම් කාමරේ දොර කැඩෙන්න වගේ ඇරගෙන එළියට ගියේ " ...

සදරුවන්... Accounts වල උවමනාවක් තියෙනවා නම් ඔයා ඇරෙන්න වෙන කවුරුත් මගෙ ඔෆිස් රූම් එකට එවන්නෙපා... මං යනවා උවමනාවක් උනොත් call එකක් දෙන්න සදරුවන්..."

11

ඉරිදා අම්මත් එක්ක පොළට ගිය නෙතූ ගෙදර ආවෙ හොදටමහෙම්බත් වෙලා.

සිතුම්ට අද Good morning  msg එක දාන්න බැරි වුණු හන්දා එයා තරහ වෙලා ඉදියෙ .සිතුම් අයියට Call එකක් දෙන්න ඕනි කියලා හිතලා සිතුම්ගෙ number එක dial කළා.

" මේ මනුස්සය මොනවා කරනවද මන්දා... ෆෝන් එක answer කරන්නෙත් නැනෙ..."

සදරුවන්ගෙ ෆෝන් එකට නෙතූගෙන් කෝල් එක එද්දි සදරුවන් ඉදියෙත් සිතුම්ගෙ ඔෆිස් රූම් එකේ තිබුණු meeting එකේ. ටාෂි ත් ඉදියා.

Meeting එක ඉවර වුණු ගමන් ෆෝන් එක දැකපු සිතුම්ට හිනාගියා. Miss call 25 පැය දෙකට පස්සෙත් ".....මේක නම් ..."කියලා සිතුම් තනියෙ ම හිනාවෙද්දි.

" මටත් මිස් කෝල් 6 ක් තියෙයි.... සර්ටත් ඇති... නැත්තම් මළා කිව්වත් මගෙ ෆෝන් එකට msg මිසක call නම් ගන්නෙ නෑ ඕකි..."

පව්... බං...මං Call එකක් අරං එන්නම් යනකොට දොර වහං පලයං මචං..." සදරුවන්ට කිව්ව සිතුම් නෙතූට call එකක් ගත්තා විතරයි. රින්ග් වෙන්නත් කලිං Answer කළා.

" අනේ... සිතුම් අයියෙ ඔයා තරහද රත්තරං... තරහ වෙන්න එපාඅනේ... ඇයි මට call කළේ නැත්තෙ... ඇයි Answer කළේ නැත්තෙ... අඩු තරමෙ msg එකක් වත්... කියන්න... ඇයි... ඒ..."

" කෝ ඉතිං... කියන්න දෙනවයැ.... වක්කඩේ කැඩුවා වගේ ඔයා කියවගෙන කියවගෙන යනවනෙ... මෝඩි... මං කොහොමද ඔයා එක්ක තරහ වෙන්නෙ කෙල්ලෙ මං හිතුවා මාව දැන් ගණන් ගන්නෙ නෑ කියලා... හැබැයි ටිකක් දුක හිතුණා..."

මං නැගිටින්නෙ ඔයාගෙ msg එක බලාගෙන මගෙ මැණික..."  පරිස්සමෙන් ගිහිං එන්න මගෙ රත්තරං ... බුදු සරණයි ඔයාට කියලා

Msg එක දැකපු ගමන් මට මාර ගැම්මක් එනවා උදේට. අද නැතෙ ඉතිං...මාව Accident වෙයි ද දන්නෙ නෑ.."

" කියන කතා... අනේ ඔහොම මූසල කතා
කියන්නෙපා සිතුම් අයියේ..."
" වැඩක් නෑ ඉතිං... මාව අමතක උනානේ..."

" අනේ නෑ රත්තරං ඊයෙ ගොඩක් රෑවෙලා නිදගත්තෙ...අයියගෙ මොනවාදෝ වැඩක් කරා... ඒකයි නින්ද ගියේ...ආයෙ කවදාවත් එහෙම වෙන්නෙ නෑ..."

" එහෙම බෑ punishment එකක් තියෙනවා "

" ඒ මොකක්ද ..."

" kiss එකක් "

" මෙහෙම කොහොමද දෙන්න "

කොහොම හරි දෙන්න ඉතිං... කෝ...

" උම්...මා... දැන් හරි ද? යාලුයි ද? ඔයා නම් මහා පිස්සු කොල්ලෙක්

අනේ..."
" මට පිස්සු හැදුවෙ කව්ද ඉතින්... ඔයානේ... මගේ ඔලුව පැලෙන්න වගේ රිදෙනවා නෙතූ.... ඔයාවත් ලග ඉදියානම්...."

"ම්...ම්... මං මේ ඔයාට කැමක් හැදුවා .... ඇවිත් කාලා යන්නකෝ..."

" මං ආවොත් අද තියෙන  වැඩ ටික ගොඩවෙනවා නෙතූ. පැටියො .... මේ.... ඉතිං ඔයා taxi එකක එන්නකෝ ඕක අරන්..."

" මං ඔයාගේ office එකට ඇවිත් ම නැනේ.... මොකද මොකද වගේ.... මොකකද් ඇදන් එන්න ඕනී..

" ඔයා ඉතිං මෙතන මැඩම් නේ...ඒ නිසා සාරියක් ඇදගෙන එන්නකෝ.... මට ආසයි බලන්නත්....මන් මේක අස්සේ හිර වෙලා පැටියො... ඔයාටත් මේවා හොදට  තේරෙනවානේ ......ඔයාගෙන් මට help එකක් ගත්තැහැකි..."

"හ්ම්...මං විනාඩි 20න් එන්නම් එහෙනම්.... සිතුම් අයියෙ සදරුවන්ටත් එකක් ගේන්න ද...?

"ම්.... ඒක හොදයි ..... නැත්තම් හරි නෑ.... ඔයාගේ ගජ යාලුවොනේ ඉතින් .... ඕක මගෙන් අහන්නේ මොකට ද?... "

ගමේ හැමදේට ම  මහන්සි වෙලා නිතර ම සමාජෙත් එක්ක ම ගැවසුනු නෙතූට තනියෙම තමන්ගේ වැඩ  කරගෙන හොදට පුරුදුයි.

"ෂා..... මගේ කෙල්ලගේ ලස්සන..."  අම්මයි තාත්තයි ලිදට ගිහින් නාගෙන එනකොට හැඩවෙලා ඉදපූ දුවගෙන් ඇහුවා.

" ඇත්තට ම ලස්සනයි ද අම්මේ.... සිතුම් අයියා කිව්වා Office එකේ වැඩ ගැහිලා.... ඇවිත් help එකක් දෙන්න කියලා...

" ඒක හොදයි දුවේ.... ඔයත් ඕවා පුරුදු වෙන්නෙපෑ...."

"කොහොමද යන්නේ දුවේ..."

"අයියා taxi එකක් එවයි තාත්තේ.... office එකේ සේරම වාහන ටික ගිහින්ලු වැඩවලට...
"හ්ම්... හ්ම්... පරිස්සමින් ගිහින් එන්න. එ ලමයට හදපු බත් ටික ඔතාගත්ත ද නෙතූ ...."

"... හ්ම් අන්න taxi එක එනවා.. තාත්තේ මං යනවා..."
නෙතූ ගෙදරින් එලියට බහින්නේ අම්මා තාත්තාගේ දෙපා වැදලා.

Taxi එක main gate එක ලග දි චෙක් කරන්න නවත්තපු security අයියා ඇහුවේ මේ අවේලාවේ නම් taxi වලට අවසර නෑ කියන බැල්මෙන්

".ඔයාලා කව්ද ?...

එතකොට ම ආපු call එකෙන් ගැස්සුනු security "අනේ සමාවෙන්න මැඩම්..." කියාගෙන දෙකට නැමෙද්දි නෙතූට දුක හිතුනා.

"කමක් නෑ අයියේ... Taxi එක දාලා යන්නත් එපෑ
කොහොමටත් මෙතනින් අඩියයි දෙකයිනෙ....."

" යං මැඩම්.... මං මැඩම්ව සර්ගේ room එකට
ඇරලන්නම්.....අපේ සර් මැඩම්ගෙ අයියද....මැඩම්...

"....ඔව් "

නෙතූ දුන්නේ කෙටි පිළිතුරක්. නෙතු සාරියට
කියන්න බැරි තරම් ලස්සනට ඉදියා... දිග
කොන්ඩෙත් ලස්සනට ගොතලා..නෙතූව
වෙනදාටත් වඩා ලස්සනකින් වෙලිලා තිබුනා..

නෙතූව දකින හැමෝම දෙපාරක් නැත්තම් තුන්
පාරක් නෙතූ දිහා බලද්දී සිතුම් ඉදියේ හරියට මන්
තමා මේ මිස්ව අඳුරන්නේ..උබලා දන්නෙවත් නෑ
කියන ලෙවල් එකේ...

" අම්මට සිරි.... සුරංගනාවියෝ අද බිමටම බැහැලා
.." කියාගෙන කොල්ලෝ රංචුවක් එතනින් ගියේ...
මේ lunch time එක නිසා..."

නෙතූ දකින හැමෝම, නෙතු අලුතින් office එකට
ආපු කෙනෙක් කියලා හිතලා... "පට්ට කෑල්ල බං.."
කිය කියා යනවා නෙතූට ඇහුනත් මූනට හම්බෙන
හැමෝටම නෙතූ කටපුරා හිනා වුනේ
සිරියාවන්තකමට..

ෆැක්ට් එකේ මැනේජර්ස්ලා. සුපවයිසර්ලා සේරටම
meeting එකක් කියලා හැමෝම ඉදියෙ බෝඩ් රූම්

එකේ ටාෂි , සදරුවන් එක්ක අනිත් Accountant ලත් එතන ඉදියා.

ඈත තියාම නෙතූ එනවා දැකපු සිතුම්ට තමන් කරන කතාවත් අමතක වෙලා නෙතූ දිහා වශී වෙලා වගේ බලාගෙන ඉදියෙ ඇස් අහකට ගන්න බැරි ලෝභකමේ.meeting එකෙන් නැගිටපු සිතුම් දුවගෙන වගේ visitors ල ඉන්න තැනට ආවෙ නෙතූව ඔෆිස් එකට එක්ක යන්න.

" මේ යකා මොකද මේ එකපාරට නැගිට්ටෙ මල පැනලද ? කියලා කුසුකුසුවක් බෝඩ් රූම් එකේ ගියා.එතකොට බෝඩ් රූම් එකට ගිය කොලිටි සුපර්වයිසර්

" මං පරක්කු වුනා බං ටිකක්... ඒක නෙමෙයි දේවතාවක් ගොඩබැස්සනෙ අද ඔෆිස් එකට... වේටින් ඒරියා එකේ. ආයෙ කිරි කිරි ටොයිස් කෑල්ල බං...."

තමන්ගෙ හිතවත් සෙට් එකට කියපු නිසත් එබි එබී ඒ පැත්ත බලද්දි සිතුම් නෙතූව එක්කගෙන එයාගෙ room එකට ගියා. නෙතූව තියලා ෆයිල් ටිකකුත් දීපු සිතුම් ආයෙම බෝඩ් රූම් එකට යද්දි උන්ගෙ කතාව නෙතූ ගැන... නෙතූගෙ ලස්සන වර්ණනා කරපු කතා සිතුම් ආසාවෙන් අහගෙන ඉදියෙ ආඩම්බරේකුත් එක්ක

" අද හවස් වෙද්දි මට හැම ෆයිල් එකක් ම මගෙ මේසෙ උඩට ඕනි.ගායිස්... sorry මං මැදින් නැගිට්ටට... මීටින් එක මං තිබ්බෙ මේ ෆයිල්

ටික දුවෙනකොට මට ඕනි කියලා දැනුම්දෙන්න. හරි... දැන් යන්න...පුලුවන්... තමන්ගෙ වැඩ ගානට... පිළිවෙලට... තියෙන්න ඕනි කියන එක අමතක කරන්නෙපා."

" ආහ්... ටාෂි... ඔයා යනකොට මගෙ රූම් එකට ඔරේන්ජ් ජූස් එකක් එවන්න."

" හා... හරි... සර්... මං තප්පරෙන් අරන් එන්නම්. සර් ඇතුලට යන්නකෝ... ' කියලා ටාෂි කිව්වේ සර් අද මට ටිකක් කැමැති පාටයි කියලා හිතලා තමන්ගෙ කොණ්ඩෙ, අතින් ආයෙම හදාගන්න ගමන්.

දඩිබිඩි ගාල ඔෆිස් රූම් එකට ගිය සිතුම් දොර වැහුවගමන් නෙතු ළගට ගියේ

" බඩ ගිනි පැටියෝ...." කියාගෙන
" ඔයාගෙ මූණත් එක්ක මහනසි පාටයි සිතුම් අයියෙ... ඔයා ඇයි ඔහොම මහන්සි වෙන්නෙ පැටියෝ... වැඩ කරන අය ඉන්නවනේ..."

" ඒකනෙ මගෙ උදව්වට කෙනෙක් ගෙනාවෙ... ඒක නෙමෙයි... අද ෆැක්ට්රි එකේ ම කතා වෙන්නෙ මොකක් ගැනද දන්නවද ? "

" නෑ.. මොකද...."

" ඔයා ගැන... මාත් බැලුවා කවුද බොලේ මේ එන අයිශ්චරයා වගේ කෑල්ල කියලා.... මටත් වශී වුණා වගේ... ඒකයි මං මීටිමෙන් නැගිටලා දුවලා ඇවිත්

මේක අස්සට දැම්මෙ... වෙන උන් මගෙ මැණිකගෙ ලස්සනට පැණි හලනවට..."

" ඇත්තමයි... ඔහොම ඇන්දම ඔයා ගොඩාක් ලස්සනයි පැටියො... මට දැන්මට ගෙදර උස්සං යන්න හිතෙනවා." මෙගෙ කෙල්ල ලස්සනයි කියද්දි... ඉතිං... මටනෙ ආඩම්බර.

නෙතූගෙ බද වටා අත යවපු සිතුම් නැවතුනේ ඇගේ දෙකපුල මත ඔහුගෙ දෙතොල් සතපාය.

දොරට තට්ටුවක් වත් නොදමා එකපාරට ම room එකට කඩා පැනපු ටාෂි ට ඇස් අදහගන්න බැරුව වගේ බය වෙලා නෙතූයි සිතුමුයි දිහා බලං ඉදියෙ කටත් බාගෙට ඇරගෙන.

" සො...රි.....සර්..."

" සොරි කියල හරියනවද ටාෂි දන්නෙ නැද්ද දොරට තට්ටු කරලවත් එනන්... තමුසෙලා මැනස් වත් දන්නැද්ද කියලා සිතුම් කෑගහද්දි..

" අනේ... සිතුම් අයියෙ...ඕකට මෙච්චර කෑ ගහන්නෙපා අනේ..."

" ඔය බීම එක තියලා යනවා යන්න මෙතනින්..."

ටාෂි අඩාගෙන එළියට දුවන කොට සදරුවන් ඔෆිස් එකට එනගමන්.

" අරකි අදත් බැණුම් ඇහුවද... සර්... මට එන්න කිව්වේ..." සදරුවන් අහද්දි "

" ඔං සර් කෑල්ල ගලවපං බං... අරකි මගෙ ඔෆිස් එකට එන්නෙ ඒකිට bed room එකට එනවා කියලා හිතාගෙන... බලපංකො..."

" ඒකි සිතුම් අයියාට full try..."

" එහෙනම්...මං ගෙදර හින්දා මෙයා එයා එක්ක පෙම් කෙලිනවද දන්නෑ ...නේද සදරුවන් .

" මට උබට වඩා සිතුම් අයියව ශුවර් බං...අයියගෙ වැඩේ අරකිට බනිනව ...ඒකිගෙ වැඩේ අඩනවා..."

" මේ... අපිට කෑම අරං ඇවිත් මේ කෝකියා... හෙට නිවාඩුවක් දාන්න වෙයි ටොයිලට් යන්න. "

නෙතූ සදරුවන්ගෙ කෑම එක දුන්නෙ හිනාවෙවී. " දැන් පලයංකො බං නෙතූ දැන් ආවෙ... මලක්වත් කඩන්න උනේ නෑ...."

" සොරි...සොරි... ඔන්න කැපුන එහෙනම් "

" මෙතන ඉදලම කමු පැටියො... මට කවන්නකො ඔයා... ඉන්න මං අර දොරලොක් කරලා එන්නම්."

" රසයිද... මං තනියෙන්මයි හැදුවෙ..."

" හ්ම්... කඩෙන් කෑම කනවා වගේ.... ඇත්තටම රසයි. "

" සිතුම් අයියේ ඔයා අර ළමයාට ඔහොම නපුරු විදියට බනින්නෙපා... පව්නෙ..."

" එහෙම ඉදියොත් මගෙ උකුලෙන් ඉදගනී ඇවිත්... ඔයාට ලැජ්ජ උනාට ඒකිට ලැජ්ජාව බය ඇති එකියක් නෙවෙයි නෙතූ..."

සිතුම් කියව කියව බත් ටික ඔක්කොම කෑවා.

" අනේ...මං සේරම ටික කාලා... ඔයා බඩගින්නෙනෙ මැණිකෙ... ඔයා කවපු නිසා දන්නෙම නැතුව කැවුණා. ''

" මම ...කෑම පෙට්ටියෙ තියෙනවා ඒකෙනුත් ටිකක් කවන්නද..."

" දැන් බඩ ෆුල් පැටියො..."

" මට ඔයාගෙ ආදරේට ලෝබ හිතෙනවා... මං මේව හෝදං එන්නම් "

" අනේ ඇයි පැනඩෝල් බොන්නෙ ඔලුව ගොඩක් රිදෙනවාද රත්තරං. ඔයා අර සෝෆා එකේ ඇලවෙන්න. මං මේ Account ටික චෙක් කරන්නම්."

" පැලෙන්න වගේ ඔලුව... සදරුවන්ව set කර ගන්න පැටියො... උඹ කියයි බල්ලන ඕනි ටික... ඔලුව අතගාන්නකො ටිකක් එහෙනම් නින්ද යනකල් අවසෙරෙකින් තොරව නෙතූගෙ උකුලේ ඔලුව තියාගත්ත සිතුම් තමාගේ හිස ආදරෙන් පිරිමදින

නෙතූ දෙස බලාගෙන ම ඉද්දි... අමාරු වැඩිමට  ම නින්ද ගියා .

සිතුම්ගෙ ටයි පටිය බුරුල් කරලා ෂර්ට් එකේ බොත්තමත් ගලවලා ෆෑන් එක වහලා AC on කරලා ෆයිල් ටික චෙක් කරන්න ළගට ගත්තා.

පැය දෙකක් යනකොට මේසේ උඩ තිබුණ ෆයිල් විතරක් නෙවෙයි මීටින් එකේ දි ගේන්න කියපු සේරම ෆයිල් සදරුවන්ට එවලා තිබ්බ නිසා ඒවත් ගෙන්නගෙන නෙතූ චෙක් කලා. බිස්නස් එක open කරලා මාස 6 ක් වෙලා ආදායම ලක්ෂ 80 ක් විතර ඇවිත්. ඒත් වියදම් වල බිල් නැති... සදහනක් නැතුව... ලක්ෂ 6 ක විතර ඇරියස් ආපු නිසා නෙතූ සදරුවන්ට Call කරලා ගෙන්නගෙන දෙන්නාම දෙපාර නෙමෙයි තුන්පාරක් ම චෙක් කලා.

" ඔක්කොම අවුල් ටික තියෙන්නෙ. ස්ටෝර්ස් වලින් ආපු ෆයිල් වලින් අනික දැන් අපි ස්ටොක් චෙක් කලානෙ නෙතූ. කිසිම සදහන් නැතුව ලක්ෂ 10 ක විතර බඩු අවුට් වෙලා..."

වෙලාවට ඔයා ඇවිත් මේවා චෙක් කළේ තාම මාස 6 යි. එක් ලක්ෂ 20 ක් විතර මාටිය ගහලා. සදරුවන්ට ආයෙ ම ස්ටෝර්ස් චෙක් කරන්න යවපු නෙතූ CCTV රෙකෝඩ් ටිකත් අරං එන්න කියලා කිව්වෙ නිකමට වගේ.

" නෙතූ පැටියෝ... මං ගොඩක් වෙලා නිදාගත්තද ."

" හ්ම්... පැය දෙකක්..."

බීම එක තොලගගා නෙතූ නැවත නැවතත් අර ඉන්කම් ටිකයි වෙලා තිබුණු පාඩුවයි ගණන් හද හද බැලුවත් ආවෙ එකම උත්තරේ.

" අනේ... ඔයා මගෙ ෆයිල්ස් සේරම චෙක් කලාද ?.... කෝ... මටත් දෙන්නකො ඕකෙන් උගුරක්... ඔයා මගෙ ෂර්ට් එකේ බොත්තනුත් ගැලෙව්වද..."

" හ්ම්.... තදයිනෙ නැත්තම් ඇගට..."

මෙයා මගෙ තව මොනවගේ බොත්තම් ගැලෙව්වද දන්නෙ නෑ... තව ටිකක් ඉදියනම් එහෙම... මොනවා කරයි ද දන්නෑ....සිතුම් කියපු කතාවට නෙතූගෙ මූණ රතු උනා... අනේ... මේ... හරිවැඩේ මට... මෙයාගෙ ඒවා ගලව ගලවා ඉන්න.... වෙන වැඩ නෑනෙ....

" සිතුම් අයියෙ... ඔයා මේ Accounts මේ මාසෙ ට එක පාරක්වත් චෙක් කළේ නැද්ද ? "

" නෑ පැටියො අද තමයි මේ කරන්න හැදුවෙ... ඒකටනෙ ඔයාවත් ගෙන්න ගත්තෙ..."

" සිතුම් අයියෙ මං එවා චෙක් කලා ලක්ෂ 20 ක විතර ඇරියස් එකක් තියෙයි. ඒ ගැන කිසිම සදහනක් නෑ... අනික... ස්ටෝර්ස් වලත් බඩු අඩුයි."

" මොනවා... What are you telling about...

" හ්ම්... මම දැන් දහ පාරක් විතර චෙක් කලා."
" මං සදරුවන්ට කිව්වා මේ ගැන නොදන්නවා වගෙ ගිහිං ආයෙත් ස්ටෝර්ස් රෙකෝඩ් ෆයිල්ස් සේරම එව්වද කියලා අහං එන්න කියලා CCTV Records ටිකත් ගේන්න කිව්වා "

සිතුම්ව නිකම්ම පුටුවෙ ඉන්ද උනා." ඔයා නාවනම් මං ඕවා උඩින් පල්ලෙන් බලලා සයින් කරල දානවා. ඇත්තමයි නෙතූ ඔයා නම් මට දෙයියො දීපු තෑග්ගක්..."

" ඒක නෙමෙයි... දැං මේකට මොකද කරන්නෙ... සිතුම් අයියේ..."

" අපි ළග ෆයිල් ෆොටෝ කොපි තියං... මේවා අයෙ යවමු අපි මුකුත් නොදන්නවා වගේ මේක පස්සෙ කවුද ඉන්නෙ කියලා හොයාගන්න එපාද..."

" මගෙ ඔලුවට නිකං හෙනයක් කඩා වැටුණා වගේ නෙතූ..." සිතුම් කිව්වෙ කණස්සල්ලෙන් වගේ.

" මං ආපු පළවෙනි දවසෙම ඔයාට වුනේ කරදයක්මයි නේද ?..."

" අනේ දෙයියනේ... ඔයා නොහිටින්න වුන් මාව බංකොලොත් කරල ම දානවානෙ... ඔයා  නිසා තමයි රත්තරං මේක අහුවුනෙත්... ඔයාට මං කොහොම ස්තූති කරන්නද මන්ද ?..."

" මං පිට කෙනෙක් ද ස්තූති කරන්න...
අවුස්සගන්නෙපා මගෙ කට... අනික සිතුම් ඔයා ඔහොම කඩාවැටෙන්නැ ඔයා මේ සේරගමෙ බොස් ඔයිට වඩා හයියකින් ඔයා ඉන්න ඕනි. කිසිම කලබල ගතියක් කාටවත් පෙන්නන්නෙපා..."

සිතුම්ට මේ අවුල අස්සෙ හිනා ගියෙ අම්මා වගේ තමන්ට උපදෙස් දෙන නෙතූව දැකලා.

" හ්ම්... මට තේරෙනවා... මගෙ පස්සෙන් මාව පිකප් කරන්න ඉන්නවනෙ හොද ගැම්මක්. ඔය හයිය තමා මැණික මට ඕනි උනේ. මං හිතුවෙ ඔයාට මේකට හැඩ ගැහෙන්න කල් යගි කියලා. "

" මට දැන් අහස කඩා වැටුණත් බයක් නෑ. මං නැති උනත් මේවා handle කරන්න මට වඩා දක්ෂ.... මාව ශක්තිමත් කරන අම්මන්ඩියෙක් ඉන්නවනෙ..."

" එන්නකො අපි යං ස්ටෝර්ස් එක පැත්තෙ. එතන කවුද ලොක්කා හිතවනෙක්ද සිතුම්..."

" අයියා කෑල්ල නැතුව ඔයා කතා කරද්දි මට දැනෙන්නෙ ඔයා දැන් මගෙ wife කියලමයි මැණික..."

සිතුම් නෙතූගෙ අත් දෙක අල්ල ගත්ත ගමන් කිව්වේ ඇත්තමයි.

" දැන් හයටත් කිට්ටුයි දැන් මේක මෙහෙමට අතෑරලා අපි හෙට මේක ගැන බලමු සිතුම්... දැන් ටිකක් රිලැක්ස් වෙන්න..."

" හ්ම්... ඒක හොදයි... අපි යං රත්තරං දැන් දැන්ම කාටවත් මේ ගැන කියන්නෙපා කියලා සදරුවන්ට කිව්වනෙ. අපි අද උඹවත් අඩගහං මේ ටික ගෙදර ගිහිං බලමු..."

" හා... එන්න මගෙ රහස් පරික්ශකතුමිය... ඔබගේ අනර්ඝ සේවයට මාගේ ප්රණාමය... ඇය තවත් හාදුවකින් ඇගේ මුහුණ තෙත් කලේ ඇගෙ අතත් අල්ලගෙන යද්දි .

" බොසා අරකිව දාගනද කොහෙද බං... අපරාදෙ අපි ට්රයි කරන්න සෙට් උනාට වැඩක් නෑ බං..."

" කොල්ලො කතා වෙනවා අපි ගැන ඔයාට ඇහුණද... නෙතූ..."

" ඔව්..."

" මට මේ සාරිය ගලවනකම් ඉන්න බෑ සිතුම් අයියෙ..."

" ඔන්න ආයෙත් අයියෙ අයියෙ ගානව..."

" නැම්බෙනව... මේක පටලවගෙන එපා වෙනවා වැඩක් කරන්න... අනේ..."
" යංකො එහෙනම් කාර් එකටවත් ඕක ගලවලා දාගන්න..."

" පිස්සු කෙනෙක් ඔයා නම්..."

කාර් එකේ ම ගිහිං ගෙදරට දාල සිතුම් නෙතූලගෙ ගෙදරම නතර වුනේ සිතු   ට වෙන්වුණ නෙතූලගෙ ගෙදර තියෙම කාමරේ.

වැඩට අදින්න කියලා සිතුම් අයියා අරන් දීපු ඔෆිස් කිට් ටිකයි ඒවට මැච් වෙන්න සිතුම් අයිය ගත්තු කිට් එකයි සේරම කාමර දෙකේම අල්මාරි වලට දාපු නෙතු ගියේ නාගන එන්න.

රෑ එකොළහ දොළහ වෙනකල් ම ලසන්ත අයියාවත් එකතු කරගෙන කොච්චර ගණන් හැදුවත් වෙනස එකමයි. හැබැයි ලීක් එක වෙලා තියෙන්නෙ ස්ටොක් වලින් කියලා හොදටම දැන් විශ්වාසයි.

" දැන් නිදාගමු... හෙට බලමු..." සිතුම් කිව්වේ නළල අත ගාන ගමන්.

" හ්ම්... යං... ඔයාගෙ කාමරේ හදලා තියෙන්නෙ සිතුම්..."

" යංකො ටිකක් ඒකට..."

" ඇයි අනේ... කිස් එකක් දීල ඔලුව ටිකක් අතගාන්නකො මහන්සි නැත්තම්..."

" හා... හා... හුරතලේ මෙයාගෙ..."

විනාඩි දහයක් යන්න කලින් සිතුම්ට නින්ද ගියා. නෙතූ සිතුම්ට බෙඩ්ෂීට් එකක් පොරවලා නෙතූගෙ කාමරේට ඇවිත් ඇදට වැටුනා විතරයි නින්ද ගියා.

12

පාන්දර 4 ට එලාම් වැදෙන කොට උඩ ගිහිං ඇහැරපු නෙතූ කුස්සිය පැත්තට ගියේ සිතුම් කන්න කැමති නිසා කිරිබත් හදන්න හිතාගෙන.

කිරිබතුයි ලුණු මිරිසයි හදලා මේසෙටත් ඇරියට පස්සෙ තමා නෙතූගෙ අම්මා නැගිට්ටෙත් 4.45 ට පිරිත් දාලා කුස්සියට එනකොට දැකපු දේ රමණීට අදහගන්නත් බැරි වුණා. තමන්ගෙ දුවට ත් කුස්සියෙ වැඩ පුලුවන් කියලා රමණී දැන ගත්තෙ එදා තමයි.

රතු හාල් බතුයි පරිප්පුයි මොර කරවල බැදුනුත් එක්ක කතුරුමුරුංගා මැල්ලුනුත් හදලා ලසන්න අයියටයි සිතුම් අයියටයි දෙන්නටම බතුත් බැදලා බාත් රූම් එකට ගියේ ඇග හොදගෙන ලෑස්ති වෙන්න්.

" නෙතූගෙ තාත්තෙ... ඇහැරෙන්නකො. මේ දූ මොකක්ද කරලා තියෙන වැඩේ බලන්නකො."

අම්මගෙ සද්දෙට ලසන්තයි සිතුමුයි තාත්තයි තුන්දෙනාම කුස්සියට ආවා ඇස් පොඩි කර කර .

" ඇයි... නැන්දෙ."

" ඇයි තමා... උපන්තේකට කුස්සියට අඩිය නොගහපු කෙල්ල... උයලා... බත් බැදලා... වලනුත් හෝදලා ඕං ඇග හෝදන්න ගිහිං..."

" ඉතිං හොදයිනෙ... ඕයි... ඔහොම තමා දැනුම් තේරුම් ඇතිවෙනකොට..."

සිතුම් කටකොනකින් හිනා වෙලා ආයෙම කාමරේට ගියේ. නෙතූ ඇවිදිං තමන්ව ඇහැරවා ගන්න දගලන කොට එයත් එක්ක ටිකක් ආදරෙන් ඉන්න තියෙන එක දැන් මෙතන හිටගන ඉදියොත් නැතිවන හන්දා.

නෙතූ බාත්රූම් එකෙන් එළියට එද්දි අම්මලාගෙ මූණුවල තිබ්බ හිනාව දැකලා සතුටු හිතුණා. ලසන්ත අයියගෙ කාමරේට ගිය නෙතූ අයියගෙ ෆෝන් එක ආන්සර් කළේ අයිය ඔලුව ඉදං පොරවගෙන ආයෙම නිදාගෙන නිසා.

" Good morning නදී අක්කෙ... අපේ හොර පූසා තව නිදි හලෝ..."

" අනේ... නංගි අයියාව ඉක්මනට ඇහැරවලා ලෑස්ති කරල එවන්න... අද අද කලින් නාවොත් ලොක්කගෙන් අයියට බැනුම් තමයි... මං මේ ලෑස්ති වෙනගමන් "
" හරි Ok අක්කෙ."

හ්ම් හ්ම්... කුම්බකර්ණ නැගිටිනවා... අයියේ...අයියේ... බැරිම තැන නෙතූ අයියගෙ ඇගට පැන්නෙ කොටියෙක් වගේ..." නැගිටින්නකො නදී අක්කා

ඉක්මනට එන්න කිව්වා." ලසන්ත ඇදෙන් බැස්සෙ නෙතූගෙ කනෙන් ඇදගෙන.

" නපුරුකම විතරක්..." ඉවරවෙලා තම කාමරේට ගිය නෙතූ ඇදගෙන සිතුම්ගෙ කාමරේට ගියා.

නෙතූ යනකොට නැගිටින්න හදපු සිතුම් ආයෙත් නිදි වගේ ඇදට පැනලා නිදාගත්තා,

" සිතුම් අයියේ... සිතුම් අයියේ...සි...තු...ම්. ඇහැරෙන්නකො... අද 7 වෙනකොට office එකේ ඉන්නෝනි. සිකුරිටිලා ෂිෆ්ට් එක මාරු වෙන්න කලිං."

" ම්...ම්... මට නිදිමතයි නෙතූ..."

තමන් ගෙනත් දීපු ඇඳුම් ඇදගන ඉන්න නෙතූව දැක්ක ගමන් වශී වෙච්ච සිතුම් නිකංම ඇදෙන් ඔැස්සෙ ඉබේට ම.

" ඔයාගෙ ලස්සන...හා ...හා . මං ඉක්මනට ලෑස්ති වෙලා එන්නම් පැටියො කෝ මගෙ morning kiss එක. වෙනදා ෆෝන් එකෙන්නෙ. අද ඇත්තටම ඕනි..."

" හා...හා... ඉතිං ලෑස්ති වෙලා එන්නකො සිතුම්... තමන්ගෙ office එකේ එකේ අවුල ලිහන්න මට තියෙන උවමනාව ඔයාට නෑනෙ..."

" ඉතිං දෙයියනේ මේව මගෙ විතරක් නෙමෙයි. ඔයාගෙත් තමයි... ඔයා මොකද දැන් මං මොකද... මේ

සේරම ඔයාගෙම තමයි පැටියො. මේ සේරම ලියලා තියෙන්නෙ ඔයාගෙ නමට..."

" ඒ... මේ අස්සේ දඩි බිඩි ගාලා සිතුම් ලැස්ති උනා..."
" නෙතූ... ඔයාම කවන්නකො පැටියො... ඔයා ඉද්දි අනිත් කන්න හිතෙන්නෙම නෑ... ලෝභකමේ බෑ..."

" පිස්සා... කෝ ඉන්න මං බෙදාගෙන එන්නම්..."

සිතුම්ට කවන ගමන් නෙතුත් කටක් දෙකක් කෑවා. බදගත්තු කෑම පාර්සල් ටිකක් අරං අම්මටයි තාත්තටයි වැදපු නෙතූ කාර් එකට නැග්ගා.

උදේ ම සිතුම් සර්ගෙ කාර් එක එනවා දැකපු ටාෂියි... ස්ටෝර්ස් බලන ලොක්කයි දෙන්නාටම හිතාගන්න බැරි උනා.

" තාම ලොරියවත් යවාගන්න බැරි උනා. මූ මොකද අද කවදාවත් නැතුව මේ කලිං ම... " හීන් දාඩිය දාපු තිසත් ටාෂිට කිව්වෙ ටිකක් බයවෙලා.

" මොකද්ද නෙතූ අර තුන්දෙනා එක තැන ඉදං මුමුණන්නෙ. මොනවාද අර ලොරියට පටවන්නෙ කොල්ලො ."

" ගිහිංම බලමු සිතුම්..."

" මිස්ට තිසත්... මොකද මෙතන වෙන්නෙ... මොනවාද ඔය ලොරියෙ තියෙන්නෙ..."

" ම්... මේ... වේස්ට් මැටර්ස් සර් ''

කියලා තිසත් කියනකොටත් නෙතූ ලොරිය ඇතුළ චෙක් කරනවා.

" කෝ මේවට ඇපෘවල්... ආ... " නෙතූ සිතුම් ළගට ආවෙ දැඩි කේන්තියෙන්.
" කෝ මේවට කවුද අත්සන් කළේ... මිස්ට... What the hell are you doing here..."

" ඔයා හදන්නෙ සිතුම් අයියා අමාරුවෙන් ගොඩනගපු මේ කම්පැණි එක මාස දෙකන් බංකොලොත් කරන්නද ?...ආ."

නෙතූ කෑගහද්දි සිතුම් බය උනා ...නෙතූ මේ මිනිහට ගහයි ද කියලා.

" මිස්ට තිසත්... ටාෂි... සිකුරුටි ජනිත්... ඔය තුන්දෙනාම මගෙ office එකට... මේ දැන්ම..."

සිතුම් නෙතුත් එක්කම කේන්තියෙන් office room එකට ගියේ අර තුන්දෙනා පිටිපස්සෙන් එද්දි.

සදරුවන් Account එක්ක ම office එකට ආවෙ. තමන්ගෙ වැරදි ගැන අහන්නත් කලින් හොදට ම බයවෙලා ඉදපු සිකුරුටි ජනිත් සේරම දේවල් කියන්න පටන් ගත්තා. බයවෙලා.

බඩුත් එක්කම හොරු අල්ලගත්තු හින්දා සදරුවන් පොලිසියට Call කළා.

නැතිවෙච්ච ලක්ෂ 20 විතරක් නෙමෙයි. ඒවට වන්දිත් එක්ක ගෙවන්න උන තිසත්ට විතරක් නෙමෙයි ටාෂි... ජනිත් දෙන්නටත් සිද්ධ උනේ හිරේ යන්න.

සිතුම්ගෙ හිත හොද කමට දුප්පත් ජනිත්ගෙ දරු පවුළට මාසික පඩිය යැව්වා.

මේ හැම ප්‍රශ්නෙම මැද ෆැක්ට්‍රි එකේ අය අල්පෙනෙත්තක්වත් ෆැක්ට්‍රියෙන් හොරෙං අරං යන්න බය උනා.

ඊළග මාසෙදි ෆැක්ට්‍රි එකෙන් ලැබිච්චි ලාභෙ සේවකයන්ටත් දැනෙන්න සිතුම් එයා ලගෙ පඩි වැඩි කළේ නෙතුගෙ කීමට...

නදී අක්කාගෙත් අපේ අයියාගෙත් මගුල් ගේ ඉක්මනින් කිරීමට වැඩිහිටියො සූදානම් උනා.

සිතුම්... නදී... දෙන්නාත් ලසන්තගෙ මගුල් ගෙදරට ගොඩක් මහන්සි වෙලා වැඩ කළා.

හෝටලයක දෙපැත්තෙම මගුල එක දවසක ගන්න ඒ දෙන්නා කතා කරගෙන තිබුණා. උදේ පෝරුවෙ චාරිත්‍ර එදාම හවස දෙවනි දවසෙ පාටිය.

හෝටල්වලට බොරුවට සල්ලි වියදම් කරන්න ලසන්ත අයියයි නදී අක්කයි දෙන්න කැමති උනේ නෑ.

දෙවනි මනමාලයා සිතුම් අයියා. අක්කගේ නංගි තමා දෙවෙනි මනමාලි...

මගුල් ගේ දවසෙ සිතුම් අයියා වගේම අපේ අයියයි අක්කයි දෙන්නත් ගොඩක් ලස්සනට ඉදියා සිතුම් අයියාගෙ අපෙ අයියාගෙ... නදී අක්කාගෙ... යාලුවො සේරම පිරිලා ඉදියා එදා.

මට හැමදේට ම යාලුවෙක් වගේ ඉදං හැමදේම කියාදීපු කාංචනා මිස්වයි අපේ හාමුදුරුවෝමයි අයියටත් මතක් වෙලා කලින් දවසෙම අපි හතර දෙනාම ගිහිං කතා කරලා ආශිර්වාද අරං ආවා.

සිතුම් අයියයි මමයි නම් සම්බන්ධෙ පටන් ගත්තු ගමන් ඉස්සෙල්ලම කිව්වෙත් ඒ දෙන්නට තමයි. ඒ තරමට අපේ ජීවිත එළිය කටගන්න හිතට කාවැදෙන්න උපදෙස් දීපු එයාලව අපි අමතක කළේ නෑ.

කොහොම හරි කැම්පස් එකේ හිටපු යාලුවෝ එහෙම පිරිවරාගෙන අපේ අයියයි සිතුම් අයියයි හොද කයිවාරුව.

මාව අවුස්සන්න වගේ සිතුම් අයියා දෙවනි මනමාලි ළගට වෙලා ඉදියෙ මා එක්ක ඇස්වලින් කතා කරන ගමන්.

අම්මා තාත්තගෙ ඇස්වල කදුළු පිරිලා... හැබැයි ඒ දුකට නෙමෙයි ... සතුටට...

පෝරුවෙ චාරිත්‍ර කරද්දි නදී අක්කාගෙ විතරක් නෙමෙයි මගෙ ඇසුත් තෙත් කරගන්න අෂ්ටක කියපු සුනිල් මාමට පුලුවන් උනා... අම්මා තාත්තගේ අගේ... ඒ තරමට මට කවදාවත් දැනිලා නැතුව ඇති කියලා මට හිතුණා.

කල්පනා ලෝකෙක ඉදපු මට එකපාරට පියවි සිහියට ආවෙ සිතුම් අයියා ඇවිත් මගෙ අත කොනිත්තන කොට.

" උඟයි... මොකද කෝ ඔයාගෙ දෙවනි මනමාලි නැද්ද..."

" අනේ මගුල... මේ ඒකනෙමෙයි මං අතන ඉදලා බලා ඉදියෙ... මොකද මේ කදුලු බලන්න මං ආවේ..."

මගෙ කණට තියලා අහපු සිතුම් අයියා ඇහුවෙ හැගුම්බරව.

" දුක හිතුණා... සිතුම් අයියෙ... අර අයියා... අම්මා...සේරම අඩනවා..."

" ඒ දුකට නෙමෙයි... පැටියො... සතුටටනෙ අපි පෝරුවෙ නගින කොට එහෙනම් මෙයා වැලහින්න වගේ අඩ අඩා ම ඉදීද දන්නෙ නෑ... මුන් දෙන්නා බැස්සම අපිදෙන්නා නගිමුද ආ...."

" විකාර... යන්න යන්න අතෙන්ට... අයියා ඔයාව හොයනවා වගේ..."

නෙතු එහෙම කියනගමන් හෂානි... චලක්ෂණා...
තිසර එහෙම ආපු දිහාට ගිහිං යාලුවන්ට සෙට් උනා.

දැන් මගුල් ගෙදර දවල් කෑමක් ඇවිත් මනමාල ජෝඩුව කලා බීලා ඉදගෙන ඉන්නවා. එන එන හැමෝම එයාලත් එක්ක එතනට ගිහිං කතා කරනවා .

මේ අස්සෙ බත් පිගානකුත් අතේ අරං සදරුවන් නෙතුව හොයං ආවෙ සිතුම්ගෙ පණිවිඩේකට.

" ආං... උබට සිතුම් අයියා ඉස්සරහට ම ඇවිත් මනමාල ජෝඩුව කිට්ටුවෙන් වාඩි වෙන්නලු කියාගෙන සදරුවන් මාව ඇදගෙන ගියා.

මට අයියා දිහා බලද්දි ගොඩක් දුකයි... අයිය වෙනස් වෙයි... දැන් අපිට ආදරේ නැතිවෙයි... කියන බය හිතේ තදට දැනිලා තිබුණෙ...

ඒ දෙන්නට බුලත් දීලා වදිද්දි මට කෑ ගහලා අඩන්න තරම් දුක හිතුනත් මගෙ හිත හොදට අදුරන සිතුම් අයියා මාව නැගිට්ටවගෙන ඉක්මනට එතනින් එහාට එක්ක යනවා ලසන්ත අයියා දුකෙන් බලං ඉදියා.

" ඇයි... මට එන්න කිව්වේ සිතුම් අයියෙ... "

" මේ දෙවනි මනමාලය වෙන්න වෙලා මට මගෙ මනමාලිගෙ ලස්සනවත් බලන්න බැරි උනානෙ... ඒකයි ජේන්න ඉන්න කීවෙ මෝඩියෙ..."

" ඔයා මනමාලිට වඩා ලස්සනයි පැටියෝ...."

කියලා නෙතූ ළඟිං ම පුටුවෙන් සිතුම් ඉදගත්තා විතරයි කැම්පස් එකේ හිටපු සෙට් එක " සිතුමෝ... " කියලා කෑ ගැහුවා.

" ඔතන ඉන්න... කොහෙවත් යන්නෙපා මං එනවා ටග්ගාලා " කියලා සිතුම් උන් ළඟට ගියා.

" මේ... කවුද බං අර කෙල්ල උඹ කතා කළේ... පට්ට බං අෑ... මං දැක්කා අර ලසන්තයාගෙ DMO එක්ක පට පට ගාලා කතා කරනවා..."

සිතුම්ට හිතට ලොකු ආඩම්බරයක් ආවා... සිතුම් හිනා වුණා.

" ඒ ලසන්තගෙ නංගි බං... "

සිතුම් එහෙම කියද්දි " ඔහො.... ඔහෝ.... ඒක.... තමා මේ කැම්පස් එකේදිවත් එකක් දාගත්තෙ නැත්තෙ...

" හා.... හා.... හොරේ දැනුනා... දැනුනා..."

ඒකත් හයියෙන් කියද්දි... " අවුරුදු කීයක් උනත් මේ නෑනා වෙනුවෙන් බලා ඉදියට පාඩු නෑ... බං..."

" පරිස්සම් කරගනිං සිතුමා... නැත්තම් wedding එක ඉවර වෙද්දි මූ කොටු කරගනීද දන්නෑ..."

" බලමු පුලුවන්නම්.... නෙතුගෙ හිත හෙල්ලුවොත් මං මගෙ බිස්නස් සේරම උඹට දෙනවා යකෝ.... මට මටත් වඩා ඒකි විශ්වාසයි..."

" ආ... නෙතු ද නම..."

" ok දැන් වෙඩිම ඉවර වෙන්න කලිං මං ඕකිගෙ නම්බර් එක ඉල්ල ගන්නවා.... එහෙනම් ලෑස්තිවෙලා ඉදපං සිතුවො... අද.... හැබැයි උඹ කියන්න බෑ කලිං ම...."
එහෙම කිව්වෙ විදුලිබල අධිකාරි කෙනෙක් වෙච්ච දිලංක."

" ok  ok...." සිතුම් හිනා වෙවී එතනින් යන්න ගියා... තමා දිහා කවුරුහරි බලා ඉන්න්වා වගෙ දැනුන නෙතු සිතුමුත් නැති නිසා එතනින් නැගිටලා යන්න ගියා.

" Excuse me.... are you nethu..."

" yes... who are you... How do you know my name."

"    You are Lasantha ' s sister no.... I'm working  in Kandy he she my friend"

Ok. Nice to meet you "   නෙතු කිව්වෙ වැඩිය ගනන් නොගැන කිව්වා...

" කෝ... අනේ.... අතට අතවත් නොදීද කියන්නෙ..."

" oh...සොරි අයියෙ... මගෙ අතේ අයිසිං ගෑවිලා... අයියට කේක් කව කව ඉදියෙ..."

" ඒකට කමක් නෑ... නංගි මෙකද කරන්නෙ..."

" මං ගෙදරට වෙලා නිකං ඉන්නෙ අයියෙ... කෝ ඔයාගෙ family එකේ අය ආවෙ නැද්ද...?''

" නෑ... නෙතූ... මං අම්මා අප්පච්චි මාව දාලා ගියේ මං කැම්පස් ඉද්දි... මං තනියෙන් ජීවතේ ගෙවනවා ගෙවන්න ඕන් කමට...."

" සොරි අයියෙ... අයියා ලන්ච් ගන්නකො.... මං අරෙහෙට ටිකක් යන්නම්..."

" නෙතූ... නෙතූ... අනේ ටිකක් ඉන්න නංගි... මං වටින් ගොඩින් නැතුව අහන්නම්... මං ඔයාට කැමති ආදරෙයි. ඔයා මොකද කියන්නෙ මට..."

" What the hell are you telling me..."
" ඇත්තමයි නෙතූ..." කියලා දිලංක නෙතූගෙ අත අල්ලන්න හැදුවා. ඒක දැනුන නෙතූ අත උස්සන්න හදනවා දැකපු චලක්ෂණා නෙතූගෙ අත පාත් කරගෙන ඇදගෙන ගියා.

" උඹ මං කවුරු කියල හිතාගෙනද මගෙ අතිනුත් අල්ලන්න හැදුවා... කෝ මේ සිතුම් අයියා... ෆෝන් එක ආන්සර් කරන්නෙත් නෑ... මොන මගුලෙ ගියාද මංද."

නෙතූ තරහින් පුපුර පුපුර කියෙව්වා.

නෙතුව සිතුම් හිතාමතාම මග ඇරියත් සංගීතෙ වෙලේ නම් නෙතූ ළගට නැවිදිං ඉන්න සිතුම්ගෙ හිත ඉඩ දුන්නෙ නෑ...

" මේ සිංදුව මගෙ චුටි සුදු නංගිට..."

මනමාලයා නැගිටලා කියද්දි සේරම ඒ පැත්ත බැලුවා. මනමාලිත් අතතින් අල්ලගෙන ලසන්ත සිංදුව කියනවා හැමෝම අහගෙන ඉදියා.

***"... පුංචි කාලේ අපි සිංදු කියපුහැටි***
***පැංචියෙ මට මතකයි***
***පුංචි පැටික්කිට වෙච්ච පොරොන්දුව***
***ඉර හඳ වගේ මතකයි...***

සිංදුව කියද්දි අයියගෙයි නංගිගෙයි දෙන්නගෙම ඇඩුම නවත්තගන්න බැරි උනා. නෙතූ දුවලා ගිහිං ලසන්ත අයියාව බදා ගත්තා.

" සිතුමුයි ඔයයි ලස්සන සිංදුවක් කියන්නකො සුදු නංගි මට ආසයි බලන්න...."

***සැරහැටියෙන් අපි යනෙන තුරු***
***සංසාරෙම අපි එකට ඉමු...***
***සංසාරෙන් අපි සමුගන්නාදා***
***ඒ ගමනත් අපි එකට යමු....***

දෙන්නා සිංදුව කිව්වෙ ඇස් වලින් කතා කරන ගමන්. සිදුව ඉවර වෙන කොට කුරුළු ජෝඩුවක් වගේ

තුරුල්වෙලා ඉදපු දෙන්නට හැමෝම විසිල් කළා.සිංදුව කියලා නෙතූයි සිතුමුයි කුටු කුටු ගගා ඉදලා සිතුම් දුවලා අයිය ළගට ගියේ ආපු call එකක් ලස්සනට දෙන්න ඒ අතරෙ දිලංක ඇවිත් නෙතූට කිව්වා .

" නංගි.... ඔයා තාම සිතුම්ව marry කරලා නෑනෙ. අනික ඔයාට කම්මැලිත් ඇතිනෙ... සිතුම් නිතරම office එන්නෙ... ඔයාට පාලු හිතුනම මට කතා කරන්න.... මේ මගෙ නම්බර් එක... බැදලා නෑනෙ ඔයාලා තාම ආශ්‍රය කරලා බලන්නකො... නිකං ම සිතුම් ව එපා වෙයි."

නෙතූගෙ මූණ ඇස් කණ් සේරම රතු වෙලා. වෙව්ලන තරමට තරහයි.

" තමුසෙ හිතුවෙ මං මොකෙක් කියල ද ආ.... තමුසෙට තේරෙන්නෙ නෑ මං හොදිං කිව්වට " කියපු නෙතූ  ච.... ටා.... ස්  ගාලා කම්මුල් පාරකින් දිලංකට සංග්‍රහ කළා.

ආයෙ මට වචනයක් කිව්වොත් මං ගලවලා ගන්නෙ මගෙ සෙරෙප්පුව.

දිලංක කම්මුලත් අල්ලගෙන බිම බලාගෙන තමන්ගෙ සෙට් එක ළගට ගියේ ලැජ්ජාවෙන්.

ලසන්තයි සිතුමුයි දෙන්නම දුවගෙන ආවෙ සදරුවන් එයාලට විස්තරෙ කිව්වට පස්සෙ...

" සිතුම් නෙතුව දැක්ක ගමන් සිතුම්ටත් බය හිතුණා ඒ තරමට නෙතුගෙ පපුව ගැහෙනවා... දත් මිටි කාගෙන ..."

" මගෙ අම්මේ... මොකද මේ කේන්තියෙන් වගේ... එන්න අපි යන්න අරෙහෙට..."

නෙතුව එක්කං ගිය සිතුම් ඇයව තුරුල් කරගෙන ඇහුවෙ මොකද උනේ කියල.

" Relax.... Relax.... නෙතු ඔහොම කලබල වෙන්නෙපා පැටියෝ.... ඉන්නකො මං උඹට කතාකරන්න... ඕකට මං කලින්ම කිව්වා ඔයා මගෙ girl friend කියලා...."

එතකොටම දිලංක එතන්ට ආවා ලැජ්ජාවෙන් " sorry මචෝ... මේකිට නම්බර් එක දෙනවා තියා ළග ඉදං කතා කරන්නත් බයයි බං... මේකි කැපුවත් උබේ නමා... මට ඒක තේරුණා..."

Sorry නංගි. මට ඕනි උනේ.... ඔයා අපෙ සිතුම්ට කොච්චර love ද කියලා දැනගන්න. Extremely sorry නෙතු....

නෙතු පැත්තවත් බැලුවෙ නෑ... සිතුම් " නෙතු.." කියද්දී නොකියා බැරි කමට . It' s ok කිව්වා.

ළසන්තට හිනා. " අපේ නංගී black belt බං උබලා දන්නේ නැද් ද්?.."

හිනා වෙවී ලසන්ත කියපු දේට සේරටම හයියෙන් හිනා ගියා.

අන්තිමට සිතුම් නෙතූ දෙන්නයි, මනමාල ජෝඩුවයි , තව තව ජෝඩුයි couple dance දාන අතරේ චලක්ශණායි දිලන්කයිත් සෙට් වෙලා නටද්දී පුරුදු විදියටම "ඒකටත් ජය සිරි මංගලම්...." කියාගෙන සුරාජ් එතනින් ගියා.

" නෙතූ... බියර් උගුරක් බොන්න ද පැටියෝ... අනං මනං නැනේ මගේ කොහොමත්... අද විතරයි..."

"හ්ම්.. චුට්ටයි හැබැයි ..."

" මන් පොරොන්දු කඩන්නේ නෑ ... ඔයාගෙන් අහලා මේ... තරහා නැනේ..."

" නෑ නෑ ඉතිං.... හා.... අද විතරයි.... සිතුම් අයියෙ."

" හොද කෙල්ල ' කියපු සිතුම් මේ සෙනග මැද ම නෙතූට කිස් එකක් දීලා සුදු නෙතූව රතු උනා."

ඈත ඉදං සදරුවනුයි හෂානියි දැකල නෙතූට ඇද කළා.

පාටිය ඉවර වෙලා ජෝඩුව නම් ගියා. නෑයොත් ගියා. කට්ටියම ගෙවල්වලට බඩුත් අරං ගියා. නෙතූලව දාන්න සිතුම් තමන්ගෙ කාර් එකෙන් ම ආවෙ වැඩි හොදට. සිතුම් එදා රෑ ගෙදර ඉන්න කිව්වත් ලසන්තත් නැති නිසා සිතුම් ඉන්න අදි මදි කළා.

" කමක් නෑ පුතා... දැන් ගොඩක් රෑ වෙලා ඉදලා... හෙට යං..." තාත්තගෙ වචනෙ අන්තිම වචනෙ කියලා සිතුම් අයියත් දන්නවා.

නාලා කරලා හැමෝම රෑට නූඩ්ල්ස් කාලා අම්මයි තාත්තයි නිදාගන්න ගියා. එලියෙ බංකුවට වෙලා තනියෙම අහස දිහා බලං ඉන්න නෙතූව දැකලා සිතුම් එයා ගාවට ගියා.

" පැටියො.... මන් අද ටිකක් බීලා ඉන්නේ ඔන්න ...." කියාගෙන නෙතූගෙ උකුලෙන් ඔලුව තියා ගත්තු සිතුම් ඇගේ බද වටා අත යැව්වේ ආදරෙන්..
"නෙතූ... මොනවා ද කල්පනා කරන්නේ..."
" මට අයියා මතක් වුනා.. සිතුම් අයියේ ..."

" අනේ පිස්සී...උන් දෙන්නා දැන් හොදට love කර කර ආතල් එකේ ඇති..."

"අයි ඉරිසිය ද ඔයාට ..."

"අනේ මං මොකට ද ඉරිසියා වෙන්නේ...මට මේ ඉන්නේ.... සුරංගනාවියක්..." කියලා නෙතූගෙ අත අරන් පපුවට තුරුල් කරගත්තු සිතුම් කිව්වා..

"හ්ම්ම්.... ඇත්ත ද.."

" ඔයා තමා මගේ මුලු ලෝකෙම මගේ මැණික .... මට දැන්නම් ඔයාව ඉක්මනට මගෙ ලගට ඕනී...මට ඇති දැන් මේ අපී ඈත් වෙලා ඉදියා.."

" ඔයා මගේ ලගට එනවා නේද  මගෙ රත්තරං .."

"ඔව්.. සිතුම් අයියේ... මං ඉතිං ඔයාගෙනේ පැටියො
කොහොමත් ..."

" මැරෙනකල් ම මට මේ වගේම ආදරෙන් ඉන්න ඕනී....
හොද ද ....." ඇගේ කම්මුල එක පාරක් නෙමෙයි දහා
දොලොස්  සැරයක් සිපගත්තු සිතුම් කිව්වා.

" මන් මැරුනත් ඔයාව දාලා යන්නේ  නෑ රත්තරං ..."
අතැගිලි  පටලවාගෙන අහස  දිහා  බලා සිතුම්ගේ
උරහිසට හේත්තු වුන නෙතූ කියද්දී  සිතුම් නෙතූව
තුරුල් කර ගත්තේ   හිතට ආපු  හැගීම් අමාරුවෙන්
මැඩ ගනිමින්.

" යං ... යං.. නෙතූ අපි යමූ නිදා ගන්න.. පිනි බානවා..."

එකපාරට ම නැගිටපු සිතුම් කියද්දී  නෙතූට  මේ ඇයි
...  කියලා හිතුනා..

" තව ඉදියොත්  මෙතන...මට තව තව... ඒවා
හිතෙනවා...."අපී යං පැටියො .."

"  පිස්සු  කොල්ලෙක් ඔයා නම් ... නෙතූ සිතිම්ගේ
අතේ එල්ලිලා ගෙට ගියා

13

ගුණවර්ධනත් රමණීත් කතා කර කර ඉදියෙ දැන් අද හෙටම දූගෙ මංගල්ලෙත් පිළිවෙලක් කරන එක ගැන. ලසන්ත තමා ලබන සතියෙම ගමු කියලා කියන්නෙ. කොහොමින් හරි නෙතුගෙයි සිතුම්ගෙයි මගුල ලසන්තගෙ මගුල වගේම ජය පහටම කෙරුණා.

මගුල් ගෙදර ගම හොල්ලන්නතරම් ජයට තිබුණා උනත් නෙතුට ඕනි උනේ තමන් ජීවත් වෙච්ච ගෙදර දිම චාරිත්‍ර කරන්න.

සිතුම් හැම වෙලේ ම මුල් තැන දුන්නේ නෙතූ කැමති දේට... ගෙදර මගුල් කටයුතු ඉවර වෙලා හඩ දොවා...සතුටු සාමිච්චිය... ඉවර වෙලා.... නෙතූ... සිතුම්... දෙන්නා හනිමූන් ගියේ හෝටලේට නෙමෙයි. එදා සිතුම් නෙතූට පෙන්නපු.... ඒ දෙන්න වෙනුවෙන්ම සිතුම් හදවපු ටාජ් මහලටම තමයි.

නෙතූගෙ ඔලුවෙ සැරසිලි අයින් කරන්න උදව් කරපු සිතුම් නෙතූට කලිං...නාගෙන ඇවිත් කුස්සියට ගිහිං තේ හැදුවෙ නෙතූට නාගෙන එන්න ඉඩ දීලා... නෙතූ ආපුගමන් උකුල උඩින් වාඩි කරව ගත්තු සිතුම්

" ඔන්න... අද ඉදං මට අයිය කෑලි බෑ හරිද..."

" එහෙමයි... ස්වාමිණී...."

" එහෙනම් මං ඔයාව කොහොමහරි මගෙ මළිගාවට කැන්දගෙන ආව...ඔයා දන්නව ද නෙතූ.... මං ඔයාට කොච්චර කල්.... කොච්චර නම්... ආදරේ කළාද... කරනවද කියලා... ඔයාට හිතාගන්නවත් බෑ මගෙ රත්තරං... ඔය ඇස්වල කදුළු පිරුනම මගෙ පපුව පිච්චෙනවා වගේ... ඔයා කතා නොකලම... මට හුස්ම ගන්න බෑ වගේ.... ඔයාගෙ ඇස්... මට කවදාවත් නිදාගන්න දුන්නෙ නෑ... ඇස් වහගත්තත් ඔයාව පේන්නෙ...
මං පිස්සෙක් උනා මගෙ දෙයියො.... ඔයාගෙ ආදරේ නැතුව මට හුසම ගන්න බැරි උනා... අන්තිම ටික හැඩුම් අතරින් කිව්ව සිතුම්ගෙ කියවිල්ලට ම නෙතූගෙ ඇස්වල කදුළු පෙරනවා.

" අනේ.... මගෙ.... රත්තරං... ඔයා ඇයි මේ අද වගේ හොද දවසක කදුළු පුරවං... මම මගෙ පණටත් වඩා ඔයාට මගේ රත්තරං. මගේ මුලු ජීවිතේම ඔයා විතරයි. සිතුම්ව වැලදගෙන නෙතු කිව්වේ ඇඩූ කදුලින්...." මාව පිච්චෙනවා වගේ හැගීම් වලින් හිත පිරෙද්දී...ඒ සේරම ඉවසගෙන මන් හිටියේ මගේ රෝස මලට මැනිකක් වගේ කැන්දන් එන්න්....අද ඒ හීනේ හෙබෑවෙලා නෙතු...." එකම දේ නැවතත් කියන ගමන් සිතුම් කදුලු පිහදගත්තා.

" මේ ආත්මෙ අපි පෙරුම් පුරාගෙන එන්න ඇත්තේ අපේම වෙන්න වෙන්නැති සිතුම්... මේ ආත්මෙ විතරක් නෙමෙයි.... උපදින .....උපදින....හැම ආත්ම භවයෙම ඔයා මගේම.... වෙන්න ඕනී මගේ රත්තරං ...."සිතුම්ගෙ අත් දෙක අතින් අල්ලාගෙන පපුවට තුරුල් කර ගත්තු නෙතු නැමිලා සිතුම්ගේ දෙපතුල් ඉබලා " මගේ අතින් කවදාහරි වැරැද්දක් වුනා නම් දැන හරි නොදැන හරි මට සමා වෙන්න සිතුම් කියද්දී සිතුම් අත් දෙකෙන් ම ඇයව නැගිට්ටවාගත්තා.

" මගෙ ජීවිතේ සතුටුම දවස අද තමයි..." කියලා නෙතුව සැනසූ සිතුම් , " " ඔයා මගේ නපුරු නැනන්ඩිනේ ඉතිං.." කියලා අවුස්සන්න ගත්තා.

පොඩි උන් වගේ කුචි කවාගෙන නට නටා දගලන සිතුම්ගෙයි නෙතුගෙයි සිනා හඩින් එයාලගෙ ටජ් මහල රැව් දුන්නා..

පෙරුම් පුරාගෙන ආපු ආදරේ සීරුවෙන් සිත් තුල
පබදින්න ට පෙරුම් පුරූ සිතුම්ට....
ආදරේම ජීවිතේ කර ගත් නෙතූට...
ජීවිතයේ සතුටුම දවස උදා කරලා දීලා එයාලගේ
දෙමාපියෝ සතුටු කඳුලු වැගිරුවා.....

... ........... නිමි...............